# නාට්‍ය හා රංග කලාව

## ගුරු මාර්ගෝපදේශය

## 6 ශ්‍රේණිය

(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

සෞන්දර්ය දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : □□□.□□□.□□
විද්‍යුත් තැපැල : □□□□@□□□.□□

නාට්‍ය හා රංග කලාව

6 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2014

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය : මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හය වන සහ දහ වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීම

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය.

# විෂය හැඳින්වීම

අපේ මාතෘභූමියටත්, සංස්කෘතියටත්, සොබාදහම හා සමස්ත ජීව, අජීව විශ්ව ධාතුවටත් හිතකාමී පුරවැසියකු නිර්මාණය කිරීමේ පුළුල් ජාතික පරමාර්ථයෙන් පාසල් පද්ධතිය තුළ දරුවන්ට ඉගෙනීමට ලැබෙන සුවිශේෂතම විෂයය සෞන්දර්ය විෂයයයි. එය ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව ලෙස අප විසින් හඳුනා ගන්නා ලද පහත දැක්වෙන සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම කියැවීමෙන් ඔබට මැනවින් අවබෝධ වනු ඇත.

සෞන්දර්යයෙන් සංස්කෘතිකමය ළැදියා පුබුදුවා, එමඟින් නිර්මාණශීලී බව, සංවේදීතාව, දරා ගැනීම, ශ්‍රී ලාංකේය අනන්‍යතාව හා දේශානුරාගය වඩවා මාතෘ භූමිය කෙරෙහි සංවේදී වූ දරු කැලක් හා සමාජයක් බිහි කිරීම.

("To sensitize students and the community through Aesthetics to the Mother Land, endowed with cultural pride, creativity, Sensitivity, tolerance, partriotism and a sense of national identity")

දේශය ගොඩනැංවීමේ දී විශ්වය සමඟ යහ සබඳතා පවත්වා ගනිමින් පෙරට යන අනාගත පුරවැසියා කෙසේ විය යුතු ද යන්න ගැඹුරින් විමසා බැලීමත් සමඟ මෙතෙක් පැවති සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම අතික්‍රමණය කොට මෙම 2015 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය දෙස නවමු දෘෂ්ටියක් හෙළා ඇති බව එනයින්ම ඔබට පැහැදිලි වනු ඇත.

උසස් රසඥතා ඥානයකින් යුතු මානව හිතවාදී චින්තනයෙහි හෙබි ක්‍රියාශීලී සමාජානුයෝගී පුරවැසියකු ලෙස වැඩලෝකයට පිවිසීමට සෞන්දර්ය අධ්‍යාපනයෙන් ලබන ආධ්‍යාත්මික හා ශාරීරික ප්‍රබෝධය ඉවහල් කර ගැනීම අද්‍යතන සමාජ අවශ්‍යතාවකි.

සෞන්දර්ය අධ්‍යාපනයෙන් දරුවකු තුළ සොඳුරු මෙන් ම නිර්මාණශීලී හැකියාවන් හා චිත්තනය ප්‍රවර්ධනය කිරීම ද විනය ගරුක, සදාචාරවත් අභිමානවත් පුරවැසියකු තැනීමේ වගකීම ඉටු කිරීම ද දෙවැනි වන්නේ ආගමෙන් මිනිසාට සැලසෙන සේවාවට පමණි.

එබැවින් විද්‍යා, ගණිත, වාණිජ, තාක්ෂණ හා භාෂා විෂයයන්ගෙන් ඥානනය වන මිනිස් සත්ත්වයාට මිනිස් ගුණ උරුම කර දෙන සෞන්දර්ය අධ්‍යාපනික විෂයයන් ඉගෙනීම එදාටත් වඩා අදට සහ හෙටට අත්‍යවශ්‍ය ම බැව් තරයේ ම කිව යුතු ව ඇත.

මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණයත් සමඟ අභිනවයෙන් 6 ශ්‍රේණියට පැමිණෙන දරුවන් නවමු චින්තනයක් ඇති අළුත් පරපුරක් ලෙස තැනුම උදෙසා පළමු ක්‍රියාකාරකමින්ම ස්වයං පෙලඹවීමක් ඇති වන පරිදි කැමැත්ත හා විශ්වාසය ගුරුවරයා විසින් දිනා ගත යුතු ය. ඒ සඳහා ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන් අතින් විරචිත "ප්‍රාර්ථනාව" නම් වූ කුඩා ළමා ගීයක් දරුවාගේ ජීවන ප්‍රතිඥාවක් ලෙස දිනපතා පාඩම ඇරඹුමට පෙර ගැයුමට අප යෝජනා කරමු.

| | | | |
|---|---|---|---|
| ස ස ස - | ස ස ස - | රි රි රි - | රි රි රි - |
| හො ඳ දේ ꓢ | හි ත මී ꓢ | හි තු දේ ꓢ | කි ය මී ꓢ |
| ස රි ස රි | ස ස රි - | රි ස රි ස | ස ස ස - |
| කි යු දේ ꓢ | ක ර මී ꓢ | ක ර මි න් | හැ දෙ මී ꓢ |

මෙම ප්‍රවේශයත් සමඟ ඇරඹෙන සෞන්දර්යයේ වින්දනාත්මක ඉගෙනුම ජාතික, සංස්කෘතික අනන්‍යතා හා විවිධ සම්ප්‍රදායයන් ස්පර්ශ කරමින් විශ්ව චින්තනයක් කරා දරුවාගේ දැනුම, හැකියා හා ආකල්ප පුළුල් කර ගැනීමට හැකි වන පරිදි විෂය කරුණු අප අධ්‍යාපනික හා මනෝ විද්‍යාත්මක පදනමින් යුතු ව ක්‍රමිකව පෙළ ගස්වා ඇත.

එහි දී නායකත්වය, සහභාගිත්වය, ඉදිරිපත් වීම, සුහදත්වය, සාමූහිකත්වය, ඇගැයීම, සවන්දීම, පිළිගැනීම, බෙදාහදා ගැනීම, අන්‍යයන්ට ගරු කිරීම ආදී ආකල්ප සෑම සිසුවකු තුළ ම වර්ධනයට අවස්ථාව සැලසෙන පරිදි අප විසින් යෝජිත ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කරමින් ඉගෙනුම් ඉගැන්වීම් පරිසරය සකසා ගැනීමට ගුරුවරයා වශයෙන් ඔබට ද ඉඩකඩ ඇත.

තවද දෛනික ජීවිතයේ දී මුහුණ දෙන විවිධ ගැටලුවලට සාර්ථකව මුහුණ දී තර්කානුකූලව හා නිර්මාණාත්මකව චින්තනය මෙහෙයවා ඒවා විසඳා ගැනීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා වර්ධනය කිරීමට ද අප විසින් වත්මන් පරපුරට දායකත්වය සැපයිය යුතු ව ඇත.

එබැවින් ගුරු භවතුන් ලෙස ඔබ මෙම ගුරු මාර්ගෝපදේශය පෙරට වඩා හොඳින් පරිශීලනය කරන්නේ නම් ඔබගේ ද චින්තනයට අලුත් ආලෝකයක් හා ප්‍රබෝධයක් ලැබෙනු ඇත. ඒ ආලෝක කිරණ ජාතියේ දරු කැල මත පතිතව ඔවුන් ද ඉමහත් ප්‍රබෝධයෙන් මෙම විෂයය ඉගෙනීමට යොමු වනු නො අනුමානය.

එසේ ම කායික හා මානසික සමබරතාවෙන් හෙබි සෞඛ්‍ය සම්පන්න මෙන් ම නීරෝගී දිවිපෙවතක් ගත කිරීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා සංවර්ධනය කිරීම හා යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනංවා ගනිමින් ජාතික හා ජාත්‍යන්තර තලයේ නොසැලී කටයුතු කිරීමට විචාරශීලී මනසකින් හෙබි පුද්ගලයකු බිහි කිරීමට වගවීම සෞන්දර්ය අධ්‍යාපන විෂය භාර ව කටයුතු කරන ඔබ අප සැමගේ වගකීම වේ.

ඒ සඳහා 2015 වසරේ සිට 6 ශ්‍රේණියෙන් ඇරඹී ක්‍රියාත්මක වන මෙම නව ප්‍රතිසංස්කරණය දරුවන් හරහා අපි සැම නවමු ලොවකට පිවිසීමේ වැදගත් අවස්ථාවක් ලෙස දකිමින් උද්යෝගයෙන් හා කැපවීමෙන් වඩාත් ඵලදායි සේවාවක් සැලසීමට කැප වෙමු.

අධ්‍යක්ෂ (සෞන්දර්ය)
ජාතික අධ්‍යාපන ආයතනය

## විෂයමාලා කමිටුව

| | |
|---|---|
| උපදේශකත්වය හා අනුමැතිය : | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| සම්බන්ධීකරණය : | කේ. ජී. අජිත් රූපසේන මයා<br>ව්‍යාපෘති කණ්ඩායම් නායක (නාට්‍ය හා රංග කලාව)<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| විෂය නිර්දේශ විශේෂඥ උපදෙස් : | මහාචාර්ය වෝල්ටර් මාරසිංහ මහතා<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (විශ්‍රාමික)<br><br>මහාචාර්ය රෝලන්ඩ් අබේපාල මහතා<br>කොළඹ විශ්වවිද්‍යාලය<br><br>මහාචාර්ය මංගලිකා ජයතුංග මහත්මිය<br>කැලණිය විශ්වවිද්‍යාලය<br><br>විජයරත්න පතිරාජ මහතා<br>ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි (විශ්‍රාමික)<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| ලේඛක මණ්ඩලය අභ්‍යන්තර : | කේ. ජී. අජිත් රූපසේන මහතා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| බාහිර | වරුණ අලහකෝන් මහතා<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, සෞන්දර්ය අංශය<br>ඉසුරුපාය, බත්තරමුල්ල<br><br>ක්ලයිව් ශාන්ත මහතා<br>ගුරු සේවය, ශාන්ත ආනා විද්‍යාලය, කුරුණෑගල<br><br>සෙනෙවිරත්න රුදිගු මහතා<br>ගුරු උපදේශක - කොළඹ කලාපය<br><br>රණසිංහ අධිකාරි මහතා<br>ගුරු සේවය, මහින්ද විද්‍යාලය, ගාල්ල<br><br>අනෝමා කුමාරි සමරක්කොඩි මහත්මිය<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ<br>කලාප අධ්‍යාපන කාර්යාලය, ගිරිඋල්ල<br><br>ලලිතා ජයරත්න මහත්මිය<br>ගුරු උපදේශක - ඇඹිලිපිටිය කලාපය<br><br>ඩී. පී. ස්වර්ණලතා මහත්මිය<br>ගුරු උපදේශක - ඇල්පිටිය කලාපය<br><br>සමන් කස්තුරිරත්න මහත්මිය<br>ගුරු සේවය (විශ්‍රාමික)<br><br>ජී. කරුණාවතී මහත්මිය<br>අධ්‍යාපන පරිපාලන සේවය<br>ශාන්ත පාවුළු බාලිකා විද්‍යාලය, කොළඹ |

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

නාට්‍ය හා රංග කලාව විෂයය පාසල් මට්ටමින් 6 වැනි ශ්‍රේණියට ඇතුළත් කරනු ලැබුවේ 2007 වර්ෂයේ දී ය. 10 වැනි ශ්‍රේණිය වන විට වඩාත් පුළුල් අයුරින් නිපුණතා ගොඩ නැංවීම සඳහා එය බෙහෙවින් ඉවහල් වී ඇත. නාට්‍ය හා රංග කලාව ගුරු අත්පොත සැකසෙනුයේ එම නිපුණතා සංවර්ධන ක්‍රියාවලිය වඩාත් සාර්ථක කර ගැනීම සඳහා ගුරු භවතාට උපකාරකයක් වශයෙනි. එහි දී සිද්ධාන්ත, නිර්මාණ, කුසලතා, සංස්කෘතික පසුබිම, වින්දනය මෙන් ම ප්‍රායෝගික බව පාදක කොට ගෙන ක්‍රියාකාරකම් ගොඩ නංවා ඇත. විශේෂයෙන් ම මෙවර නව නිර්දේශය යටතේ තවදුරටත් මෙම විෂය ක්ෂේත්‍රය පුළුල් වන අතර, එහි දී ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා වැඩි අවධානය යොමු කොට තිබේ.

මෙම ක්‍රියාකාරකම් තුළින් දැනුම, ආකල්ප හා කුසලතා මෙන් ම, චර්යා සංවර්ධනය ද සිදු කෙරේ. මෙම ක්‍රියාවලිය වඩාත් සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය මානව සම්පත් හා භෞතික සම්පත් සම්පාදනය කර දීම අවශ්‍ය වේ. නාට්‍ය හා රංග කලාව විෂයය පිළිබඳ ව ලියැවුණු පොත් පරිශීලනය කිරීම සඳහා පුස්තකාල පහසුකම් සැලසීම, නිර්මාණ ඉදිරිපත් කිරීම සඳහා රංග පීඨ භාවිත කිරීම. ක්‍රියාකාරී පන්ති කාමරයක් සැලසුම් කිරීම. නාට්‍ය තරග සංවිධානය කිරීම, රංග කලාව සම්බන්ධ ප්‍රදර්ශන, විවාද ආදී විවිධාංග සංවිධානය කිරීම මෙන් ම ජාතික තලයේ නාට්‍ය නැරඹීම සඳහා සිසුන් යොමු කිරීම ද මගින් තවදුරටත් මෙම නිපුණතා සංවර්ධනය කළ හැකි ය. එසේ ම පැවරුම් මගින් විෂය කරුණු ගවේෂණය කිරීමේ අවස්ථා ද සිසුන්ට ලබා දිය හැකි ය.

එමෙන් ම ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් ඉගෙනුම් පල සාධනය සඳහා තක්සේරුකරණය (ඇගයීම් ක්‍රම) සෑම පාඩමක් සඳහා ම අන්තර්ගත කොට තිබේ. ඒ අනුව ශිෂ්‍ය ක්‍රියාකාරකම් ආශ්‍රයෙන් ඔවුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම පිළිබඳ විනිශ්චයකට එළඹිය හැකි ය. ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමත්, එය ප්‍රතිපෝෂණය කිරීමත් යන අංග දෙකකින් මෙම ඇගැයීම් ක්‍රියාවලිය සමන්විත වෙයි.

ගුරු මාර්ගෝපදේශයට පරිහරණය කිරීමේ දී මෙම මූලික රාමුව තුළ තමාට ලැබෙන සීමිත සම්පත් කළමනාකරණය කර ගනිමින් කටයුතු කිරීමේ නිදහස ගුරු භවතා සතු වේ. උදාහරණයක් ලෙස සිසුන් කණ්ඩායම් කිරීමේ දී පන්තියේ ශිෂ්‍ය සංඛ්‍යාව සැලකිල්ලට ගෙන සුදුසු පරිදි කණ්ඩායම් කිරීම කළ හැකි ය. එමෙන් ම වාර තුනට අදාළ ව කාලච්ඡේද සැලසුම් කර ගැනීමේ දී, ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් පහසු වන ආකාරයෙන් එය සකස් කර ගත හැකි ය. මෙහි ක්‍රියාකාරකම් සඳහා දී ඇති ගීත, කවි, කතාන්දර ආදිය වෙනුවට ගුරු භවතාට අභිමත පරිදි වෙනත් ගීත, කවි, කතාන්දර ආදිය යොදා ගැනීමට නිදහස තිබේ.

විශේෂයෙන් ම ගුරු මාර්ගෝපදේශයට සීමා නොවී ශ්‍රේණිවලට උචිත පරිදි නව නිර්මාණ සකස් කර ගැනීමට ගුරු භවතාට අවස්ථාව ඇත. මෙම සියලු කාර්යයන් මගින් දරුවාට වඩාත් ප්‍රියජනක පන්ති පරිසරයක් හා ඉගෙනුම් අවස්ථා ලබා දීම ගුරු භවතාගේ වගකීම වන්නේ ය.

# පටුන


| | |
|---|---|
| | පිටුව |
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | සසස |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | සඩ |
| හැඳින්වීම | ඩ -ඩස |
| විෂයමාලා කමිටුව | ඩසස |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | ඩසසස |
| විෂය නිර්දේශය | ०-०० |
| ඉගෙනුම් ඉගෙන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 01-72 |
| විවිධ සහාය | 73 |

# නාට්‍ය හා රංග කලාව

## විෂය නිර්දේශය

## 6 ශ්‍රේණිය

(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

# හැඳින්වීම

නාට්‍ය හා රංග කලාව යනු අතිශයින් නිර්මාණශීලී වූත්, ප්‍රායෝගික වූත්, වින්දනීය වූත්, විෂය ක්ෂේත්‍රයකි. පාසල් පද්ධතියේ වර්තමානයේ ක්‍රියාත්මක වන නිපුණතා පදනම් කරගත් අධ්‍යාපන ක්‍රමය හා අනුගත විෂය නිර්දේශයක් ලෙස නාට්‍ය හා රංගකලාව විෂය නිර්දේශය හැඳින්විය හැකි ය.

මුල් කාලයේ දී අ.පො.ස. උසස් පෙළ ශ්‍රේණි සඳහා පමණක් සීමා වී තිබුණු මෙම විෂයය, 1992 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නිර්දේශය අනුව පසුව 10, 11 ශ්‍රේණි දක්වා ද ව්‍යාප්ත විය. එය වඩාත් පුළුල් පරාසයක විකාශය වෙමින් 2007 වසරේ දී 6 වැනි ශ්‍රේණියෙන් ඇරඹෙන විෂය නිර්දේශය, නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය හා මැනවින් බද්ධ වී ඇත. මෙම විෂයය ප්‍රායෝගිකත්වයට නැඹුරු වූ, නිශ්චිත නිපුණතා ළඟා කරගත හැකි ක්‍රියාකාරකම් පාදක කොටගත් විෂයයක් වන බැවින්. සමාජ ගැටලු නාට්‍යමය දෘෂ්ටි කෝණයකින් හඳුනා ගෙන වින්දනාත්මක ව ග්‍රහණය කරගැනීමේ හැකියාව වර්ධණය කිරීම මෙමගින් අපේක්ෂිත ය.

නිර්මාණාත්මක හැකියාවන් හා ප්‍රායෝගික කුසලතාවන් වර්ධනය කිරීමත්, විචාරශීලී රසාස්වාදයට හුරු කිරීමත් අරමුණු කොට ගෙන ඇති මෙම විෂයය මගින් නාට්‍ය සිද්ධාන්ත, නිර්මාණාත්මක හැකියාව, ප්‍රායෝගික ක්‍රියාකාරකම්, දේශීය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම, හා වින්දනීය මානව හිතවාදියකු බිහිකිරීම යන පංචවිධ නිපුණතා සාධනය කර ගැනීම අපේක්ෂා කෙරේ.

ළමා මනසට ගෝචර වන විචිත්‍ර ලෝකය හා වීරක්‍රියා වැනි සංකල්ප ගොඩ නැගීමට නාට්‍ය හා රංගකලාව විෂයය යොදාගැනීම බෙහෙවින් සාර්ථක ය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ දී ප්‍රියජනක ඉගෙනුම් අත්දැකීම් සමීප කරමින්, නිර්මාණශීලී පරපුරක් ගොඩ නැගීම හා එමගින් සමස්ත පුද්ගල පෞරුෂය ගොඩ නැගීමේ කාර්යය සඳහා ද මෙම විෂයය ඉවහල් වේ. නව ලෝකයේ සංකීර්ණ වූත්, වේගවත් වූත්, වැඩ පරිසරයට අවශ්‍ය වන ශ්‍රමදායකයා ද, විචාරශීලී නිර්මාණකරුවා ද, වින්දනය හා ස්වාභිමානය/ආත්මාභිමානය පුරුදු පුහුණු කළ මානව හිතවාදියා ද ගොඩ නැගීමට අවශ්‍ය දේශීය අනන්‍යතාව හා සංස්කෘතික උරුමය, ප්‍රායෝගිකත්වය හා නිර්මාණශීලීත්වය ගැබ් වූ ක්‍රමවේදයක් නාට්‍ය හා රංගකලාව විෂයය තුළ අන්තර්ගත වේ.

සමාජ ජීවිතයේ මුහුණ දෙන ගැටලුවලට යථාර්ථවාදී හා ශුභවාදී විසඳුම් ලබා ගැනීමට අවශ්‍ය පෙර සූදානම මෙමගින් ලබාදෙන අතර, වින්දනීය මානව හිතවාදියකු මෙන් ම ශ්‍රී ලාංකේය අනන්‍යතාවකින් හෙබි අභිමානවත් පුරවැසියකු ගොඩනැගීමේ අභියෝගය නාට්‍ය හා රංගකලාව විෂය භාර ගුරුභවතුන් හමුවේ පවතින භාරදූර වගකීමක් බව අවසන් වශයෙන් සඳහන් කළ යුතු ය.

## ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම (උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003)

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත

(I) **සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය මත තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම



(II) **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(III) **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ස්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
- හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V) **ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) **''ඉගෙනීමට ඉගෙනුම'' පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබාදීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003)

# විෂය අරමුණු

පරිසරයේ ඇති සියලුම වස්තූන් ඇසුරෙන් වින්දනයක් ලබා ගැනීමේ ශක්තිය ඇති එකම සත්ත්වයා, මිනිසා ය. මිනිසා හා මිනිසා අතර ඇති වන විවිධ ගැටීම් නාට්‍යමය දෘෂ්ටි කෝණයකින් හඳුනාගෙන, ඒවා වින්දනාත්මක ව ග්‍රහණය කර ගැනීමේ හැකියාව ශිෂ්‍යයා තුළ වර්ධනය කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ.

**නිර්මාණාත්මක ශක්ති වර්ධනය**

නාට්‍යමය සංසිද්ධීන් වින්දනයේ දී මෙන් ම නිර්මාණයේ දී ද ප්‍රබල තේමාවලින් යුක්ත වේ. එදිනෙදා ජීවිතයේ ක්‍රියාකාරකම් හා මිනිස් ඇසුර මගින් ලබන අත්දැකීම් නිර්මාණාත්මක ව ප්‍රකාශ කිරීමට හැකි අනුභූතීන් ගොඩ නගා ගැනීමේ හැකියාව වර්ධනය කිරීම ද මෙහි තවත් අපේක්ෂාවකි.

**ප්‍රායෝගික කුසලතා වර්ධනය**

නාට්‍යානුසාරී අභ්‍යාස මගින් නිර්මාණය වූත්, එසේ ම එදිනෙදා ජීවිතයේ කාර්යයන් සඵල කර ගැනීමට සරිලන්නා වූත්, ස්වකීය චාලක හැකියාවන් පෝෂණය කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රායෝගික අවස්ථා මෙහි දී සැලසුම් කෙරේ.



**විචාර ශක්ති වර්ධනය**

සාහිත්‍යමය හා රංගමය වශයෙන් ද ජනසන්නිවේදන මාධ්‍යයන් ඔස්සේ ශ්‍රව්‍යමය හා දෘශ්‍යමය වශයෙන් ද ඉදිරිපත් කෙරෙන නාට්‍යමය සංසිද්ධීන්, විමර්ශනාත්මක ව තර්කානුකූල ව විචාරයට ලක් කිරීමේ හැකියාව වර්ධනය කිරීම ද මෙහි මූලික අපේක්ෂාවකි.

**විෂයානුබද්ධ දේශීය හා විදේශීය අනන්‍යතාවන් හඳුනා ගැනීම**

ඉගැනුම් කාර්යයේ දී මෙන් ම, ඵලදායී දෛනික ජීවිතයට වැදගත් වන ඒ ඒ විෂයානුබද්ධ දේශීය අනන්‍යතාව පිළිබිඹු කෙරෙන සංස්කෘතික උරුමයන් පිළිබඳවත්, එම දැනුම පෝෂණය කෙරෙන වෙනත් විදේශීය උරුමයන් පිළිබඳවත් නිවැරදි චින්තනයකින් යුත් චරිතායනයක් සිසුන් තුළ ජනිත කිරීම අවශ්‍ය කරුණකි. නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක විඳගැනීම මගින් සමාජයට අවශ්‍ය කරන මානව හිතවාදියකු ගොඩනැගීම ද මෙම විෂයයේ මුඛ්‍ය අරමුණක් වේ. නාට්‍ය හා රංග කලා විෂයානුබද්ධ දැනුම හා එමගින් මනා ආකල්ප ඇති කිරීම ද මෙම විෂය නිර්දේශයේ අපේක්ෂාව වන්නේ ය.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 01 නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි. | 1.1 ජනකතා පොත් ඇසුරෙන් ජනකතා ශබ්ද නගා කියවයි.<br>1.2 කියවන ලද කතාන්දර වාචිකව ඉදිරිපත් කරයි.<br>1.3 ස්වාභාවික පරිසරය ආශ්‍රිත සංසිද්ධීන් ඇසුරෙන් අනුකරණයට යොමු වෙයි.<br>1.4 මිනිස් හැසිරීම් අනුකරණය කරයි.<br>1.5 සත්ත්ව චර්යාවන් අනුකරණය කරයි.<br>1.6 "අභිනය" හඳුනා ගනියි.<br>1.7 නාට්‍යය යනු කුමක්දැයි හඳුනා ගනියි. | 1.1 සපයා ඇති ජන කතා ශබ්ද නගා කියවීම.<br>1.2 පංති කාමරය හා ඉන් බැහැර දී කියවා ඇති කතාන්දර ප්‍රකාශනාත්මකව ඉදිරිපත් කිරීම.<br>1.3.1 අනුකරණය යන්න හඳුනා ගැනීම.<br>1.3.2 පරිසරය ආශ්‍රිත වස්තු හා සිදුවීම් අනුකරණය කිරීම.<br>1.4 මිනිස් හැසිරීම් තුළ දකින බාහිර චලන, ඉරියව් හා හැඩතල අනුකරණය කිරීම.<br>1.5 චලන, ඉරියව් හා හැඩතල වැනි බාහිර සත්ත්ව චර්යාවන් අනුකරණය කිරීම.<br>1.6 අනුකරණ ක්‍රියාවලිය උදෙසා අභිනය භාවිත කිරීම.<br>1.7 නාට්‍යය පිළිබඳ ව අධ්‍යයනය කිරීම. | ♦ පාරම්පරික දායාදයක් වන ජනකතා එක්රැස් කරයි.<br>♦ ජනකතා අභිරුචියෙන් කියවීමත් අර්ථය උද්දීපනය වන ආකාරයෙන් ජනකතා ඉදිරිපත් කිරීමත් සිදු කරයි.<br>♦ අනුකරණය යනු කුමක්දැයි හඳුනාගනිමින් මානව හා සත්ත්ව චර්යාවන් අනුකරණය කරයි.<br>♦ නාට්‍ය නැරඹීමෙන් වින්දනයක් ලබයි.<br>♦ චරිත නිරූපණය සඳහා සතර අභිනය යොදාගත හැකි ආකාරය නිරීක්ෂණය කරයි. | 20 |
| 02. ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි. | 2.1 අත්දැකීම් පාදක කොට ගනිමින් පරිකල්පන ශක්තිය මෙහෙයවා නිර්මාණකරණයෙහි යෙදෙයි.<br>2.2 පරිසරය ආශ්‍රිත අවස්ථා හා සිද්ධි පාදක කොට ගෙන නිර්මාණාත්මක රංග ක්‍රියාවන්හි යෙදෙයි. | 2.1 නිර්මාණාත්මක රංග ක්‍රියාවල යෙදීම.<br>2.2 පරිසරය ආශ්‍රිත අවස්ථා හා සිද්ධි ආශ්‍රයෙන් නිර්මාණාත්මක රංග ක්‍රියා ගොඩනැගීම.<br>2.3 විවිධ චරිත ස්වභාවයන් ඉස්මතු වන පරිදි සාමූහිකව රූපණයේ යෙදීම. | ♦ පරිසරය ආශ්‍රිත අවස්ථා හා සිද්ධි ආශ්‍රයෙන් නිර්මාණාත්මක රංග ක්‍රියාවල යෙදෙයි.<br>♦ මානුෂ, අධිමානුෂ හා සත්ත්ව චර්යාවන් ද, විවිධ භාණ්ඩ හා දෛනික සිදුවීම් ද උපයෝගි කරගනිමින් ක්ෂණික නිරූපණවල යෙදෙයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.3 පරිසරය ආශ්‍රිත අත්දැකීම් ඇසුරෙන් සාමූහික ව, නිර්මාණාත්මක රංගනයන්හි යෙදීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.<br>2.4 සත්ත්ව චර්යාවන් අනුකරණය කරමින් ක්ෂණික නිරූපණයන්හි යෙදෙයි.<br>2.5 මානුෂ හා අධිමානුෂ චරිත උපයෝගී කරගෙන ක්ෂණික නිරූපණවල යෙදෙයි.<br>2.6 විවිධ භාණ්ඩ පාදක කොටගෙන ක්ෂණික නිරූපණයෙහි යෙදෙයි.<br>2.7 දෛනික සිදුවීම් ආශ්‍රිත ක්ෂණික නිරූපණයන්හි යෙදෙයි.<br>2.8 පරිකල්පනය පිබිදෙන ආකාරයේ විවිධ නිර්මාණ කාර්යයන්හි නිරත වෙයි.<br>2.9 පරිසරය ආශ්‍රිත අත්දැකීම් ඇසුරු කොට සාමූහිකව කතන්දර ගොතයි.<br>2.10 ජනකතා පරිශීලනයෙන් පරිකල්පනය මෙහෙයවා නව නිර්මාණකරණයෙහි යෙදෙයි. | 2.4 සත්ත්ව චර්යාවන් අනුකරණයෙන් ක්ෂණික නිරූපණයන්හි යෙදීම.<br>2.5 මානුෂ හා අධිමානුෂ චරිත උපයෝගී කරගෙන ක්ෂණික නිරූපණයන්හි යෙදීම.<br>උදා : සුරංගනාවෝ<br>රකුසෝ<br>2.6 විවිධ භාණ්ඩ උපයෝගී කර ගනිමින් ක්ෂණික නිරූපණයෙහි යෙදීම. (කේවල සහ සාමූහික)<br>2.7 දෛනික සිදුවීම් පාදක කොටගෙන ක්ෂණික නිරූපණවල යෙදීම.<br>2.8 පරිකල්පන අභ්‍යාසයන්හි යෙදීම.<br>2.9 සාමූහිකව කතාන්දර ගෙතීම.<br>2.10 ජන කතා ඇසුරු කරගත් නව නිර්මාණයෙහි යෙදීම.<br>2.11 සරල වෙස් මුහුණු නිර්මාණය කිරීම.<br>2.11.1 ස්වාභාවික අමුද්‍රව්‍ය ඇසුරෙන් නිර්මාණය කිරීම.<br>2.11.2 සරල නාට්‍යෝපකරණ නිර්මාණය කිරීම. (නිදසුන් : කඩු, උදලු, පළස්, පොරෝ, හෙලි, බඳුන්) | ♦ පරිකල්පන අභ්‍යාසවල යෙදෙයි.<br>♦ සරල වෙස්මුහුණු හා නාට්‍යෝපකරණ නිර්මාණය කරයි.<br>♦ ජනකතා හා නව නිර්මාණ ඇසුරින් සරල නාට්‍ය පෙළක් රචනා කොට එය රංගයක් බවට පත් කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.11 අපතේ යන ද්‍රව්‍ය හා ස්වාභාවික පරිසරය ආශ්‍රිත ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගෙන නිර්මාණය කරයි.<br>2.12 ජනකතාවක ඇති නාට්‍යෝචිත අවස්ථා තෝරා ගනියි.<br>2.13 නිර්මාණාත්මක හැකියා වර්ධනය කරයි. | 2.12 ජන කතා ඇසුරෙන් නාට්‍යෝචිත අවස්ථා හඳුනා ගැනීම.<br>2.13.1 ජනකතාවක් ඇසුරින් සරල නාට්‍ය පෙළ රචනා කිරීම.<br>2.13.2 එම පෙළ රංගනයක් බවට පත් කිරීම. | | |
| 03 නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැලෙයි. | 3.1 තෝරා ගත් නාට්‍ය පෙළක් පිළිබඳ අවබෝධයෙන් යුතුව සංවාදයෙහි යෙදෙයි.<br>3.2 මනස හා ශරීරය අතර සම්බන්ධතාව ගොඩනගා ගැනීම සඳහා සංචලන විධි භාවිත කරයි.<br>3.3 චරිතවලට ගැළපෙන පරිදි කටහඬ හසුරුවමින් ක්‍රියාකාරකම්වල යෙදේ.<br>3.4 හඬෙහි විවිධ පරාස මතුවන සේ සංවාද භාවිත කරයි.<br><br>3.5 විවිධ හැඟීම් හා අවස්ථාවලට උචිත පරිදි සංවාද හා ශබ්ද භාවිත කරයි. | 3.1 අවබෝධයෙන් යුතුව සංවාද භාවිත කිරීම.<br>3.2 අදහස් ප්‍රකාශ වන පරිදි සංචලන විධි භාවිත කිරීම. (සිතන හා කරන දේ අතර සම්බන්ධය)<br>3.3 සංවාද භාවිතය හා හඬ අනුකරණය කිරීම.<br>3.4 සංවාද භාවිතයේ දී විවිධ පරාසවලට අනුකූලව කටහඬ යොදා ගැනීම.<br>3.5 විවිධ හැඟීම් හා අවස්ථාවලට උචිත පරිදි අර්ථාන්විතව සංවාද හා ශබ්ද භාවිත කිරීම.<br>3.6 සාමූහික රංගනයට උචිත ජන ක්‍රීඩාවල යෙදීම. | ♦ අවබෝධයෙන් යුක්තව සංවාද හා සංචලන විධි භාවිත කරයි.<br>♦ විවිධ හඬ අනුකරණය කරයි.<br>♦ විවිධ පරාසවලට අනුකූලව කටහඬ භාවිත කරයි.<br>♦ අවස්ථාවෝචිතව හා අර්ථාන්විතව සංවාද හා ශබ්ද භාවිත කරයි.<br>♦ ජනක්‍රීඩා ආශ්‍රයෙන් සාමූහික රංගනයෙහි යෙදෙයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.6 ජන ක්‍රීඩා ඇසුරින් සාමූහික රංගනයේ යෙදේ. | | | |
| 04 නාට්‍ය හා රංග කලාව සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි. | 4.1 ජන සාහිත්‍යයේ එන සරල කතා සහ එහි පසුබිම පිළිබඳ ව අධ්‍යයනය කරයි.<br>4.2 ජනකතා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නිරත වෙයි.<br>4.3 ජන කතා, උපමා කතා ආදියෙහි එන සංස්කෘතික හා සාමාජික ලක්ෂණ විමසයි.<br>4.4 සංස්කෘතික හා සාමාජික වටිනාකමක් සහිත තේමා රැගත් නාට්‍යමය අවස්ථා නිර්මාණය කරයි. | 4.1 නාට්‍ය හා රංග කලාවට අදාළ ව ජන සාහිත්‍යයේ පසුබිම විමසීම. (විවිධ ජනවර්ගවලට හා ආගම්වලට අයත් ජන කතා, උපමා කතාවල සංස්කෘතික හා සාමාජික ලක්ෂණ විමසීම)<br>4.2 ජන සාහිත්‍යයෙහි ඇති කතාන්දර එක්රැස් කිරීම.<br>4.3 ජනකතා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නිරත වීම.<br>4.4 **සිරිත් මල්දම** ඇසුරින් නාට්‍යමය අවස්ථා නිර්මාණය කිරීම. | ♦ විවිධ ආගම්වලට හා ජනවර්ගවලට අයත්, ජනකතා, උපමා කතා ආදිය එක්රැස් කරයි.<br>♦ එම කතාවල ඇති සංස්කෘතික හා සාමාජික ලක්ෂණ විමසයි.<br>♦ ජනකතා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>♦ සිරිත් මල්දම ඇසුරින් නාට්‍යමය අවස්ථා නිර්මාණය කරයි. | 20 |
| 05. නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මකව විඳ ගැනීම හා මානවහිතවාදියෙකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 5.1 නාට්‍ය පෙළ රස විඳියි.<br>5.2 නාට්‍ය නිෂ්පාදනය රස විඳියි.<br>(පුංචි අපට දැන් තේරෙයි - සෝමලතා සුබසිංහ) | 5.1 නාට්‍ය පෙළ රස විඳීම (නිර්දිෂ්ට නාට්‍ය පෙළ) ඇසුරෙන්)<br>5.1.1 තේමාව<br>5.1.2 කතා වස්තුව<br>5.1.13 චරිත<br>5.2 නාට්‍ය නිෂ්පාදනය රස විඳීම.<br>5.2.1 රූපණය<br>5.2.2 ආනුශංගික ශිල්ප භාවිතය | ♦ නිර්දිෂ්ට නාට්‍ය පෙළ කියවයි.<br>♦ එහි තේමාව, කතා වස්තුව හා චරිත විමසයි.<br>♦ නාට්‍ය නැරඹීමෙහි කැමැත්ත දක්වයි.<br>♦ එහි රූපණය පිළිබඳ අදහස් දක්වයි.<br>♦ නාට්‍යයෙහි ආනුශංගික ශිල්ප භාවිත කොට ඇති අයුරු විමසයි. | 20 |

## 6 ශ්‍රේණිය

| 1 වාරය | | 2 වාරය | | 3 වාරය | | |
|---|---|---|---|---|---|---|
| නිපුණතා මට්ටම | කාලච්ඡේද | නිපුණතා මට්ටම | කාලච්ඡේද | නිපුණතා මට්ටම | කාලච්ඡේද | මුළු කාලච්ඡේද |
| 1.1<br>1.2<br>1.3 | 08 | 1.4<br>1.5<br>1.6 | 08 | 1.7 | 04 | 20 |
| 2.1<br>2.2<br>2.3<br>2.4 | 05 | 2.5<br>2.6<br>2.7<br>2.8<br>2.9<br>2.10 | 08 | 2.11<br>2.12<br>2.13.1<br>2.13.2 | 07 | 20 |
| 3.1<br>3.2 | 06 | 3.<br>3.4<br>3.5 | 10 | 3.6 | 04 | 20 |
| 4.1<br>4.2 | 08 | 4.3<br>4.4 | 07 | 5.1.1<br>5.1.2<br>5.1.3<br>5.2.1<br>5.2.2 | 15 | 30 |
| | 27 | | 33 | | 30 | 90 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**නිපුණතාව 01** නාට්‍ය හා රංගකලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.1 -** ජනකතා පොත් ඇසුරින් ජනකතා ශබ්ද නගා කියවයි.

**ක්‍රියාකාරකම** ''ජනකතා ශබ්ද නගා කියවමු''.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

- ★ රුචියෙන් කියවයි.
- ★ පාරම්පරික සංස්කෘතික දායාදයක් වන ජනකතා එක්රැස් කරයි.
- ★ ජනකතාවල සඳහන් යහපත් ගුණාංග ජීවිතයට ආදර්ශයක් කරගත හැකි බව පවසයි.

**ගුණාත්මක යෙදවුම්** සපයා ඇති ජනකතාවල (අතිරේක උදව්) පිටපත්.
වෙනත් ජන කතා.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - සිසුන් උචිත පරිදි කණ්ඩායම් කොට සකස් කරගන්නා ලද එක් ජනකතාවක පිටපත් එම කණ්ඩායම්වලට ලබා දෙන්න.

පියවර 02 - කණ්ඩායමේ සියලු දෙනාට ම ඉදිරිපත් විය හැකි ආකාරයට එම කතාන්දරය කොටස් වශයෙන් ශබ්ද නගා කියැවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

පියවර 03 - පිටපතේ අන්තර්ගත සංවාද, වචන, විරාම ආදී අංග මැනවින් ග්‍රහණය කර ගැනීමටත්, අර්ථය උද්දීපනය වන ආකාරයෙන් බස හැසිරවීමටත්, අවශ්‍ය හුරුව ලබාදෙමින් කියැවීමට යොමු කිරීම හා ඒ ආශ්‍රිත ව ප්‍රශ්න අසන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. ජනකතා අභිරුචියෙන් කියැවීමට හැකියාව ලැබීම.
02. අර්ථය උද්දීපනය වන සේ නිවැරදි ව වචන උච්චාරණය කිරීමේ හැකියාව ලැබීම.
03. ජනකතාවෙන් උකහාගත හැකි ගුණාංග හඳුනාගැනීමේ හැකියාව ලැබීම.
04. උචිත ශෛලියකින් කතාව කියවීමේ හැකියාව ලැබීම.
05. විරාම තැබීම, හඬ පාලනය වැනි කරුණු පිළිබඳ අවබෝධය ලැබීම.
මෙම කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** වැඩිහිටියන් ගෙන් අසා දැනගත් ජනකතා 05ක් ඇතුළත් කොට පොත් පිංචක් සකස් කරන්න.
(උක්ත ක්‍රියාකාරකම සඳහා අදාළ උපදෙස් දෙන්න. පැවරුම සම්පූර්ණ කිරීමට සතියක පමණ කාලයක් සෑහේ.)

**අතිරේක උදව්**

- ★ විවිධ ජනකතා ඇතුළත් පොත්.
- ★ වැඩිහිටි සම්පත් දායකයන්.

## අතිරේක උදව්

### 01. බුදුන් වඳින ලෙස වැඳපන් අම්මාට

එක්තරා ගමක අම්මා කෙනෙකුයි, පුතාලා දෙන්නෙකුයි හිටියා. මේ අම්මා ඉතා දුක සේ පුතුන් දෙදෙනා දඩි කළා. නියම වයස එන කොට පුතාලා දෙන්නට ලේලිලා දෙන්නෙකුත් ගෙනැත් දුන්නා.

එයින් බාල පුතා හුඟක් පොහොසත්. එයාගෙ බිරිඳ හරි ම නපුරු යි. බිරිඳට බය පක්ෂපාත කම් ඇති බාල පුතා අම්මට සැලකුවේ නැහැ. ඉතින් දවසක් මේ දුප්පත් අසරණ අම්මා බාල පුතාගෙ ගෙදරට ගියා කෑමට යමක් ඉල්ලාගන්න. මේ වෙලාවෙ පුතයි ලේලියි දෙන්නම ගෙදර හිටියා. අම්මා කෑමට යමක් ඉල්ලුවාම ලේලි වී නැලි දෙකක් මැනලා මල්ලකට දාලා අම්මට දුන්නා. මේක දැකපු අම්මට හුඟාක් දුක හිතුණා. අම්මට ඉබේට ම මෙන්න මෙහෙම කියැවුණා.

> ''බඩගිනි වෙලා මා ගිය කල පුතුගෙ ගෙට
> මැනලා වී දෙකක් දුන්නයි මල්ල කට
> ගම්දෝ නොගම්දෝ කියලා හිතුණි මට
> මැනල ද පුතේ කිරි දුන්නේ මා නුඹට''

මේක ඇහුනම ලේලිට හොඳට ම තරහ ගියා. එයා හරි ම කටකාර ගැහැනියක්. ඇය තමන්ගෙ සැමියගේ අම්මට මෙන්න මේ ආකාරයට බැණ වැදුණා.

> ''දුකක් නැති ව මා ඇති කළ අම්මාට
> මිටක් වත් දුන්නෙ නැත වී ඉල්ලු විට
> දෙකක් වී මැනල දීලත් මල්ල කට
> මොකක් කියනව ද මැහැලියෙ පල දොරට''

ඉතිං මේ කතාව අහපු බාල පුතා තමන්ගෙ බිරිඳ ගේ පැත්ත අරගෙන අම්මට දොස් කියන්න පටන් ගත්තා. එයා තමන්ගෙ බිරිඳගෙ කෝපය නිවන්න මේ විදියට කිව්වා.

> ''මැනලත් නැලි දෙකක් දුනි වී අම්මාට
> වෙනදත් ඔහොම දෙනවා අවුරුද්දකට
> කවදත් ඔහොම ම යි උන්දැගෙ සට කපට
> උඹ සිත් කෝප නොම ගෙන පලයන්කො ගෙට''

මේ වෙලාවෙ හදිසි කටයුත්තකට යන ගමන් ලොකු පුතා, ඒ කියන්නෙ බාල පුතාගෙ අයියා මේ ගෙදරට ගොඩ වුණා. එයා පැත්තකට වෙලා මේ සංසිද්ධිය බලාගෙන හිටියා. එයාට අම්මා ගැන හුඟක් දුක හිතුණා. අම්මගෙ ඇස් දෙකින් කඳුළු කඩා හැළෙනවා. මේක දරා ගන්නට බැරි වුණු ලොකු පුතා තමන්ගෙ මල්ලිට මේ විදියට අවවාද කළා.

> ''මල්ලියෙ ඔහොම නොකරන් අපෙ අම්මාට
> දෙතනේ කිරි දුන්නෙත් අපි දෙන්නාට
> තියෙන දෙයක් දෙන්නෙත් අපි දෙන්නාට
> බුදුන් වඳින ලෙස වැඳපන් අම්මාට''

## 02. අනුන්ට කැපූ වළේ තමන් වැටීම

ඔන්න රජකාලෙ එක්තරා ගමක ජෝඩුවක් ජීවත් වුණා. ගමයා ගේ නම කාලයා. කාලයා කවදා වත් කිසි ම රස්සාවක්, ගොවිතැනක් බතක්, හේනක් කඩමක් කරන්නෙ ම නෑ. හරි ම අලසයා. ඉතිං මේ ගම ගෙදර මේ දෙන්න අතර හැමදා ම ඇනුම්, බැණුම්, අඬදබර. ගම මහගෙට ඉවසුම් නැති හරි ම හිසරදයක් කං කරච්චලයක් උණා.

කිසි ම වැඩක් පළක් නොකර අලසකමින් ම කාලය කාදමන ''කාලයා'' රාජ උදහසට ලක් කරලා මරවන්න ගම මහගේ උපායක් යෙදුවා. මොකක් ද දන්නව ද ඒ උපාය?

''රජ්ජුරුවන් ගෙන් පණිවුඩයක් ලැබුණා'' යැ යි බොරුවක් ගොතා කියලා පසු දා අලුයම් කාලය රජ මාලිගයට පිටත් කර යැව්වා.

රාජ මාලිගය අසල දී මේ අතර තුරේ දී ම, කරණවැමියා දැලිපිහිය කරගල ගගා අසල රැඳී උන්නා. ''කාලයා''ත් මේ දිහාව බලා ගෙන උන්නා. ''කාලයා'' පසෙක තිබුණු අඟුරු කැබැල්ලක් අතට අරං,

''කරගල ගගා එනවා මම නොදනිම් ද?'' යන ආකාරයේ පදයක් බිත්තියේ ලිව්වා. අලුයම අවදි වූ රජතුමා මාලිගයෙන් එළියට එනකොට ම බිත්තියේ ලියා තිබූ කවි පදය දුටුවා. එය හඬ නගා කියමින් රජතුමා මිදුලට බැස්සා.

ඉතිං එක පාරට ම මොකක් ද දන්නව ද වුණේ? කරණවැමියා මහත් කලබලයකට පත් වුණා. වෙවුලන්න පටන් ගත්තා. ගැහෙන්න පටන් ගත්තා. කතා කර ගන්න බැරි වුණා. කරගල අතහැරුණා. ඊට පස්සෙ රජ්ජුරුවන්ගෙ පාමුල වැටී දෙපා අල්ලා වැඳ වැටුණා.

''අනේ මට සමාවෙන්න දේවයන් වහන්ස.
මා අත වරදක් නෑ.... මා අත වරදක් නෑ.....
මම නිර්දෝෂියි.
මට ජීවිත දානය දෙන්න.
ඔබ වහන්සේ ගේ මලණුවන් ගේ කීමටයි මං මේ අළුයම් වේලේ මාලිගයට ආවේ.
ඔබ වහන්සේ ගේ ගෙළ කපා මරන්න මට උවමනාවක් නෑ.
ඔබ වහන්සේ ගේ මලණුවන්ගේ කීමටයි මම මේ ආවේ.
ඔබ වහන්සේ ගේ ගෙළ කපලා මරන්න කීවේ ඔබ වහන්සේ ගේ මලණුවන් ම යි.''

කරණවැමියා මෙහෙම කියාගෙන කියාගෙන ගියා.

තමන් ගේ මලණුවන් උපායෙන් තමන් මරවලා රාජ්‍යය අල්ලා ගැනීමට යොදා ඇති මේ ක්‍රෑර උපාය තේරුම් ගැනීමට උදව් වූ කාලයාට රජතුමා තෑගි බෝග එක්ක ගම්වරයකුත් ලබා දුන්නා.

කාලයා තෑගිබෝගත් අරගෙන බොහොම සන්තෝසෙන් ගෙදර ආවා. තමන්ට අත් වූ ඉරණම ගම මහගේට හොඳට විස්තර කරලා කිව්වා. ඉතින් 'කාලයා' මෙන් ම ගම මහගේ ද ඉතා ම සතුටට පත් වුණා. එදා ඉඳලා මේ ගම ගෙදර කිරියෙන් පැණියෙන් ඉතිරුණා. දෙන්නා සමගි සමාදානයෙන් සතුටින් ජීවත් වුණා. තමාට ලැබුණු ගම්වරයේ වැඩ කටයුතුවල යෙදුණ ''කාලයා'' ගේ කම්මැලිකමත් නැති වෙලා ගියා.

තමන් මැරුමට උපාය යෙදූ මලණුවන් අල්ලා හිස ගසාදැමීමට රජතුමා වධකයින්ට අණ කෙරුවා.

*(උපුටා ගැනීම - ජනකවි ආශ්‍රිත ජනකතා - නෝමන් සිරිපාල)*

03. හීල්බත් දංකුඩ

එක ගමරාළ කෙනකුට හීල්බත් දංකුඩවලට පුදුම කෑදරකමක් තිබුණා. උදේ නැගිට්ට පැදුරෙන් කුස්සියේ වළංදරට රිංගන්නේ දංකුඩ ටිකක් සූරගෙන කන්න බලාගෙනයි.

ගමයගෙ කරුමෙට වගේ ගම මහගෙත් දංකුඩවලට ඊටත් වැඩිය ආසයි. ඉතින් මේ ගෙදර හැමදාම උදේට දංකුඩවලට හබේ. දවස පටන් ගන්නෙ ම රංඩුවෙන්.

මෙහෙම ඉන්න කොට එක දවසක් රටේ රජ්ජුරුවන්ගේ අණ බෙර කාරයකු මේ ගමට ආවා. මහගෙ අණ බෙර කාරයා කියන දේ හොඳට අහගෙන හිටියා.

ඒ රටේ රජ්ජුරුවන්ගෙ එක ම දූ කුමරියගෙ නාහෙ මල් ඇටයක් හිර වෙලා. මොන විදියකින් වත් එළියට ගන්න බැරුව දූන් දූන් නාහෙත් වණ වෙලා. කුමාරිගෙ නාහෙන් මල් ඇටේ අරගෙන දාපු කෙනෙකුට ඇතෙක් බරට වස්තුව දෙනවා. හැබැයි බැරි වුණොත් ඉස ගසා දානවා.

''අපේ ගමරාළට ඕක කරන්න පුළුවන්'' කියලා මහගෙ අණ බෙරේ නැවැත්තුවේ හීල්බත් දංකුඩ තනියම කන්නට හිතාගෙනයි.

රජ අණ හින්දා කරන්න දෙයක් නෑ. ගමයා මර බියෙන් රජ වාසලට යන්න පිටත් වුණා. අතරමග දී ''චූස්'' ගාලා ඇටිකිත්තෙක් පැගුණා. ඒක අසුබ නිමිත්තක් කියල හිතාගෙන යනකොට ''චරස්'' ගාලා කකුළුවෙක් පැගුණා. ඒක තවත් බාධාවක් කියල හොඳට ම හිත නරක් වෙලා තව ටික දුරක් යනකොට හාවෙක් පාර ඉස්සරහ එහා මෙහා හැරිල ආයෙත් කැලේට ම දිව්වා. දූන්නම් මැරෙන එක සිකුරු යි කියල සහසුද්දෙට ම දන්නවා.

රජවාසල දී රජ්ජුරුවන්ට තියෙන බය හින්දම ''මට මල් ඇටේ අරගෙන දාන්න පුළුවන්. ඒත් ඒකට පොඩි බලියක් අරින්න ඕන.'' කිව්වා.

කළමනා ලෑස්ති කරලා දීලා රජ්ජුරුවොයි, බිසවයි, කුමාරිකාවයි අනික් අය එක්ක බලි බලන්න වාඩි වුණා.

ගමරාළ උඩැක්කිය ගහන ගමන් වෙන බලි යාග දන්නෙ නැති හින්ද කවියක් වගේ මෙහෙම කිව්වා.

''ඇටිකිති චුස්
කකුළු චරස්
හාවා කළ එකෙල මෙකෙල
මේ මරණින් බේරුණොතින්
තවත් නොකම් හීල් බත් දංකුඩ''

මේක ඇහුණ ගමන් රාජකුමාරි ඉවසිල්ලක් නැතුව කට වහ ගෙන හිනාවෙන්න පටන් ගත්තා. ඒ එක්ක ම නාහෙ හිරවෙලා තිබුණ මල් ඇටෙත් එළියට විසි වුණා.

*(උපුටා ගැනීම - ශ්‍රී ලංකාවේ ජනකතා එකතුව - එස්. විජේසූරිය)*

**04. නාඩි බැලීම**

විජේසිංහ වෙද පරම්පරාව නාඩි සාස්තරේ ගැන දැනුත් බොහොම ප්‍රසිද්ධයි. ඉස්සර කාලෙ ඒ පරම්පරාවෙ උදවිය මහනුවර රජ පවුලටත් වෙදකං කරල තියෙනව.

දවසක් ඒ වෙද මුත්තෙකුට රජ මාලිගාවෙන් පණිවිඩයක් ලැබිල තියනවා. වෙද මුත්තා බෙහෙත් හෙප්පුවත් අරගෙන පුළුවන් තරම් ඉක්මනට රජ මාලිගාවට ගියා.

ආතුරයා මහ බිසවුන් වහන්සෙ. ඒත් වෙදෙකුට වත් බිසවගෙ අත අල්ලන්න තහනම්. ඒවා රාජකීය සරීරනේ.

තිරේකින් මෙහාට නූලක් ආවා. වෙද මුත්තා නූල අල්ලාගත්තා. රජ්ජුරුවො සිංහාසනේට වෙලා බලා ගෙන ඉන්නවා.

ටික වේලාවකින් වෙද මුත්තාගෙ ඉහිං කනිං දාඩිය මතු වුණා. නූලත් එක්කම අත් දෙක වෙවුලන්න පටන් ගත්තා.

රජ්ජුරුවො ඒක දැකලා හේතුව ඇහුවා. කියන්නත් බෑ. නොකියත් බෑ. කොහොමත් දං ගෙඩියට බෙල්ල දෙන්න වෙන එක සිකුරුයි.

ඒත් සාස්තරේට තියෙන ආදරේටයි, ආත්ම ගව්රවෙයි හින්ද අන්තිමට ගොත ගහලා කිව්වා, ''දේවයන් වහන්ස, ගැත්තාට අනුකම්පා කරන සේක්වා. මේක නම් කකුල් හතරේ සතෙකුගෙ නාඩියක් මිසක් මනුස්ස සරීරෙක නාඩියක් වෙන්න බෑ....'' කියලා.

රජ්ජුරුවන්ගෙ අත කඩු මිටට ගියා. දොරටුපාලයා සීරුවෙන් හිටියා. රජ්ජුරුවො සිංහාසනෙන් බැස්සා. කවුරුත් හිතුවා වැඩේ එතැනින් ම කම්මුතුයි කියලා. නින්දා කළේ මහ බිසවුන්නාසේට නේ.

ඒත් රජ්ජුරුවො ගමන් කළේ තිරය පැත්තටයි. හිමින් සීරුවෙ තිරය ටිකක් ඈත් කරලා බැලුවා. බක බක ගාලා හිනා වෙලා රජ්ජුරුවො ආයෙත් සිංහාසනෙන් වාඩි වුණා.

ඔක්කොම ගල් ගැහිලා බලං හිටියා. වෙද මුත්තා හීනෙන් වගේ රජ්ජුරුවො දිහා බැලුවා. රජ්ජුරුවො ඒ වෙලාවෙ ම වෙද මුත්තට නම්බු නාමයක් පට බැඳලා ගම්වරයකුත් දුන්නා.

නූලෙ අනික් කෙළවර බැඳලා තිබුණෙ මහබිසව හුරතල් කර කර හිටිය පූස් පැටියගේ කකුලෙ බව ආරංචි වුණේ ඊට ටික කලකට පස්සෙයි.

*(උපුටා ගැනීම - ශ්‍රී ලංකාවේ ජනකතා එකතුව - එස්. විජේසූරිය)*

(මෙම ජනකතා හෝ මෙවැනි වෙනත් ජනකතා හෝ අවශ්‍ය පරිදි සකස් කර ගෙන ක්‍රියාකාරකම සඳහා යොදා ගන්න.)

**නිපුණතාව 01** නාට්‍ය හා රංගකලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.2** කියවන ලද ජනකතා වාචික ව ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම** ''කතන්දර කියමු''.

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

**ඉගැනුම් පල**

- ★ අසන්නාට පැහැදිලි ව තේරුම් ගත හැකි ආකාරයෙන් කතන්දර ඉදිරිපත් කරයි.
- ★ අර්ථය උද්දීපනය වන ආකාරයෙන් වචන උච්චාරණය කරයි.
- ★ කතා කලාවට උචිත අයුරින් බස හසුරුවයි.
- ★ සිද්ධීන් රසවත් ව ප්‍රකාශ කරයි.
- ★ කතාන්දර ඇසීමට ප්‍රිය කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- ★ තෝරාගත් ජනකතා කීපයකට අදාළ ව එක් එක් ජනකතාවේ අවස්ථා දැක්වෙන චිත්‍ර කට්ටල.
- ★ සිසුන් විසින් එකතු කරන ලද ජනකතා පිටපත්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - තෝරාගත් ජනකතාවකට අදාළ චිත්‍ර අනුපිළිවෙලට කළුලෑල්ලේ රඳවා ඒ ආශ්‍රයෙන් කතාන්දරය ගොඩ නැගීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

පියවර 02 - සිසුන් උචිත පරිදි කණ්ඩායම් කොට, සකස් කර ගෙන ආ චිත්‍ර කට්ටල ඔවුන් වෙත ලබා දී කතාන්දරය ගොඩ නගා, මුල, මැද, අග සහිත ව අනුපිළිවෙළට කතාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. සිසුන් විසින් එකතු කරන ලද ජනකතාවලින් තෝරාගත් කතා පන්තිය හමුවේ ඉදිරිපත් කරවන්න.

පියවර 03 - එම ජනකතා ආශ්‍රයෙන් ජනකතාවල ඇති විවිධ ප්‍රභේද, භාෂා විලාසය, චරිත ස්වභාවය, හැඟීම්, රසය, උච්චාරණ විලාසය, සමාජ ස්වරූපය, සාරධර්ම හා උපදේශන ආදිය පිළිබඳ ව පැහැදිලි කර ගැනීමට අවශ්‍ය මග පෙන්වන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. අසන්නාට පැහැදිලි වන ආකාරයෙන් කතාන්දරය ඉදිරිපත් කිරීම.
02. ජනකතාව නිවැරදි ව ගැලපීම.
03. ප්‍රකාශනාත්මක ව, රසවත් ව හා අර්ථෝද්දීපනය සිදු වන ආකාරයෙන් ඉදිරිපත් කිරීම.
04. උචිත බස්වහරක් හා උච්චාරණ විලාසයක් භාවිත කිරීම.
05. සබකෝලයෙන් තොර ව, ඉදිරිපත් කිරීමේ හා මුළු පන්තියේ ම අවධානය ලබා ගැනීම.

මෙම කරුණු ඇගැයීමට ලක් කරන්න.

පැවරුම තමා විසින් ඉදිරිපත් කරන ලද කතාන්දරය චිත්‍ර සටහන් සහිත ව ලියා දක්වන්න.

**අතිරේක උදව්**

- ★ සිසුන් විසින් එක්රැස් කරන ලද ජනකතා.
- ★ ඉගැනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොදාගත හැකි ජනකතා.

**නිපුණතාව 01** නාට්‍ය හා රංගකලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.3** ස්වාභාවික පරිසරය ආශ්‍රිත සංසිද්ධීන් ඇසුරෙන් අනුකරණයට යොමු වෙයි.

**ක්‍රියාකාරකම** ''පරිසරය දකිමු - රඟමු - විඳිමු''.

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

**ඉගැනුම් පල**

- ★ වින්දනය හා විනෝදය සඳහා අනුකරණය භාවිත කරයි.
- ★ වස්තු හා සිද්ධි පදනම් කොට පරිසරයේ විවිධත්වය ප්‍රකාශ කරයි.
- ★ පරිසරයට ආදරය කරන බව විස්තර කරයි.
- ★ නිරීක්ෂණ ක්‍රියාවලියක යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්** ස්වාභාවික පරිසරයේ දර්ශන, ද්‍රව්‍ය සඳහන් පත්‍රිකා හා පින්තූර.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - සිසුන් පන්ති කාමරයෙන් පිටත නිදහස් ස්ථානයකට කැඳවාගෙන ගොස් පරිසරයේ ස්වාභාවික වස්තුන් හඳුනාගැනීමට අවස්ථාව සැලසීම සහ ඒවා විඳීමට ඉඩ සලසා දෙන්න.

පියවර 02 - තමා දුටු සහ රස විඳි ප්‍රස්තුතය අනුකරණය කළ හැකි ආකාරය පිළිබඳ ව අදහස් හුවමාරු කර ගනිමින් පරිසරයේ විවිධ චලන, රිද්ම රටා, ද්‍රව්‍ය හා ක්‍රියාවලීන් නිර්මාණාත්මක ව අනුකරණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර 03 - පරිසරය අප ගේ ජීවිතයේ ම කොටසක් බවත්, එහි ඇති ජීවී - අජීවී සියල්ල කෙරෙහි අප ළෙන්ගතු විය යුතු බවත්, ස්වාභාවික වස්තු ඇසුරු කොටගෙන නිර්මාණාත්මක අනුකරණ මෙන් ම වෙනත් කලා නිර්මාණයන් ද බිහි කළ හැකි බවත්, පරිසරය විසින් අප රසාස්වාදයට යොමු කරන බවත් අවධාරණය වන ආකාරයෙන් සිසුන් හා සාකච්ඡා කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. පරිසරයේ වස්තු හඳුනාගැනීම හා නම් කිරීමේ හැකියාව ලැබීම.
02. එම වස්තුන් ගේ ස්වරූපය, ස්වභාවය හා රිද්මය හඳුනා ගැනීමේ හැකියාව ලැබීම.
03. පරිසරයේ වස්තුන් හා සිද්ධීන් අනුකරණය කිරීමේ හැකියාව ලැබීම.
04. පරිසරය ආශ්‍රිත ව කවි, ගී, චිත්‍ර හා වෙනත් නිර්මාණ බිහි කිරීමේ හැකියාව ලැබීම.
05. පරිසරය සුරැකීමට හා පරිසරයට ආදරය කිරීමේ හැකියාව ලැබීම.

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** තමා විසින් නිරීක්ෂණය කරන ලද පරිසර වස්තුන් පිළිබඳ ව කවි පන්තියක්, ගීතයක්, රචනාවක් හෝ චිත්‍රයක් නිර්මාණය කරන්න.

**අතිරේක උදව්** 1. හිමිදිරි උදෑසන - උදෑසන සිදු වන සාමාන්‍ය සිදුවීම්. (එනම් හිරු නැගීම, මල් පිපීම, කුරුලු නාදය, කුරුල්ලන් කෑම සොයා යාම, කුඩා ළමුන් පාසල් යාම, වැඩිහිටියන් ගේ උදෑසන කටයුතු ආදිය) අනුකරණය කරන්න.

2. වැස්ස - වැස්ස වසින අවස්ථාවල දී සිදු වන සාමාන්‍ය සිදුවීම්. (අකුණු ගැසීම, ගස් සෙලවීම, වැහි බිඳු විවිධ රටාවන්ට මිහිමත පතිත වීම ආදිය) අනුකරණය කරන්න.

3. ඇළ, දොළ, ගංගා - දිය දහරක් ගලා යන රිද්මය හා එහි විවිධ අවස්ථා (කුඩා දිය පහරක්, ගල් කුළු අතරින් බාධක ජය ගෙන ඉදිරියට ගලා යාම, තැනිතලාවේ හෙමි හෙමින් ගලායාම ආදිය) අනුකරණය කිරීම.

4. මුහුද / වැව - මුහුදක / වැවක දක්නට ලැබෙන සුන්දරත්වය (රළ පෙළ වෙරළට පැමිණීම, නැවත ගලායාම, සුළඟට හසු වූ දිය රැළි නගන ආකාරය, මුහුද / වැව ආශ්‍රිත ව ඇති දෑ සහ සිදුවීම් ආදිය) අනුකරණය කරන්න.

**නිපුණතාව 01** නාට්‍ය හා රංගකලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.4** මිනිස් හැසිරීම් තුළ දකින බාහිර චලන, ඉරියව් හා හැඩතල අනුකරණය කිරීම.

**ක්‍රියාකාරකම** මිනිසුන් අනුකරණය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

- ★ මිනිස් චර්යාවන්හි වෙනස්කම් නිරීක්ෂණය කරයි.
- ★ රංග ක්‍රියාවලිය සඳහා අවශ්‍ය චරිතාංග හඳුනාගනියි.
- ★ මිනිස් චර්යාවන් සසඳමින් සමාජය හඳුනා ගැනීමට අවශ්‍ය අත්දැකීම් ලබාගනියි.
- ★ යහපත් මානව චර්යාවන් හඳුනාගනියි.

**ගුණාත්මක යෙදවුම්** 1 - 5 දක්වා අංක ලියන ලද කාඩ්පත් 5 ක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - පන්තියේ සියලු ම සිසුන් රවුමට සිටුවා 1 - 5 දක්වා අංක සඳහන් කාඩ්පත් ඔවුන් වෙත යොමු කොට ඉන් එක් අංකයක් තෝරා ගැනීමට සිසුන්ට ඉඩ සලසන්න.

ඒ අනුව,
01. මාළු වෙළෙන්දා
02. හමුදා සෙබළා
03. මන්ත්‍රී ආරක්ෂකයා
04. බස් කොන්දොස්තර
05. වෛද්‍යවරයා

යන චරිතවලින් එකක් තෝරාගැනීමට අවස්ථාව ලබාදීම හා එම චරිත පිළිබඳ ව සාකච්ඡා කරන්න.

පියවර 02 - එම චරිතවල ස්වභාවය, ඔවුන් හා සම්බන්ධ උපකරණ, භාෂාව හා කටහඬ, හැසිරීම් රටාව ආදිය පිළිබඳ ව අධ්‍යයනය කිරීමට නියමිත කාල සීමාවක් ලබා දී එම චරිත අනුකරණය කිරීමට අවස්ථාව සලසා දෙන්න.

පියවර 03 - සමාජයේ එදිනෙදා හමුවන පුද්ගලයන් අතුරින් ශිෂ්‍යයා විසින් තෝරා ගනු ලබන එක් අයකුගේ චර්යා රටාව අනුකරණය කරවන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. මිනිස් චර්යාවන් හඳුනා ගැනීම.
02. එම චරිත හා සම්බන්ධ උපකරණ භාවිත කිරීම.
03. චරිතයට උචිත ලෙස භාෂාව භාවිත කිරීම.
04. හඳුනාගත් මිනිස් චර්යාවන් අනුකරණය කිරීම.
05. ප්‍රකාශනාත්මක ව හා අවධානය දිනාගනිමින් ඉදිරිපත් කිරීම.

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**නිපුණතාව 01** නාට්‍ය හා රංගකලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.5** චලන, ඉරියව් හා හැඩතල වැනි බාහිර සත්ත්ව චර්යාවන් අනුකරණය කිරීම.

**ක්‍රියාකාරකම** සතුන් අනුකරණය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

- ★ සත්ත්ව චර්යාවන් නිරීක්ෂණය කරයි.
- ★ දයාව, කරුණාව ආදී මානුෂික ගුණාංග වර්ධනය කරගත යුතු බව පවසයි.
- ★ සත්ත්ව ලෝකයේ විස්මයජනක තොරතුරු ඇසුරින් ලබන වින්දනය ප්‍රකාශ කරයි.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - ''අහස කඩා වැටීම'' කතන්දරය, අවශ්‍ය අවස්ථාවල ශිෂ්‍ය සහභාගිත්වය ද ලබාගනිමින් නාට්‍යරූපී ලෙස කථනයෙන් ඉදිරිපත් කරවන්න.

පියවර 02 - විවිධ සතුන් ගේ හඬ, චලන, ඉරියව් හා ස්වරූපය අධ්‍යයනය කරමින් ඒවා අතර පවත්නා විවිධත්වය වටහාගැනීම සඳහා සංවාදයක් මෙහෙයවන්න.

පියවර 03 - අතිරේක උදව් අංක 01 යටතේ දී ඇති ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. සත්ත්ව චරිතවල විශේෂ ලක්ෂණ, ඉරියව් හඳුනාගැනීමේ හැකියාව ලබයි.
02. එම චර්යාවන්හි විවිධත්වය දැකීමේ හැකියාව ලබයි.
03. විවිධ සත්ත්ව චරිත අනුකරණය කිරීමේ හැකියාව ලබයි.
04. හඬ අනුකරණයෙහි දක්ෂතා ප්‍රදර්ශනය කිරීමේ හැකියාව ලබයි.
05. සාමූහික ව කටයුතු කිරීමේ හැකියාව ලබයි.

**පැවරුම** සත්ත්ව චරිත ඇතුළත් වන ජනකතාවක් නාට්‍යරූපී ව (සංවාද ඇතුළත් ව) ලියන්න.

**අතිරේක උදව් 01**

1. සිසුන් කණ්ඩායම් 5 කට බෙදන්න.
   i. හාවෝ ii. ගෝන්නු iii. මුවෝ iv. කුළුහරක්
   v. සිංහ රාජයා
2. i. හාවාට සෙසු හාවුන් මුණ ගැසීම.
   ii. හාවාට ගෝනුන් හමුවීම.
   iii. හාවුන්ට හා ගෝනුන්ට මුවන් හමු වීම.
   iv. හාවුන්, ගෝනුන් හා මුවන්ට හා කුළු හරක් හමු වීම.
   v. හාවුන්, ගෝනුන්, මුවන් හා කුළු හරකුන්ට සිංහයා හමු වීම.
   vi. සිංහයා හා කණ්ඩායමට අහස කඩා වැටුණු ස්ථානයට ගොස් පරීක්ෂා කිරීම.

**අතිරේක උදව් 02**

## අහස කඩා වැටීම

*''අහස කඩා වැටීම'' කතාන්දරයට ඇතුළත් මූලික සිදුවීම් මාලාව පහත දැක්වේ.*

හාවා අත් දෙකින් මුහුණ වසාගෙන ගොරවමින් නිදා සිටියි. සැණෙකින් මහා ශබ්දයක් ඇසී එක් වර ම ඇහැරුණු හාවා බියෙන් ගැහෙමින් වටපිට බලයි. හේ උඩ බලයි. බිම බලයි. වටපිට බලයි. යළිත් උඩ බලයි. කකුල්වලට වැර දී දුවන්නට පටන් ගනියි.

කැලෑවේ දී බියපත් ව දිව යන හාවාට මුලින් ම හමු වන්නේ තමා ගේ යහළු හාවුන් පිරිසකි. හාවා එක් වර ම කථා කර ගත නොහැකි ව ගොත ගසයි.

''කියාපන් යාළුවේ, කියාපන්. මොකද මේ හති හතිකේ පස්ස නොබලා ම දුවන් යන්නෙ...?'' කියා සෙසු හාවෝ විමසති. එවිට හාවා හති දමමින්, උඩ බලමින්,

''අ... අ... අහස කඩා වැටෙනවා. දුවපල්ලා... දුවපල්ලා...'' යනුවෙන් බියෙන් පවසයි.

මේ ඇසූ සෙසු හාවෝ ද දුවන්නට පටන් ගනිති. ඔවුන්ට අතරමග දී හමු වන්නේ ගෝන යහලුවන් පිරිසයි.

''අහවල් කාරණේකට ද මේ පස්ස ගිනි අරන් වගේ රේස් දුවන්නේ...?'' ගෝන්නු සිය ගොරෝසු හඬින් විමසති.

''අර පැත්තේ අහස කඩා වැටෙනවලු... ඉක්මන් නොකළොත් අපි ඔක්කොම දාලා පිච්චිලා යාවි'' යනුවෙන් හාවෝ පවසති.

හාවා, හා යහළුවන් සහ ගෝන්නු ද ඉදිරියට දුව යති. මෙහි දී ඔවුන්ට මුව යහළුවන් හමු වෙති.

''මොකදෑ... මොකදෑ... මේ මහා විපත්තියක් පාත් වෙලා වගේ'' යි මුවෝ විමසති. එවිට සෙසු පිරිස මෙසේ පිළිතුරු දෙති.

''ආං අහස පාත් වෙලා පොළොවට...''

මෙහි දී මුව පිරිස කලබල වෙමින් ''අපි කම්මුතුයි... අපි කම්මුතුයි... දුවමු දුවමු එහා කැලේට...'' යැයි කියමින් දුවන්නට පටන් ගනිති.

හාවා සමග හා, ගෝන, මුව පිරිස බියෙන් දුව යති. අතරමග දී ඔවුන්ට මුණ ගැසෙන්නේ චණ්ඩ කුළු හරක් පිරිසකි. ඔවුහු ප්‍රචණ්ඩ ස්වරයෙන් මෙසේ විමසති.

''මොකද බොලව් නිකම් භය බිරාන්ත වෙලා...? මොකාටවත් බය වෙන්න එපා. මේ අපි ඉන්නවා. ඇටකටු කුඩු කරල තමයි පස්ස බලන්නෙ.''

එවිට සෙසු පිරිස පිළිතුරු දෙමින් ''උඩ තියෙන අහස් විමන කඩා වැටෙනවා. අපි මේ දුවන්නෙ පණ බේරා ගන්නයි.'' යනුවෙන් පවසති. කුළු හරකුන්ගේ ද කකුල් ගැහෙන්නට පටන් ගනියි. ''බුදු අම්මෝ... අහස් විමන කඩා වැටෙනවා? දුවමු... දුවමු...'' කියමින් ඔවුහු ද දිවීමට එක් වෙති.

මෙම විපත්තිය දැන්වීම සඳහා සියලු පිරිස සතුන් ගේ රජතුමා වන සිංහ රාජයා හමු වීමට යති. සිංහ රාජයා හාවා ඇතුළු සතුන් ගෙන් සිද්ධිය අසා, අහස කඩා වැටුණ ස්ථානයට යාමට තීරණය කරයි. එහි දී සිංහ රාජයා සිදු වූ සියල්ල අවබෝධ කරගනියි. හාවා නිදා සිටි ස්ථානය ආසන්නයේ වැටී තිබී බෙලි ගෙඩියත්, ඒ අසල ඉහළින් ඇති තල් ගසේ වියළි අත්ත දුටු සිංහයා, බෙලි ගෙඩිය අතට ගෙන මඳ සිනා පා ''මෙන්න මේ බෙලි ගෙඩිය ඔය පේන වේළිච්ච තල් අත්ත උඩට වැටුණු වෙලාවේ ඇති වෙච්ච සද්දෙට තමයි අපේ මේ හා පැංචා කලබල වෙලා තියෙන්න...'' යනුවෙන් පවසයි.

එවිට සෙසු පිරිස ද හිස් වනමින් ''ඇත්ත නේන්නම්. අපි ඔක්කොම රැවටුණා නේ...'' යැ යි පවසති. හේතු නොදැන කලබල වීම නිෂ්ඵල කාරණයක් බව සත්තු අවබෝධ කරගනිති.

**නිපුණතාව 01** නාට්‍ය හා රංගකලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.6** නාට්‍යය යනු කුමක් දැයි හඳුනාගනියි.

**ක්‍රියාකාරකම** නාට්‍ය හඳුනාගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

- ★ නාට්‍ය පිළිබඳ ව කරුණු සොයයි.
- ★ නාට්‍ය නරඹයි.
- ★ වින්දනාත්මක අත්දැකීම් ගවේෂණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** කතාන්දර පිටපත් කීපයක් සහ නාට්‍ය පෙළ කීපයක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - සිසුන් නරඹා ඇති වේදිකා නාට්‍යයක් හා (නරඹා නැති නම් සංයුක්ත තැටියක් මගින් හෝ පාඩමට කලින් නාට්‍යයක් නැරඹීමට අවස්ථාව ලබාදෙන්න.) කියවා ඇති කතාන්දරයක් පිළිබඳ ව විමසමින්, කතාන්දරයක් හා නාට්‍යයක් අතර ඇති වෙනස්කම් හඳුනාගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

(නාට්‍යයක් යනු යමක් කර පෙන්වීම බවත්, එය අවස්ථාවක් හෝ සිද්ධියක් පාදක කොටගත්තක් බවත්, නාට්‍යයක ප්‍රබල සංවාද සහ රංග විධාන ඇතුළත් පිටපතක් තිබෙන බවත්, මෙහි දී අවධාරණය විය යුතුයි.)

පියවර 02 - කතාන්දරය යනු සිද්ධි මාලාවක් සහිත, සංවාද ඇතත් ඒවා එතරම් ප්‍රබල නොවන, දීර්ඝ කාලීන කාල පරාසයක් තුළ විකාශනය වන, ශ්‍රාවකයා අරමුණු කරගත් අසා රස විඳිය හැකි ප්‍රවෘත්තියක් බවත්, නාට්‍යය යනු යම් කිසි අවස්ථාවක් හෝ සිද්ධියක් පාදක කොටගෙන, සංවාද හා රංග විධාන සහිත ව ලියන ලද පිටපතක් ඇති, රංගය සඳහා ම සූදානම් කළ, ප්‍රේක්ෂකයා අරමුණු කොට ගත් බලා රස විඳිය හැකි නිර්මාණයක් බවත් පැහැදිලි වන ආකාරයෙන් කතාන්දරය හා නාට්‍යය සසඳමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

පියවර 03 - කතාන්දරයක හා නාට්‍යයක ඇති සමානතා හා අසමානතා සසඳමින් නාට්‍යය යනු කුමක් දැයි අවබෝධ වන අයුරින් සැසැඳුම් පතක් පිළිවෙළ කරවන්න. (සිසුන් උචිත පරිදි කණ්ඩායම් කොට කතාන්දර පිටපත් හා නාට්‍ය පෙළ කීපයක් කණ්ඩායම් අතර බෙදා දීමෙන් සිසුන්ට සහාය වන්න.)

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. කතාන්දර හා නාට්‍යයක් අතර ඇති වෙනස හඳුනා ගැනීමේ හැකියාව ලැබීම.
02. නාට්‍යයක ස්වභාවය දැනගැනීමේ හැකියාව ලැබීම.
03. නාට්‍ය පෙළ රස විඳීමේ හැකියාව ලැබීම.
04. නාට්‍ය පෙළක විශේෂත්වය විස්තර කිරීමේ හැකියාව ලැබීම.
05. නාට්‍යයට උචිත සිදුවීම්, අත්දැකීම් හා කතාවස්තු එක්රැස් කිරීමේ හැකියාව ලැබීම.

යනාදී කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** සරල කතාන්දරයක් තෝරාගෙන, එයින් සරල නාට්‍ය පෙළක් නිර්මාණය කරන්න.

| | |
|---|---|
| **නිපුණතාව 01** | නාට්‍ය හා රංගකලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි. |
| **නිපුණතා මට්ටම 1.7** | අනුකරණ ක්‍රියාවලිය උදෙසා අභිනය භාවිත කිරීම. |
| **ක්‍රියාකාරකම** | අභිනය හඳුනාගනිමු. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | 03 |

**ඉගැනුම් පල**

- ⋆ ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීමේ දී එය වඩාත් ආකර්ෂණීය ලෙස ඉදිරිපත් කරයි.
- ⋆ චරිතයක් නිරූපණය කිරීම සඳහා සතර අභිනය යොදාගත හැකි ආකාරය නිරීක්ෂණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** ආංගික අභිනය පෙන්වන ලෝකධර්මී හා නාට්‍ය ධර්මී නාට්‍යවලට අදාළ පින්තූර, නාට්‍යවල දෙබස් ඛණ්ඩ, සාත්ත්වික අභිනය නිරූපණය කෙරෙන පින්තූර.

ආහාර්ය අභිනයට අදාළ උපකරණ.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - මනමේ නාට්‍යයේ එන ''ප්‍රේමයෙන් මන රංජිතවේ'' ගීතය සිසුන්ට ශ්‍රවණය කිරීමට අවස්ථාව ලබාදෙන්න. මෙය සංයුක්ත තැටියක් උපයෝගී කරගනිමින් සිසුන්ට ප්‍රදර්ශනය කිරීම වඩාත් වැදගත් වේ. ඒ අයුරින් නළුවන් ආංගික අභිනය භාවිතයෙන් ද, සංවාද ගීත ආදියෙන් ද, මුහුණින් හා සිරුරෙන් මතු කරන හැඟීම්වලින් ද, ආලේපන, ඇඳුම් පැළඳුම්, රංග භාණ්ඩ පසුතල නිර්මාණ ආදියෙන් ද රූපණය වඩාත් සාර්ථක ව කරන ආකාරය පැහැදිලි කරදෙන්න.

පියවර 02.1 - සිසුන් කණ්ඩායම් හතරකට බෙදා ගුණාත්මක යෙදවුම්වල සඳහන් පින්තූර ඔවුනට ලබාදෙන්න.

- 1 කණ්ඩායම - ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී ශෛලීන් දෙකට අයත් විවිධ ඉරියව් සහිත පින්තූර.
- 2 කණ්ඩායම - උක්ත ශෛලීන්ට අයත් සංවාද ඛණ්ඩ ඇතුළත් පත්‍රිකා.
- 3 කණ්ඩායම - දුක, බිය, ශෝකය, ප්‍රීතිය, පුදුමය ආදී හැඟීම් නිරූපිත පින්තූර.
- 4 කන්ඩායම - රංග වස්ත්‍ර, නාට්‍යෝපකරණ, පසුතල නිර්මාණ, රංගාලෝක උපකරණ ආදිය නිරූපිත පින්තූර.

පියවර 02.2 - නාට්‍යයක් ප්‍රේක්ෂකයන් වෙත ඉදිරිපත් කරන මාධ්‍යය ''අභිනය'' නමින් හැඳින්වෙන බවත්, අභිනය සිවු ආකාර වන බවත්, ඒවා ආංගික, වාචික, සාත්ත්වික හා ආහාර්ය යනුවෙන් හැඳින්වෙන බවත් විස්තර කොට සපයා ඇති පින්තූර හෝ වේෂභූෂණවලින් සැරසුණු අයකු ලවා නාට්‍ය කොටසක් නිරූපණය කරවීම ආශ්‍රයෙන් එම අභිනයන්ට නිදසුන් ලබාදෙන්න.

පියවර 03 - සිසුන් ලබාගත් දැනුම සටහනක් සේ අභ්‍යාස පොතෙහි ලියාගැනීමට සලස්වන්න. පසු පැවරුමක් ලෙස සතර අභිනය හඳුන්වා එයට නිදර්ශන පින්තූර ඇතුළත් කොට කුඩා පොතක් සකස් කිරීමට උපදෙස් දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. අභිනය යනු කුමක් ද යි දැනගැනීම.
02. සතර අභිනය නම් කිරීම.
03. සතර අභිනයෙහි ලක්ෂණ හඳුනා ගැනීම.
04. සතර අභිනයට අදාළ නිදර්ශන එක් රැස් කිරීම.
05. ප්‍රකාශනයක් වඩාත් ආකර්ෂණීය ලෙස ඉදිරිපත් කිරීට සතර අභිනය යොදා ගැනීම.

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**අතිරේක උදව්**

01. වාචික, ආංගික, සාත්ත්වික, ආහාර්ය අභිනයන්ට අදාළ නිදර්ශන පින්තූර හා සංවාද.
02. නාට්‍ය ගීත / කොටස් ඇතුළත් සංයුක්ත තැටි (ශ්‍රව්‍ය හා දෘශ්‍ය වශයෙන්)
03. වේෂභූෂණ / නාට්‍යෝපකරණ ආදිය.

**නිපුණතාව 02** ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.1** අත්දැකීම් පාදක කොටගනිමින් පරිකල්පන ශක්තිය මෙහෙයවා නිර්මාණ-කරණයෙහි යෙදෙයි.

**ක්‍රියාකාරකම** ස්වාභාවික පරිසරයෙහි දැකිය හැකි වස්තූන් පාදක කරගනිමින් නිර්මාණ-කරණයෙහි යෙදීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

★ ස්වාභාවික පරිසරයෙහි දැකිය හැකි වස්තූන් අගය කරමින් කථා කරයි.
★ පරිසරයට අනුගත වෙමින් ජීවන රටාව ගොඩනගා ගනියි.
★ සුන්දර පාරිසරික ස්වභාවයන් නිර්මාණාත්මක ව අනුකරණය කරයි.
★ පරිසරය පිළිබඳ ගී, කවි, රචනා ප්‍රබන්ධ කරයි.
★ පරිසරය සුරකින බව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** චිත්‍ර කඩදාසි, සායම්, තෙලිකූරු, පැන්සල්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

★ සිසුන් පන්ති කාමරයෙන් බැහැර එළිමහනකට රැගෙන යන්න.
★ පරිසරය හා ඒ ආශ්‍රිත සිදුවීම් හා අත්දැකීම් පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
★ සිසුන් කණ්ඩායම් කරන්න.
★ ක්‍රියාකාරකම සඳහා පැවරුම් ලබාදෙන්න.

1 කණ්ඩායම - හිරු පෑයීම
2 කණ්ඩායම - සඳ පෑයීම
3 කණ්ඩායම - වැස්ස
4 කණ්ඩායම - සුළඟ

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. අපූර්ව බවින් යුතු ව නිර්මාණය කිරීමේ හැකියාව ලැබීම.
02. රංගනයට අදාළව නිර්මාණය කිරීමේ හැකියාව ලැබීම.
03. නිර්මාණශීලී ව අනුකරණය කිරීමේ හැකියාව ලැබීම.
04. අත්දැකීම් නිවැරදි ව නිර්මාණයට එක් කිරීමේ හැකියාව ලැබීම.
05. සමස්ත නිමාව සාර්ථක කරගැනීමේ හැකියාව ලැබීම.
යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** I, II, III, IV වශයෙන් කණ්ඩායම් ක්‍රියාකාරකම්.

**අතිරේක උදව්** ස්වාභාවික පරිසරය හා අවට සිදු වන සංසිද්ධීන් අධ්‍යයනය කිරීම.

**නිපුණතාව 02** ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.2** පරිසරය ආශ්‍රිත අවස්ථා හා සිද්ධි පාදක කොටගෙන නිර්මාණාත්මක රංග ක්‍රියාවන්හි යෙදෙයි.

**ක්‍රියාකාරකම** ඇසූ පිරූ තැන් ඇසුරින් රංගනයේ යෙදෙමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

- ★ පරිසරයේ ස්වභාවය නිරීක්ෂණය කර හෝ තමන් අත්දැකීම් ලද අවස්ථා හෝ සිද්ධි රැස් කර ලේඛනගත කරයි.
- ★ එම අවස්ථාවන් හෝ සිද්ධීන් ප්‍රතිනිර්මාණය කිරීම සඳහා නාට්‍යෝචිත පරිදි සිදුවීම් පෙළ ගස්වයි.
- ★ විවිධ සංවාද, හඬ, නාද, චලන විධි භාවිත කරමින් රංග කාර්යයෙහි යෙදෙයි.
- ★ තෝරා ගත් අවස්ථා හෝ සිද්ධීන් නව පරිකල්පනයෙන් යුක්ත ව රංගනය සඳහා යොදාගනී.

**ගුණාත්මක යෙදවුම්** ජීවිත අත්දැකීම්, මිතුරන්, පොතපත, ජනමාධ්‍යය (රූපවාහිනී, ගුවන්විදුලි, සඟරා, පුවත්පත්)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 -
- ★ පරිසරයෙන් සිසුන් ලද අත්දැකීම් සම්බන්ධ ව සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ★ එම අත්දැකීම්වල සුවිශේෂතා පිළිබඳ විමසන්න. (සුබදායී අත්දැකීම්, දුක්ඛදායි අත්දැකීම්, ප්‍රහසනාත්මක අත්දැකීම්)
- ★ ඒ ඒ අත්දැකීම් හා සම්බන්ධ වුණු චරිත පිළිබඳ සිසුන් හා සාකච්ඡා කරන්න. (මිනිස් හෝ සත්ත්ව)
- ★ එම සියලු සිද්ධීන්ට හෝ අවස්ථාවන්ට අදාළ සුවිශේෂ වාග්මාලාවක් ඇති බව පැහැදිලි කර දෙන්න.
- ★ එම සියලු සිද්ධීන්වලින් ජීවිතයට යම් අරුතක් එක් වන බව සාකච්ඡා කරන්න.

පියවර 02 -
- ★ සිසුන් සුදුසු ස්ථානයකට රැගෙන යන්න. (වේදිකාවට හෝ එළිමහනට)
- ★ සිසුන් පෙළගස්වන ලද අත්දැකීම් පාදක කොටගත් අවස්ථා, සිද්ධි කණ්ඩායම් අතර කැමති පරිදි රූපණය සඳහා වෙන් කරදෙන්න.
- ★ සියලු කණ්ඩායම්වලට තමන් තෝරාගත් අවස්ථාව හෝ සිද්ධියට අදාළ චරිත හඳුනාගැනීමට අවස්ථාව ලබාදෙන්න.
- ★ චරිතයන්ට අදාළ පරිදි ඉරියව් හා හැඟීම් (සාත්ත්වික අභිනය) ප්‍රකට වන පරිදි අවස්ථා නිරූපණයට අවස්ථාව ලබාදෙන්න.

පියවර 03 -
- ★ සියලු කණ්ඩායම්වලට අදාළ රංගන අවස්ථාවන්ට නිදහසේ අදාළ රූපණයෙහි යෙදීමට ඉඩ ලබාදෙන්න.
- ★ එම රූපණයන්හි ඇති සුවිශේෂතා සාකච්ඡා කරන්න.

- ★ පරිසරයෙන් ලබාගන්නා අත්දැකීම් රූපණයෙන් ඉදිරිපත් කිරීමේ දී තමන්ට අභිමත පරිදි නිර්මාණාත්මක පරිකල්පනය යොදාගත හැකි බව සිසුන් සමග කතා කරන්න
- ★ සිසුන් විසින් ඉදිරිපත් කරන ලද අවස්ථා හා සිද්ධිවල ඇති නිර්මාණාත්මක බව අගය කිරීම හා තව දුරටත් සංවර්ධනය විය යුතු අවස්ථා පෙන්වා දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. තම අත්දැකීම් ප්‍රකාශ කිරීම හා ලේඛනගත කිරීමේ හැකියාව ලැබීම.
02. එම අවස්ථා හා සිද්ධි රූපණයෙන් දක්වීමට අවශ්‍ය කටයුතු සූදානම් කිරීමේ හැකියාව ලැබීම.
03. ඒ සඳහා සාමූහික ව කටයුතු කිරීමේ හැකියාව ලැබීම.
04. උචිත පරිදි සංවාද, ඇඳුම් පැළඳුම්, නාට්‍යෝපකරණ ආදිය යොදාගැනීමේ හැකියාව ලැබීම.
05. සමස්ත නිර්මාණය සාර්ථක ව ඉදිරිපත් කිරීමේ හැකියාව ලැබීම.

**පැවරුම**

පහත සඳහන් පරිසර අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණාත්මක රංග ක්‍රියාවන්හි නිරත වන්න.
(කණ්ඩායම් වශයෙන් හෝ කේවල වශයෙන්)

01. කටුගාලක පැටලුණු පුද්ගලයකු ඉන් මිදීමට උත්සාහ දරන අවස්ථාවේ පිහිටට පැමිණි අය ද කටුගාලේ පැටලීම.
02. ගසකින් කොස් ගෙඩියක් කඩන්නට ගොස් හිසට කොහොල්ලෑ ගොඩක් වැටීම නිසා එය ඉවත් කර ගැනීමට අන් අයගේ උදව් පතන කාන්තාවක් හා උදව්වට පැමිණි අයගේ ඇඟේ කොහොල්ලෑ ගෑවීම නිසා අපහසුතාවට පත් වීම.
03. කුඩු කර සිටි හා පැටියකු කුඩුවෙන් පැන යාම හා ඌ නැවත කුඩුවට දැමීමට කරන උත්සාහයේ දී ඌ ලන්දකට පැන යාම හා ලන්ද පීරා හාවා සෙවීම. අවසානයේ හාවා හමු වීම.
04. මංගල උත්සවයකට යන පිරිසක් පයින් මනාලයාගේ නිවසට යද්දී ඇදහැළුණු මහ වැස්ස නිසා මනාල යුවලගේ ඇඳුම් පැළඳුම් නොතෙමා බේරාගැනීමට තැත් දරන පිරිසක්.
05. සොරෙන් අඹ ගෙඩියක් කඩන්නට තැත් කරන ළමයි පිරිසක් බල්ලකු බුරනු ඇසී බල්ලාට බය නැති බව පුරසාරම් කියමින් ඌට තරවටු කරන අයුරු රංගනය කරමින් පවසද්දී බල්ලා බුරමින් පැමිණීම. අනෙක් ළමයි බයේ දුවද්දී බල්ලා එක ළමයකු ගේ කලිසමෙන් ඇද එය බිමට ඇද දැමීමට උත්සාහ දරයි. සෙසු ළමයි සැඟවී ඔහුට සිනාසෙයි. ළමයා ලජ්ජාවට පත්වීමට සූදානම් වෙද්දී බල්ලා දරුවාට ආදරය කිරීම.

**අතිරේක උදව්**

- ★ පරිසර අත්දැකීම් උදව් කරගැනීම.
- ★ මිතුරන්ගේ ඇසූ පිරූ තැන් උපයෝගී කරගැනීම.
- ★ තමන් කියවා ඇති පොතපතින් ලබා ගත් අවස්ථා හා සිද්ධි උදව් කරගැනීම.

**නිපුණතාව 02** ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.3** විවිධ චරිත ස්වභාවයන් ඉස්මතු වන පරිදි සාමූහික ව රූපණයේ යෙදීම.

**ක්‍රියාකාරකම** විවිධ මිනිස් භූමිකා රඟ දක්වමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

- ★ පුද්ගලයකුට සිය ජීවිත කාලය තුළ විවිධ භූමිකා අනුව කටයුතු කිරීමට සිදු වන බව ප්‍රකාශ කරයි.
- ★ විවිධ භූමිකා නම් කරයි.
- ★ එක් එක් චරිත තුළ විවිධ භූමිකා ඇති බව ප්‍රකාශ කරයි.
- ★ එක් පුද්ගල චරිතයක භූමිකා රැසක් ඇති බව රංගනයෙන් ආදර්ශනය කරයි.
- ★ සාමූහික ව කටයුතු කිරීමේ හැකියාව ප්‍රකට කරයි.

**ගුණාත්මක යෙදවුම්** විවිධ මිනිස් භූමිකා ඉස්මතු වන පරිදි රංගනයේ යෙදෙන නළුවන් ගේ ඡායාරූප හෝ දෘශ්‍ය පට (CD, DVD)
(ගුරුවරයෙක්, භික්ෂුවක්, සිඟන්නෙක්, ළමයෙන්, වෛද්‍යවරයෙක්, හෙදියක්, නඩුකාරයෙක්, ගොවියෙක්, පොලිස් භටයෙක්, ආරච්චිරාළ.... ආදී)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 -

- ★ සිසුන් සාමූහික ව රැස්කොට ජීවිතයේ විවිධ අවස්ථාවල දී විවිධ පුද්ගලයින් සමග කටයුතු කිරීමට සිදු වන බව සිසුන් හා සාකච්ඡා කරන්න.
- ★ එම විවිධ අවස්ථාවල දී එක් එක් පුද්ගලයාට විවිධ භූමිකාවන්ට අනුව කටයුතු කිරීමට සිදු වන බව සිසුන් හා කථාබස් කරන්න.

  උදා:- ගෙදර දී මවක්, ඇය පාසලේ දී ගුරු මහත්මියක්, පන්සලේ සිල් ගත් විට දී උපාසිකාවක් ආදී වශයෙන්.
- ★ විවිධ භූමිකා අනුව කටයුතු කිරීමේ දී ඒ ඒ පුද්ගලයා ගේ බාහිර පෙනුම, අදහස් හැඟීම් හා චර්යා රටාවන් වෙනස් වන අන්දම සිසුන්ගේ ම අදහස්වලින් ඉස්මතු වන පරිදි සාකච්ඡා කරන්න.
- ★ විවිධ භූමිකාවලට සමාරෝප වී රූපණ කාර්යයේ යෙදීමට හැකි බව පෙන්වා දෙන්න
- ★ නාට්‍යයක දී මෙම භූමිකා රංගන උපයෝගී කොට ගෙන සාර්ථක නාට්‍ය නිර්මාණයක් කළ හැකි බව අවධාරණය කරන්න.

පියවර 02 -

- ★ ගුණාත්මක යෙදවුම් සඳහා දී ඇති පින්තූර හෝ දෘශ්‍ය පට නැරඹීමට ශිෂ්‍යයින්ට අවස්ථාව ලබා දෙන්න.
- ★ පියවර 01 හි දී සාකච්ඡා කළ කරුණු එහි දී තව දුරටත් අවධාරණය කරන්න.

පියවර 03 -

- ★ එක් එක් ශිෂ්‍යයින්ට විවිධ භූමිකා තෝරාගැනීමට අවස්ථාව ලබා දෙන්න. (තුණ්ඩු දැමීමෙන්)
- ★ සූදානම සඳහා අවශ්‍ය නම් ඉතා සීමිත කාලයක් ලබා දෙන්න.
- ★ ස්වාධීන ව රූපණයේ යෙදීමට සියලු ම ශිෂ්‍යයින්ට ඉඩකඩ ලබා දෙන්න.

* පන්තියේ සියලු ම ශිෂ්‍යයින් ගේ ඉදිරිපත් කිරීම් සෙසු ශිෂ්‍යයින්ට නැරඹීමට අවස්ථාව ලබා දෙන්න.
* ඔවුන්ගේ නිරූපණයන්හි දැකිය හැකි සාර්ථක සහ අසාර්ථක තැන් පිළිබඳ සාකච්ඡා කරන්න.
* සෑම භූමිකාවක ම යහපත් අයහපත් යන පැතිකඩ දෙකක් දැකිය හැකි බව පෙන්වා දෙන්න.
* භූමිකාවක මෙම පැතිකඩ දෙක ම ඉස්මතු වන පරිදි රූපණයේ යෙදිය යුතු බව පවසන්න.
* එමගින් භූමිකාවේ ඇති විවිධ චරිත ලක්ෂණ පෙන්වීමට හැකියාව ලැබෙන බව සිසුන් සමග සාකච්ඡා කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. සමාජයේ පුද්ගල චරිතවල විවිධ භූමිකා හඳුනාගැනීමේ හැකියාව ලැබීම.
02. එක් එක් භූමිකාවට ආවේණික චර්යාවන් හඳුනාගැනීමේ හැකියාව ලැබීම.
03. විවිධ භූමිකාවලට සාර්ථක ව සමාරෝප වීමේ හැකියාව ලැබීම.
04. සමාරෝපය තුළින් ඒ ඒ භූමිකාවලට අදාළ ව රූපණයේ යෙදීමට හැකියාව ලැබීම.
05. සමස්ත රූපණය සඳහා ඇසූපිරූ පරිසර අත්දැකීම් පාදක කොටගැනීම සඳහා හැකියාව ලැබීම.

යන කරුණු ඇගැයීම සඳහා යොදාගන්න.

**පැවරුම**

පහත දැක්වෙන අවස්ථාවන් පාදක කොටගෙන එම අවස්ථාවන්ට අදාළ භූමිකා රංගනයේ යෙදීම.

1. පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවය දා.
2. වෙළඳ පොළක්.
3. රෝහල් වාට්ටුවක කාර්ය බහුල අවස්ථාවක්.
4. රිය අනතුරක් සිදු වූ අවස්ථාවක්.
5. පන්සලක / දේවස්ථානයක පූජා පවත්වන අවස්ථාවක්.

**අතිරේක උදව්**

* සජීවී ව වේදිකා නාට්‍ය නැරඹීම.
* විවිධ භූමිකා රංගන අවස්ථා උපයෝගී කරගැනීම.
* භූමිකා රංගන ශිල්පීන්ගේ සම්පත් දායකත්වය ලබාගැනීම.
* පාසලේ රූපණ දක්ෂතා ඇති ගුරුවරුන් හා ශිෂ්‍යයින්ගේ සහාය ලබාගැනීම.

**නිපුණතාව 02** ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.4** සත්ත්ව චර්යාවන් අනුකරණය කරමින් ක්ෂණික නිරූපණයන්හි යෙදෙයි.

**ක්‍රියාකාරකම** සත්ත්ව චර්යාවන් අනුකරණයෙන් ක්ෂණික නිරූපණයන්හි යෙදීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

★ සත්ත්වයින් ගේ හැසිරීම් රටා නිරීක්ෂණය කරයි.
★ මිනිස් චර්යා හා සත්ත්ව චර්යා එකිනෙක සංසන්දනය කරයි.
★ සත්ත්ව චර්යා ඇසුරෙන් ක්ෂණික නිරූපණ ඉදිරිපත් කරයි.
★ සත්ත්වයින් ගේ වුව ද යහපත් චර්යාවන් ජීවිත යහපත් කර ගැනීම සඳහා ආදර්ශ බවට පත් කරගනී.
★ සත්ත්ව චර්යා නාට්‍ය සඳහා උපයෝගී කොටගනී.
  උදා:- කුහුඹුවන්, වේයන්, කුරුල්ලන්, හරකුන්, අලි ඇතුන්....
★ රූපණ කාර්යයේ දී සත්ත්ව චර්යාවන් පහසුවෙන් ක්ෂණික නිරූපණ සඳහා යොදාගනී.
★ සත්ත්ව චර්යා ඇසුරෙන් ජීවිත පරිඥානය පුළුල් කොටගනියි.
★ සත්ත්ව චර්යා නිරූපණයෙන් මානව සමාජයට පණිවිඩ රැසක් ලබාදෙයි.

**ගුණාත්මක යෙදවුම්** විවිධ සත්ත්ව චර්යා හා ඉරියව් දැක්වෙන දෘශ්‍ය පට, පින්තූර, සඟරා, චිත්‍ර, සතුන්ගේ නාද හඬ පටයක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 -
★ සියලු ම සිසුන්ට ස්වාභාවික පරිසරයේ සිටින සතුන් නැරඹීමට අවස්ථාවක් ලබාදෙන්න. (මෙය අධ්‍යයන චාරිකාවක් ලෙස ද යොදාගත හැකි ය. තමාගේ පාසල අවට එබඳු පරිසරයක් නොමැති නම් යාල, විල්පත්තු, සත්ත්වෝද්‍යානය ආදිය නැරඹීමට ද හැකි ඉඩකඩ අනුව ලබාගන්න.)
★ එසේ නොමැති නම් ගුණාත්මක යෙදවුම් ද භාවිතයට ගත හැකි ය.
★ ඉන්පසු ඔවුන් දුටු සත්ත්ව චර්යාවන් පිළිබඳ විමසන්න.
★ එහි දී සතුන්ගේ චරිත උපයෝගී කොටගෙන කරන ලද නාට්‍ය නරඹා ඇද්ද යන්න විමසන්න.
★ සත්ත්ව චර්යා මිනිසුන්ට අනුකරණය කළ හැකි බව පෙන්වා දෙන්න. (දෘශ්‍ය හා හඬ පට උපයෝගී කොටගනිමින්)
★ සෑම සත්ත්වයකුට ම ආවේණික චර්යා පද්ධතියක් ඇති බව පෙන්වා දෙන්න.
★ නාට්‍ය නිර්මාණයේ දී සත්ත්ව චරිත භාවිත කොට සමාජයට උසස් පණිවිඩයක් දිය හැකි බව පෙන්වා දෙන්න.
★ ඒ සඳහා සත්ත්ව චර්යාවන් හොඳින් නිරීක්ෂණය කොට ලබාගත් අත්දැකීම් තමන් තුළ තිබිය යුතු බව පැහැදිලි කරන්න. (මෙහි දී දෘශ්‍ය පට නැවත වරක් සිසුන්ට පෙන්වීම කළ හැකි ය.)

පියවර 02 - පන්තියේ සියලු ම සිසුන් කණ්ඩායම් කීපයකට වෙන් කරන්න.
★ එක් එක් කණ්ඩායම් සඳහා ක්ෂණික නිරූපණයේ යෙදීමට මාතෘකා එක බැගින් ලබා දෙන්න.

★ කණ්ඩායම් සඳහා පහත දැක්වෙන රංගන අවස්ථා ලබාදෙන්න. (මෙය ගුරුවරයා ගේත් සිසුන් ගේත් අභිමතය පරිදි වෙනස් කළ හැකි ය.)

1. කුරුලු ගෙදර දරු පැටවුන් දොරට වඩින දා.
2. කපුටා ගේ කූඩුවේ බිත්තර දැමූ කොහා පළමු වරට කෑ ගැසීම නිසා කුරුලු ගෙදර සිදු වන අවුල් සහගත තත්ත්වය.
3. කැලේට රජකු පත් කර ගන්නා අවස්ථාව.
4. කැලේ හැදුණු සුරතල් අලි පැටවකු සර්කස් කණ්ඩායමක් විසින් අල්ලාගනු ලැබ නගරයට ගෙනයාම නිසා ඌ බේරාගැනීමට යොදන උපක්‍රම.
5. පළඟැටියා ගේ ගීත නාදය කරච්චලයක් වූ අනෙක් සතුන් ඌට අවවාද කරන අවස්ථාවක්.

පියවර 03 - ★ සෑම කණ්ඩායමකට ම ක්ෂණික නිරූපණ කාලය විනාඩි 10 ක් පමණ ලබාදෙන්න.

★ ක්ෂණික නිරූපණ සඳහා සූදානම් වීමට විශාල කාලයක් ලබා නොදෙන බව පැහැදිලි කරන්න.

★ සියලු කණ්ඩායම්වල නිරූපණ සියලු ම ශිෂ්‍යයින්ට නැරඹීමට අවස්ථා ලබාදෙන්න.

★ සාර්ථක ව තම නිරූපණ ඉදිරිපත් කළ කණ්ඩායම් තෝරන්න.

★ ඔවුන්ගේ සාර්ථකත්වයට හේතු වූ කරුණු පැහැදිලි කිරීම හා තවදුරටත් සංවර්ධනය විය යුතු තැන් පැහැදිලි කරන්න.

★ ක්ෂණික නිරූපණ සඳහා තම පරිකල්පන ශක්තිය ද යොදා සත්ත්ව චර්යා අනුකරණය කළ හැකි බව පෙන්වා දෙන්න.

★ විවිධ නාට්‍ය සඳහා මෙම අනුකරණ යොදා ගත හැකි බව පෙන්වාදීම.

★ නාට්‍යයක දී විවිධ සත්ත්ව චරිත උපයෝගී කොට ගෙන මිනිස් චර්යාවන් සංකේතවත් කළ හැකි බව අවධාරණය කරන්න.

★ සතුන්ගේ විවිධ චලන, ගති ලක්ෂණ හා චර්යාවන් සියල්ල ක්ෂණික නිරූපණය තුළ සාර්ථක ව ඉදිරිපත් කිරීමෙන් නාට්‍යයේ එම චරිතයට සාධාරණයක් ඉටු කිරීමට නළුවකුට හැකි බව පෙන්වා දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. සත්ත්වයින් ගේ හැසිරීම් රටා නිරීක්ෂණය කිරීමේ හැකියාව ලැබීම.
02. ඒ අනුව නිර්මාණය කරගත් ක්ෂණික නිරූපණ සාර්ථක ව ඉදිරිපත් කිරීමේ හැකියාව ලැබීම.
03. සත්ත්ව චර්යා මැනැවින් අනුකරණය කිරීමේ හැකියාව ලැබීම.
04. ක්ෂණික නිරූපණ සඳහා ශිෂ්‍යයන් සතු පරිකල්පන ශක්තිය යොදා ගැනීමේ හැකියාව ලැබීම.
05. ඒ ඒ රංගන අවස්ථාවන් සඳහා සාමූහික සහභාගිත්වය යොදාගැනීමේ හැකියාව ලැබීම.

යන කරුණු ඇගැයීම සඳහා යොදාගන්න.

**නිපුණතාව 02** නාට්‍යමය ක්‍රියාකාරකම්හි නිරත වෙමින් නිර්මාණාත්මක හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.5** මානුෂ හා අධිමානුෂ චරිත උපයෝගී කරගෙන ක්ෂණික නිරූපණවල යෙදෙයි.

**ක්‍රියාකාරකම** විවිධ චරිත හඳුනාගනිමු.
ඒවා සතුටින් රඟමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

- ★ විවිධ මානුෂ චරිත නිරීක්ෂණය කොට වෙනස්කම් හඳුනාගනී.
- ★ විශ්වාස මත පදනම් වූ අධිමානුෂ චරිත පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.
- ★ සාමාජික, සංස්කෘතික, අධ්‍යාපනික හා ජාතික මට්ටම් අනුව විවිධ මානුෂ චර්යාවන්හි විශේෂතා හඳුනාගනී.
- ★ දෙවියන්, යෝධයන්, සුරංගනාවන්, කිඳුරන්, රාක්ෂයන්, භූතයන් වැනි අධිමානුෂ චරිත පිළිබඳ ව කරුණු රැස් කර ගනී.
- ★ ඒ ඒ චරිත ඇසුරු කොටගෙන ක්ෂණික නිරූපණ කිරීම් සිදු කරයි.
- ★ විවිධ චරිත ඇතුළත් නාට්‍ය, රූපවාහිනී නිර්මාණ, පින්තූර, වීඩියෝපට, කතන්දර පොත් විමර්ශනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** මානුෂ හා අධිමානුෂ චරිතවල පින්තූර විවිධ චරිත රංගන ඇතුළත් වීඩියෝ පට. (කාටූන් ඇතුළුව)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 -

පිවිසීමː- රූපණයට දක්ෂ දරුවකු පන්තියේ ඉදිරියට ගෙන ඔහුට කුමක් හෝ චරිතයක් රූපණය කිරීමට අවස්ථාව දෙන්න.

- ★ ඒ රංගනය පිළිබඳ ව අගය කරමින්, සිසුන් ගෙන් කරුණු විමසීම හා ක්ෂණික නිරූපණ යන්න හඳුන්වා දෙන්න.
- ★ මානුෂ හා අධිමානුෂ චරිත ද උපයෝගී කොට ගෙන ක්ෂණික නිරූපණ කළ හැකි බව පෙන්වා දෙන්න.
- ★ මානුෂ හා අධිමානුෂ චරිත ස්වභාවයන් පිළිබඳ ව හඳුන්වන්න.

පියවර 02 -

- ★ මානුෂ චරිත හා අධිමානුෂ චරිත අතර ඇති වෙනස්කම් පැහැදිලි කිරීම.
- ★ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා එක් කණ්ඩායමකට මානුෂ චරිත සහ අනෙක් කණ්ඩායමට අධිමානුෂ චරිත රූපණය කිරීමට අවස්ථාව දෙන්න.

පියවර 03 -

- ★ රූපණය කරන ලද ඒ ඒ චරිත පිළිබඳ ව ඒ ඒ කණ්ඩායම්වලින් සාර්ථක හා සංවර්ධනය විය යුතු අවස්ථා පිළිබඳ ව විමසන්න.
- ★ කේවල ව මෙන් ම සාමූහික ව ද ක්ෂණික නිරූපණ කිරීමට අවස්ථාව දීම හා ඒ පිළිබඳ සමාලෝචනයක් කරවන්න.
- ★ සියලු ම දෙනාට ම සහභාගි වීමට අවස්ථාව දෙන්න.
- ★ දක්ෂ ලෙස රූපණය කළ අය අගයන්න. අන් අය ද පැසසුමට ලක් කරමින් අඩුපාඩු පෙන්වා දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. එක් එක් චරිතවල විශේෂතා හඳුනාගැනීමේ හැකියාව ලැබීම.
02. චරිතවල අපූර්වත්වය හඳුනාගැනීමේ හැකියාව ලැබීම.
03. භූමිකා නිර්මාණාත්මක ව අනුකරණය කිරීම.
04. ඒ ඒ චරිතවල අනන්‍යතාව නිරූපණය කිරීමේ හැකියාව ලැබීම.
05. සමස්ත රංගනය සාර්ථක ව ඉදිරිපත් කිරීමේ හැකියාව ලැබීම.

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** කණ්ඩායම් දෙකෙහි සිසුන් ඉදිරිපත් කරන ක්ෂණික නිරූපණ චරිත යොදා ගෙන යම් අවස්ථාවක් නිරූපණය කිරීමට පැවරීම.

**අතිරේක උදව්** ඇලඩින් ගේ පුදුම පහන, හිම කුමරිය ගේ කතාව, බටකොළ ආච්චි සම්බන්ධ කතා, යෝධයින් සම්බන්ධ කතා, විවිධ ළමා නාට්‍ය හා වීඩියෝ පට ආදිය.

**නිපුණතාව 02** නාට්‍යමය ක්‍රියාකාරකම්හි නිරත වෙමින් නිර්මාණාත්මක හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.6** විවිධ භාණ්ඩ පාදක කොටගෙන ක්ෂණික නිරූපණයෙහි යෙදෙයි.

**ක්‍රියාකාරකම** සතුටු සිතින් අපි රඟමු

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

- ★ රංගනයේ දී උපයෝගී කරගන්නා භාණ්ඩ ''නාට්‍යෝපකරණ'' බව ප්‍රකාශ කරයි.
- ★ රූපණය සඳහා නාට්‍යෝපකරණ භාවිතයේ ඇති අවශ්‍යතාව ප්‍රකාශ කරයි.
- ★ ක්ෂණික නිරූපණවල දී ක්ෂණික ව තෝරාගත් සරල උපකරණ යොදා ගත හැකි බව ප්‍රකාශ කරයි.
- ★ නාට්‍යෝපකරණ භාවිත කරමින් කේවල ව හෝ සාමූහික ව ක්ෂණික නිරූපණයන්හි නියැළෙයි.

**ගුණාත්මක යෙදවුම්** අඩි කෝදුවක්, ලී කෝටු, පුටු, පැන්සල්, පොත්, බෑග්, මේස ආදී පන්ති කාමරයේ ඇති සහ අවට පරිසරයෙන් ලබාගත හැකි ද්‍රව්‍ය කීපයක්.

**විෂය අන්තර්ගතය** ක්ෂණික ව සොයා ගත හැකි භාණ්ඩ උපයෝගී කර ගෙන ක්ෂණික නිරූපණ කිරීමට අවස්ථාව සලසා දීම.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 -

පිවිසීමඃ- ගුරුතුමා හෝ සිසුවෙක් විසින් අඩිකෝදුව, පෑන, පැන්සල, කොස්ස වැනි භාණ්ඩයක් යොදා ගෙන රූපණ අවස්ථාවක් කර පෙන්වීම.

- ★ රංගනයක දී යොදාගන්නා උපකරණ ''නාට්‍යෝපකරණ'' නම් වන බව පහදාදීම.
- ★ උපකරණ භාවිතය තුළින් රංගය වඩාත් තීව්‍ර වන බව පැහැදිලි කිරීම.
- ★ ක්ෂණික ව තෝරාගැනීමේ දී වඩාත් ම සමීප සමාන බවක් ඇති උපකරණ යොදාගැනීමෙන් පහසුවෙන් හා ක්ෂණික ව ප්‍රේක්ෂකයාට චරිතය හඳුනාගැනීමට හැකි වන අයුරු පෙන්වා දීම.
- ★ පරිහරණය කිරීමේ නිවැරදිතාව අනුව නාට්‍යෝපකරණය රංගනයට වඩාත් බද්ධ වන බව පැහැදිලි කිරීම.
- ★ එක ම භාණ්ඩය උපකරණ කීපයක් ලෙස ද යොදාගත හැකි බව පෙන්වීම.

උදාඃ- කෝදුව - කඩුවක් ලෙස, වේවැල ලෙස, වයලීන් ''බෝ'' එක ලෙස (අලුව ලෙස).
පෑන - සිරින්ජරයක් ලෙස, බටනළාවක් ලෙස
කොස්ස - හැරමිටිය ලෙස, රිටක් ලෙස

පියවර 02 -

- ★ ක්ෂණික නිරූපණ සඳහා විවිධ භාණ්ඩ අර්ථවත් ව යොදාගත හැකි බව පැහැදිලි කිරීම.
- ★ ද්‍රව්‍ය භාවිතයෙන් රංගය වඩාත් පහසු වන බව පසක් කරවීම.

★ ඕනෑම ද්‍රව්‍යයක් අවස්ථානුකූල ව රංග උපකරණයක් කරගත හැකි බව පෙන්වා දීම.

★ පරිකල්පන ශක්තිය මෙහෙයවා විවිධ භාණ්ඩ යොදාගෙන ක්ෂණික නිරූපණ කළ හැකි බව අවබෝධ කරවීම.

★ නිර්මාණාත්මක ව නාට්‍යෝපකරණ භාවිතය, ක්ෂණික නිරූපණයේ දී අත්‍යවශ්‍ය අංගයක් බව පැහැදිලි කර දීම.

පියවර 03 - ★ සිසුන් කණ්ඩායම් කීපයකට බෙදා (පන්තියේ සිසුන් ගණන අනුව කණ්ඩායමේ ගණන තීරණය කරන්න) ඔවුන්ට භාණ්ඩ අවශ්‍ය පරිදි තෝරා ගෙන ක්ෂණික නිරූපණ කිරීමට උපදෙස් දෙන්න.

★ කේවල ව හෝ සාමූහික ව රූපණය කිරීමට අවස්ථාව ලබාදෙන්න. (සියලු ම සිසුන් නියෝජනය වන පරිදි)

★ සියලු ම දෙනාට අනෙක් අයගේ රූපණ අවස්ථා නැරඹීමට අවස්ථාව දෙන්න.

★ ඒ ඒ රූපණයන් සාර්ථක හා අසාර්ථක වීමට හේතු සාකච්ඡා කිරීම සඳහා සිසුන් මෙහෙයවන්න.

★ සියලු ම සිසුන්ගේ කුශලතා අගයන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. රංග භාණ්ඩ උචිත ව යොදාගැනීම.
02. රංග භාණ්ඩ රංගනයට අදාළ කරගැනීම.
03. රංග භාණ්ඩ නිර්මාණාත්මක ව යොදාගැනීම.
04. පරිකල්පනයෙන් රංග භාණ්ඩ නිර්මාණය කිරීම.
05. සමස්ත රංගනය සාර්ථක කරගැනීම සඳහා භාණ්ඩ යොදා ගැනීම.

යන කරුණු ඇගැයීම සඳහා යොදා ගන්න.

**පැවරුම** විවිධ භාණ්ඩ විවිධ නාට්‍යෝපකරණ ලෙස යොදාගනිමින් ක්ෂණික නිරූපණ ඉදිරිපත් කරන්න.

**අතිරේක උදව්** නාට්‍ය වීඩියෝ පට, ආදේශ නාට්‍යෝපකරණ භාවිත කරමින් රූපණයේ යෙදෙන පින්තූර පත්‍රිකා ආදිය.

**නිපුණතාව 02** ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.7** දෛනික සිදුවීම් ආශ්‍රිත ක්ෂණික නිරූපණයන්හි යෙදෙයි.

**ක්‍රියාකාරකම** ජීවන අත්දැකීම් තුළින් ක්ෂණික නිරූපණ

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

- ★ දෛනික සිදුවීම්හි නාට්‍යමය ගුණය අඩංගු අවස්ථා කෙරේ අවධානය යොමු කරයි.
- ★ එවන් සිදුවීම් නාට්‍යමය නිර්මාණ සඳහා යොදාගත හැකි බව පිළිගනියි.
- ★ නිරූපණය තුළින් ජීවන අත්දැකීම් ලබයි.
- ★ රංගනයෙන් සහ නැරඹීමෙන් රස විඳී.

**ගුණාත්මක යෙදවුම්** පුවත්පත් වාර්තා

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - සිසුන් මුහුණ පෑ ජීවිතයේ විවිධ අවස්ථා පිළිබඳ විමසන්න.

පියවර 02 - සොම්නස් සහගත, දොම්නස් සහගත හා හාස්‍යමය අවස්ථා ආදී සුවිශේෂී අවස්ථාවන් දෛනික ජීවිතයේ දී අත්දකින බව සාකච්ඡා කරන්න.

(මංගල, අවමංගල, විභාග ජය, ත්‍යාග ලැබූ, සුරතලුන් අහිමි වූ....)

එවන් සුවිශේෂී අවස්ථා ක්ෂණික නිරූපණ මගින් ඉදිරිපත් කළ හැකි බව පහදා දෙන්න.

පියවර 03 - ක්ෂණික නිරූපණයක් යනු පෙර සූදානමකින් තොර ව ඉදිරිපත් කරන නිරූපණයක් බව ප්‍රකාශ කරන්න.

පියවර 04 - සුදුසු පරිදි කණ්ඩායම් කිරීම හා සාකච්ඡාවෙන් තෝරා ගත් අවස්ථා ලබා දෙන්න.

පියවර 05 - කණ්ඩායම් නිරූපණය ඉදිරිපත් කිරීම හා අනෙක් කණ්ඩායම් රස වින්දනය සඳහා යොමු කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. නාට්‍යෝචිත අවස්ථා සහිත සිදුවීම් හඳුනා ගැනීම.
02. අවස්ථා ප්‍රතිනිර්මාණය කිරීම.
03. ජීවන අත්දැකීම් නිරූපණය කිරීම.
04. කණ්ඩායම් නිරූපණය සාර්ථක ව කිරීමේ හැකියාව ලැබීම.
05. සංවර්ධනාත්මක ලෙස විවේචනය කිරීමේ හැකියාව ලැබීම.

යන කරුණු ඇගැයීම සඳහා යොදා ගන්න.

**පැවරුම** දෛනික ජීවිතයෙන් ලද අත්දැකීම් ඇසුරෙන් නාට්‍යෝචිත අවස්ථා පාදක කර ගත් ක්ෂණික නිරූපණ ඉදිරිපත් කිරීම.

**අතිරේක උදව්** පුවත්පත් වාර්තා
ප්‍රවෘත්ති (රූපවාහිනී හා ගුවන් විදුලි)

**නිපුණතාව 02** නාට්‍යමය ක්‍රියාකාරකම්හි නිරත වෙමින් නිර්මාණාත්මක හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.8** පරිකල්පනය පිබිදෙන ආකාරයේ විවිධ නිර්මාණ කාර්යයන්හි නිරත වෙයි.

**ක්‍රියාකාරකම** මනසින් නව ලොව දකිමු
නව නිමැවුම් බිහි කරමු

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**
- ⋆ පරිකල්පන මෙහෙයවා විවිධ නිර්මාණ කරයි.
- ⋆ නව නිර්මාණ කරයි.
- ⋆ නව නිර්මාණ පිළිබඳ ව තොරතුරු රැස් කරයි.
- ⋆ විවිධ නිර්මාණ ශිල්පීන් පිළිබඳ ව කරුණු රැස් කරයි.

**ගුණාත්මක යෙදවුම්** A-4 ප්‍රමාණයේ කඩදාසි

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 -
පිවිසීම
- ⋆ A-4 කඩදාසිවලින් නිර්මාණය කරන ලද අවානක්, බෝට්ටුවක්, කඩල ගොටුවක් වැනි සරල නිර්මාණ කීපයක් සිසුන්ට ඉදිරිපත් කරන්න.
- ⋆ එම සුලභ නිර්මාණවලට අමතර ව A-4 කඩදාසියක් උපයෝගී කර ගෙන කළ හැකි වෙනත් නිර්මාණ පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.

පියවර 02 - නිර්මාණකරණය සඳහා පරිකල්පනය හෙවත් මවාගැනීමේ ශක්තිය අවශ්‍ය බව පැහැදිලි කරන්න.
- ⋆ ඒ සඳහා පළමු ව මනසින් සූදානම් විය යුතු බව පහදන්න.
- ⋆ අලුත් දෙයක් නිර්මාණය කිරීමට නම් පවතින තත්ත්වයන් වෙනස් කළ යුතු බව පහදා දෙන්න.
- ⋆ ලෝකයේ විවිධ සාර්ථක නිර්මාණ කළ නිර්මාණකරුවන් ඔවුන්ගේ පරිකල්පන ශක්තිය සාර්ථක ලෙස මෙහෙයවා ඇති බව පෙන්වා දෙන්න.
- ⋆ වෙනත් අයකුගේ නිර්මාණයක් අනුකරණය නොකොට ස්වතන්ත්‍ර හැකියාව මතු කර ගැනීමට උපදෙස් දෙන්න.
- ⋆ එදිනෙදා ජීවිතයේ නිර්මාණකාරී ක්‍රියාවන් සඳහා පරිකල්පන ශක්තියේ ඇති අදාළ බව අවබෝධ කරවන්න.
- ⋆ නාට්‍යකරණයේ දී පරිකල්පනය වඩාත් වැදගත් වන බව පෙන්වා දෙන්න.

පියවර 03 -
- ⋆ සිසුන් සියලු ම දෙනාට A-4 කඩදාසිය බැගින් බෙදා දෙන්න.
- ⋆ එම කඩදාසි විවිධාකාරයෙන් වෙනස් කරමින් නිර්මාණ කිරීමට උපදෙස් දෙන්න.
- ⋆ එක් එක් අයගේ නිර්මාණ අන් අයට ද පෙන්වා ඒවා පිළිබඳ ව ඇගැයීමක් කරන්න.
- ⋆ වඩාත් හොඳ මට්ටමේ නිර්මාණවල ඇති ගුණාත්මක බව හා නිර්මාණාත්මක හැකියාව අගයන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. නවතාවකින් යුතුව නිර්මාණය කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කිරීම.
02. ගුණාත්මක බවකින් යුතුව නිර්මාණ ඉදිරිපත් කිරීම.
03. ප්‍රායෝගික වටිනාකමකින් යුතුව නිර්මාණය කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කිරීම.
04. නිර්මාණය සඳහා පරිකල්පනය මෙහෙයවීම.
05. සමස්ත නිර්මාණය සාර්ථක ව ඉදිරිපත් කිරීම.

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** පරිකල්පනය මෙහෙයවා විවිධ භාණ්ඩ නිර්මාණය කිරීමට සිසුන්ට පවරන්න. නිවසේ දී විවිධ නිර්මාණ සකස් කොට ගෙන ඒමට යොමු කරන්න.

**අතිරේක උදව්** විවිධ නිර්මාණ ඇතුළත් පොත් පත්‍රිකා.

**නිපුණතාව 02** ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.9** පරිසරය ආශ්‍රිත අත්දැකීම් ඇසුරු කොට සාමූහික ව කතාන්දර ගොතයි.

**ක්‍රියාකාරකම** පරිසරයෙන් කතා ලොවට

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

- ★ පරිසර අත්දැකීම් විස්තර කරයි.
- ★ එම අත්දැකීම් කතාන්දර ලෙස ඇසීමට ප්‍රිය කරයි.
- ★ සාමූහික ව කතන්දර ගෙතීමට පෙළඹෙයි.
- ★ නිර්මාණාත්මක කුසලතා සංවර්ධනය කරගනියි.

**ගුණාත්මක යෙදවුම්** පැරණි ජනකතා පොත්
ජනකතා දන්නා වැඩිහිටියෝ
ජනකතා ශ්‍රව්‍ය පට

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - සිසුන් විසින් මින් පෙර අසන ලද කතන්දර පිළිබඳ විමසන්න.
උදා:- තොප්පි වෙළෙන්දාගේ කතාව
හාවා සහ නරියා ලබු කිරිබත් පිසූ කතාව
හාවා සහ ඉබ්බා තරගයට දිව ගිය කතාව

- ★ දක්ෂ සිසුන් කීප දෙනෙකුට උක්ත කතාන්දර කීමට අවස්ථාව ලබා දීම.
- ★ මෙම සියලු කතාන්දර ගොඩ නැගීම සඳහා පාරිසරික අත්දැකීම් ඉවහල් වන බව සාකච්ඡා කරන්න.
- ★ එම කතාන්දර සියල්ලෙහි ම මුල මැද අග මනාව සංකලනයෙන් යුතු ව සිද්ධි ගළපා ඇති ආකාරය පෙන්වා දෙන්න.
- ★ ජනශ්‍රැතිය තුළ මෙබඳු කතාන්දර බහුල බව සිසු අත්දැකීම් ද පාදක කොට සාකච්ඡා කරන්න.
- ★ ජන සාහිත්‍යයේ මෙතෙක් බිහි වූ කතාන්දර ගොන්නට අලුත් කතාන්දර ගොඩ නගා එකතු කළ හැකි බව සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ★ බොහෝ කතාන්දරවලට පරිසරයේ ජීවත් වන සතුන් ද පාදක කොට ගෙන ඇති බව පෙන්වා දෙන්න.
- ★ පරිසරයේ ගස්වැල්, ගංගා, ඇළදොළ, වලාකුළු, මල්, ගේ දොර ආදී සියලු වස්තූන් උපයෝගී කොට ගනිමින් විවිධ කතාන්දර නිර්මාණය කළ හැකි බව සාකච්ඡා කරන්න.

පියවර 02 - පන්තියේ සිසුන් සියලු දෙනාට ම විවිධ පරිසර අත්දැකීම් ලැබෙන සේ පරිසරය නැරඹීමට අවස්ථා ලබාදෙන්න.

- ★ එම අත්දැකීම් පාදක කොට ගෙන කතාවක් නිර්මාණය කිරීමට අවස්ථාව ලබාදෙන්න.

★ එහි දී පන්තියේ සිසුන් කණ්ඩායම් කීපයකට බෙදා කණ්ඩායම් නිර්මාණයක් ලෙස ගොඩ නැගීමට අවස්ථාව ලබාදෙන්න.

උදා:- පරිසරයේ දී ගසක් උඩ සිටි ලේනකු තමාගේ කුඩුවෙන් වැටුණු පැටියකු කටින් ගෙන නැවතත් කුඩුවේ තැබීමට උත්සාහ දැරීම - කපුටෙක් ඒ දෙස බලා සිට පැටියා ඩැහැගැනීමට උත්සාහ දැරීම - අනිත් ලේනුන් හඬ නගා කෑ ගැසීම - කවුඩකු එතැනට පැමිණ කපුටාට කොටා පන්නා දැමීම.

★ සිසුන් ලද අත්දැකීම් ඇසුරින් හෝ ඇසූපිරූ අත්දැකීම් ඇසුරින් සිය නිර්මාණය සාර්ථක කර ගැනීමට අවස්ථාව ලබාදෙන්න.

පියවර 03 - ළමයින් විසින් ගොඩනගන ලද කතාන්දර කණ්ඩායම් වශයෙන් ලියන්නට අවස්ථාව ලබාදෙන්න.

★ එය කණ්ඩායමේ සියලු දෙනාට ම ඇසෙන සේ කියවීමට අවස්ථාව ලබාදෙන්න.

★ එය අසා සිට කතාන්දරය මතකයෙන් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදීම.

★ සෙසු කණ්ඩායම්වලට එම කතාන්දරයේ ඇති සාර්ථක අසාර්ථක තැන් විමසීමට අවස්ථාව ලබාදෙන්න.

★ සියලු ම කණ්ඩායම්වල ක්‍රියාකාරකම් අවසන් වූ පසු ''කතාන්දර සංග්‍රහයක්'' සකස් කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. පාරිසරික අත්දැකීම් නිරීක්ෂණය කිරීමේ හැකියාව ලැබීම.
02. එම අත්දැකීම් ප්‍රකාශ කිරීම.
03. අත්දැකීම් ඔස්සේ කතාන්දර ගොඩනැගීම.
04. ගොඩනගන ලද කතාන්දර ලිඛිත ව සකස් කිරීම.
05. ලියන ලද කතාන්දර කතා සංග්‍රහයක් ලෙස සකස් කිරීමේ හැකියාව ලබයි.

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** ★ පහත සඳහන් පරිසර අත්දැකීම් පාදක කොටගෙන කතාන්දර ගොඩනගන්න.

1. කුඹුරක් මැද සිඳෙමින් පවතින දිය වළක් - මාළු දෙදෙනෙක් - කක්කුට්ටෙක් - දියවළ දෙස බලා සිටින - කොකෙක්.
2. කැලයක අඹ ගසක් - අත්තක කුඩුවක් - කුරුලු පැටවුන් දොරට වඩින දවසක් - ගස යට තුඹසක් - ඉන් එළියට එන නාගයෙක් - කුරුලු මවගේ හැඬීමක් - තුඹස අසලට එන මුගටියෙක්.
3. පූසෙක් - කේක් කෑල්ලක් - බල්ලෙක් - කේක් කෑල්ලට මාන බලන කපුටෙක් - රැවටීමක්.
4. මඩ වළක නෙලුමක් - මී මැස්සෙක් - නිල මැස්සෙක් - සමනලයෙක් - මල් නෙළන ළමයෙක්.

**අතිරේක උදව්**

★ පරිසරය නැරඹීමේ චාරිකා
★ පැරණි ජනකතා පොත්
★ යහළු යෙහෙළියන්ගේ අත්දැකීම්
★ කතාන්දර දන්නා වැඩිහිටියන්

**නිපුණතාව 02** ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.10** ජනකතා පරිශීලනයෙන් පරිකල්පනය මෙහෙයවා නව නිර්මාණ-කරණයෙහි යෙදෙයි.

**ක්‍රියාකාරකම** පැරණි ජනකතා, නව අර්ථකථන සහිත ව ප්‍රතිනිර්මාණය කිරීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

- ★ ජනකතා කියවයි.
- ★ ජනකතා නව අර්ථයක් සහිත ව ප්‍රති නිර්මාණය කරයි.
- ★ තත්කාලීන සමාජ ගැටලු විසඳීමට උපක්‍රමශීලී වෙයි.
- ★ ජනකතාවලින් මතු වන යටිපෙළ අරුත් විමසයි.
- ★ දේශීය මෙන් ම විදේශීය ජනකතා එක් රැස් කරයි.

**ගුණාත්මක යෙදවුම්** ජනකතා සංග්‍රහ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - අතීතයේ විසූ ජනතාව අතරින් බිහි වී මුඛ පරම්පරාගත ව ජනකතා ආරක්ෂා වී ඇති බව හා මතු පරම්පරාවේ දැනගැනීම උදෙසා ඒවා ආරක්ෂා කරගත යුතු බව පවසන්න.

වර්තමාන සමාජ ගැටලුවලට විසඳුම්, ජනකතා පාදක නව නිර්මාණවලින් ඉස්මතු කරගත හැකි බව ප්‍රකාශ කරන්න.

පියවර 02 - පැරණි ජනකතාවල දෘෂ්ටිය නව ලෝකයේ සමාජ ප්‍රශ්නවලට ගැළපෙන පරිදි ආදේශ කරමින් ජනකතා ප්‍රබන්ධ කළ හැකි බව පවසමින් එකිනෙකා වෙත, ජනකතා තෝරා ගැනීමට මූලාශ්‍රය සපයන්න.

තෝරා ගත් ජනකතා කීපයක් සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවකට ම ලබා දීමට කටයුතු කරන්න.

තනි තනි ව නව අර්ථකථන සහිත ව කතන්දර ලිවීමට කාලය වෙන් කරදෙන්න.

නාට්‍යෝචිත ව, නව අර්ථ ගැන්වීම් සහිත ව ජනකතා ප්‍රතිනිර්මාණය කර, අගය කරන්න. (නිපුණතා 1.1 ට අදාළ ජනකතා පාදක කර ගත හැකි ය.)

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. ජනකතාවකට ආවේණික භාෂා ශෛලිය හඳුනා ගැනීමේ හැකියාව ලැබීම.
02. නව අර්ථකථන එක් කිරීමේ හැකියාව ලැබීම.
03. යටි පෙළ හඳුනා ගැනීම.
04. එමගින් තත්කාලීන සමාජ ගැටලු හා ප්‍රතිකර්ම හඳුනා ගැනීම.
05. ජනකතා එක්රැස් කිරීම.

යන කරුණු ඇගැයීම සඳහා යොදා ගන්න.

**පැවරුම** පැරණි ජනකතා, නව අර්ථකථන සහිත ව යටිපෙළ අරුත් මතු වන සේ ද තත්කාලීන සමාජ ගැටලු හා ප්‍රතිකර්ම ඇතුළත් වන සේ ද ප්‍රතිනිර්මාණය කර ලිවීම හා ජනකතා (දේශීය හා විදේශීය වශයෙන්) එක්රැස් කරවීම.

**අතිරේක උදව්**

- ★ දේශීය හා විදේශීය ජනකතා සංග්‍රහ
- ★ ශ්‍රී ලංකාවේ ජනකතා එකතුව - එස්. විජේසූරිය
- ★ වයඹ ජනකතා - ප්‍රධාන අමාත්‍යාංශය, සංස්කෘතික අංශය
- ★ ජනකවි ආශ්‍රිත ජනකතා - නෝමන් සිරිපාල

**නිපුණතාව 02** ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.11** අපතේ යන ද්‍රව්‍ය සහ ස්වාභාවික පරිසරය ආශ්‍රිත ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගෙන නිර්මාණ කරයි.

**ක්‍රියාකාරකම 2.11.1** මුහුණු හදමු

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

- ⋆ සරල වෙස් මුහුණු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හඳුනා ගනී.
- ⋆ වෙස් මුහුණු නිර්මාණයේ දී සැලකිය යුතු කරුණු අධ්‍යයනය කරයි.
- ⋆ සත්ත්ව චරිත සඳහා ද වෙස් මුහුණු සකස් කරන අයුරු පැහැදිලි කරයි.
- ⋆ සරල වෙස් මුහුණු නිර්මාණය කරයි.
- ⋆ රූපණය සඳහා වෙස් මුහුණු භාවිත කරයි.

**ගුණාත්මක යෙදවුම්** පුවක් කොළපත්, තේක්ක කොළ, පර කොළ (දියපර කොළ), පොල් මටුලු/බූ මටුලු, වාර්නිෂ්, උණ කොළපු (හොඳින් බූව ඉවත් කරන ලද), කැපෙන පිහියක්, රබර් පටි, ගංදෙල් කොළ (වල් දෙල්, කැළෑ දෙල්), කාඩ්බෝඩ්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - වෙස් මුහුණක් පැලඳි සිසුවකු පන්තිය ඉදිරියට පැමිණවීම හෝ වෙස් මුහුණක් පැලඳ රඟන අයකුගේ පින්තූරයක් පෙන්වමින් පාඩමට පිවිසෙන්න.

- ⋆ වෙස් මුහුණක් යනු කුමක් දැයි සිසුන් සමග සාකච්ඡා කිරීම. බාහිර සමාරෝපයේ දී වෙස් මුහුණු භාවිත වන නාට්‍ය පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කරන්න.

පියවර 02 -

- ⋆ වැඩි වියදමකින් තොර ව පරිසරයෙන් ලබා ගත හැකි ද්‍රව්‍ය හා ඉවත ලන ද්‍රව්‍යවලින් වෙස් මුහුණක් නිර්මාණය කිරීම සඳහා අමුද්‍රව්‍ය ලෙස භාවිත කළ හැකි බව වටහා දෙන්න.
- ⋆ අමුද්‍රව්‍ය රැස් කරවන්න.

පියවර 03 -

- ⋆ සියලු ම සිසුන් ලවා විවිධ අමුද්‍රව්‍ය යොදා වෙස් මුහුණු නිර්මාණය කරවන්න.
- ⋆ එක් එක් අයගේ වෙස් මුහුණුවල අගය කළ යුතු සහ සංවර්ධනය විය යුතු අංශ පැහැදිලි කරදෙන්න.
- ⋆ වෙස් මුහුණු පැළඳ රංගනය කරවන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. අමුද්‍රව්‍ය හඳුනා ගැනීම.
02. වෙස් මුහුණු නිර්මාණය කිරීම.
03. චරිතයන්ට ගැළපෙන ලෙස නිර්මාණය කිරීම.
04. නිර්මාණාත්මක බව පිළිබඳ අවධානය යොමු කිරීම.
05. සමස්ත නිමාව ඇගැයීම.

යන කරුණු ඇගැයීම සඳහා යොදාගන්න.

| | |
|---|---|
| **පැවරුම** | කණ්ඩායම් කීපයකට බෙදා විවිධ ද්‍රව්‍ය යොදා ගෙන විවිධාකාරයේ වෙස් මුහුණු නිර්මාණය කොට කුඩා රංගන අවස්ථා සඳහා යොදා ගැනීමට පවරන්න. |
| **අතිරේක උදව්** | ★ විවිධ වෙස් මුහුණුවල පින්තූර<br>★ වෙස් මුහුණු පැළඳ රංගනයෙහි යෙදෙන ශිල්පීන්ගේ රංගන අවස්ථා දක්වෙන වීඩියෝ පට හෝ පින්තූර<br>★ ''නරිබෑණා'' නාට්‍යයේ නරියා, ''එලොව ගිහින් මෙලොව ආවා'' නාට්‍යයේ අශ්වයා වැනි සත්ත්ව චරිතවල පින්තූර. |

**නිපුණතාව 02** ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.11** අපතේ යන ද්‍රව්‍ය සහ ස්වාභාවික පරිසරය ආශ්‍රිත ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගෙන රංගා'භරණ නිර්මාණ කරයි.

**ක්‍රියාකාරකම 2.11.2** වළලු මාල මුදු කරාබු ඔටුණු
අපිම සදා පළඳා අපි රඟමු

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

- ★ රංගනයේ දී පැලඳීම සඳහා අවශ්‍ය ආභරණයක් සෑදීමට අවශ්‍ය අමුද්‍රව්‍ය හඳුනා ගනී.
- ★ රංගාභරණයක් නිර්මාණය කරන අයුරු ප්‍රකාශ කරයි.
- ★ ආභරණයක් නිර්මාණයේ දී සැලකිල්ලට ගත යුතු කරුණු පැහැදිලි කරයි.
- ★ වළලු, මාල, කරාබු වැනි සරල ආභරණ නිර්මාණය කරයි.
- ★ ආභරණ පැලඳ විවිධ චරිත රංගනයේ යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්** කිරිඳි, ඔළිඳ, රබර්, සියඹලා, දොඹ, පුස්, මදටිය වැනි සුදුසු ඇට වර්ග. මඤ්ඤොක්කා බඩ, නූල්, ඉදිකටු, කම්බි, ගම් වර්ග, වර්ණ (ලැකර්), රන්, රිදී පැහැති කුඩු.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - ආභරණ පලඳා රඟන රූපණ ශිල්පීන්ගේ පින්තූර කීපයක් පන්තිය ඉදිරියේ ගෙන හැර දක්වන්න.

එම පින්තූරවල නළුනිළියන් පලඳා ඇති රංගාභරණ පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.

පියවර 02 - රංගාභරණ හා වෙනත් සාමාන්‍ය ආභරණ අතර ඇති වෙනස පැහැදිලි කොට, ආභරණයක් නිර්මාණය සඳහා ගත හැකි අමුද්‍රව්‍ය පෙන්වා දෙන්න.

(කලින් දින පාඩමට සූදානම් වීම සඳහා සිසුන් ලවා ගෙන්වන ලද)

- ★ ප්‍රමාණයෙන් විශාල විය යුතු බව.
- ★ වර්ණවත් විය යුතු බව.
- ★ කල් පැවතිය හැකි බව.
- ★ පහසුවෙන් පැලඳීමට හා ඉවත් කිරීමට හැකි බව ආදී වූ කරුණු අවධාරණය කරන්න.

පියවර 03 - ගුරුවරයා විසින් මාලයක්, වළල්ලක්, නලල් පටක් නිර්මාණය කරන අයුරු පෙන්වා දෙන්න. (ගුරුවරයාට අභිමත පරිදි ඕනෑම ආභරණයක්)

- ★ සිසුන් ලවා විවිධ ආභරණ නිර්මාණය කරවීම.
- ★ සිසුන්ගේ නිර්මාණ පන්තියේ ඉදිරියට ගෙන සියලු ම දෙනාට ප්‍රදර්ශනය කොට ඒවායේ ගුණාත්මක බව, කල්පැවැත්ම, නිමාව පිළිබඳ ව අවබෝධයක් ලබා දී සාර්ථක නිර්මාණ අගය කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. ද්‍රව්‍ය තෝරා ගැනීමේ නිවැරදි බව මත රංගාභරණ නිමවීම.
02. කල් පැවැත්ම හා උචිත බවින් යුතුව නිර්මාණය කිරීම.
03. නිර්මාණාත්මක බව.
04. පහසුවෙන් පැළඳීමට හා ගැලවීමට හැකි ලෙස නිර්මාණය කිරීම.
05. සමස්ත නිමාව.

යන කරුණු ඇගැයීම සඳහා යොදා ගන්න.

**පැවරුම** විවිධ අමුද්‍රව්‍ය යොදා ගෙන කිසියම් රංගාභරණයක් නිර්මාණය කිරීමට පවරන්න.
මාලයක්, කරාබු දෙකක්, නලල් පටක්, වළලු

**අතිරේක උදව්** ආභරණ පැළඳි රජ කුමරියකගේ හා රජතුමකුගේ පින්තූරයක්. (මනමේ කුමරිය හා කුමරු වැනි)
රංගාභරණ පැළඳි නළුවන් රංගනයෙහි යෙදෙන නාට්‍ය දර්ශන කීපයක වීඩියෝ පට.

**නිපුණතාව 02** ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.12** ජනකතාවක ඇති නාට්‍යෝචිත අවස්ථා තෝරාගනියි.

**ක්‍රියාකාරකම** ජනකතා ඇසුරින් රූපණයට

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

- ජනකතන්දරවල නාට්‍ය රසයක් ඇති බව ප්‍රකාශ කරයි.
- නාට්‍යෝචිත අවස්ථා තෝරා ගනියි.
- නව අර්ථකථනයක් සහිත ව නිරූපණය කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිපුණතා 1.1 පාඩමට අදාළ ජනකතා උපුටා ගැනීම.
- දේශීය හා විදේශීය ජනකතා සංග්‍රහ.
- ශ්‍රී ලංකාවේ ජනකථා එකතුව - එස්. විජේසූරිය
- ජනකවි ආශ්‍රිත ජනකතා.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - 1.1 පාඩමට අයත් ජනකතා නැවත සිහිපත් කරන්න.

පියවර 02 -

- සෑම කතන්දරයක් ම නාට්‍යය සඳහා උචිත නොවන බව පවසමින්, එම කතන්දරවල ඇති නාට්‍යයට උචිත අවස්ථා තෝරා ගැනීමට පොළඹවන්න.
- ''බුදුන් වඳින ලෙස වැඳපන් අම්මාට'' කතාව ඇසුරු කොට නාට්‍යෝචිත අවස්ථා තෝරා ගැනීමට සහාය වන්න.
- තිසි වයසට පත් දෙදෙනාට භාර්යාවන් දෙදෙනකු කැඳවා ගෙන ඒම, දිළිඳු බවට පත් මව, කෑමට යමක් ඉල්ලා පොහොසතෙක් වූ බාල පුතාගේ නිවෙසට යාම, බාල පුතුගේ භාර්යාවගේ නපුරු ගතිගුණ, කුසගින්නට බත් දෙනවා වෙනුවට සහල්වත් නොදී මැන, වී ලබා දීමත්, නැන්දණියව දෝෂ දර්ශනයට ලක් කිරීමත්, බාල පුතා ද භාර්යාවට පක්ෂ වීමත්, ලොකු පුතාගේ මැදිහත් වීම සහ කරුණු අවබෝධ කරවන්න.

  කතාවේ පෙලගැස්වීමට එසේ වුවත් අවශ්‍ය පරිදි නව අර්ථ ගැන්වීමකින් යුතු ව නිර්මාණය කළ හැකි ය. ඒ අනුව ලේලියගේ ක්‍රියාව පිටු දකිමින් පුතා විසින් තම මව වෙත පියා නොමැතිව තමා හා සොහොයුරා හොඳින් හදාවඩා ගැනීමට දැරූ උත්සාහය, විඳ දරාගත් දුක් කම්කටොලු පහදා දීම, බිරිඳ ගේ හා මව ගේ ගුණයහපත්කම් ද පවසමින් මවට සැලකීමට බිරිඳ යොමු කළ හැකි බව පවසන්න.

පියවර 03 -

- සිසුන් කණ්ඩායම් කරන්න.
- එක් එක් කණ්ඩායමට ජනකතාවක් බැගින් පවරන්න.
- නාට්‍යෝචිත අවස්ථා තෝරා ගැනීමට උපදෙස් දෙන්න.
- නව අර්ථකථන සහිත ව නිරූපණයට අවස්ථාව ලබා දෙන්න.
- සාකච්ඡාවට බඳුන් කර අගයන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. නාට්‍යෝචිත අවස්ථා තෝරා ගැනීම.
02. රූපණ කාර්යයෙහි සාර්ථකත්වය විමසීම.
03. උචිත ආනුෂංගික ශිල්ප භාවිත කිරීම.
04. ජනකතාවක ලක්ෂණ ඉස්මතු කිරීම.
(භාෂා රටාව, ඇඳුම් පැළඳුම් ආදී)
05. නව අර්ථකථන සහිත ව නාට්‍ය නිර්මාණය කිරීම.
යන කරුණු ඇගැයීම සඳහා යොදා ගන්න.

**පැවරුම**

තෝරා ගත් ජනකතාවන්හි නාට්‍යෝචිත අවස්ථා, නව අර්ථකථන සහිත ව නිරූපණ කාර්යයෙහි නිරත වීම.

**අතිරේක උදව්**

- දේශීය හා විදේශීය ජනකතා සංග්‍රහ
- ශ්‍රී ලංකාවේ ජනකතා එකතුව - එස්. විජේසූරිය
- වයඹ ජනකතා
- ජනකවි ආශ්‍රිත ජනකතා

**නිපුණතාව 02** ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.13** නිර්මාණාත්මක හැකියා වර්ධනය කරයි.

**ක්‍රියාකාරකම 2.3.1** ජනකතා ඇසුරින් සරල නාට්‍ය පෙළක් රචනා කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

- ★ ජනකතාවලින් නාට්‍යෝචිත අවස්ථා තෝරා ගනී.
- ★ උචිත පරිදි නාට්‍යෝචිත අවස්ථා පෙළ ගස්වයි.
- ★ රංග විධාන සහිත ව නාට්‍ය පෙළ සැලසුම් කරයි.
- ★ සාමූහික ව එක්ව නාට්‍ය පෙළ රචනා කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- ★ ජනකතා පොත්.
- ★ ජනකතා දන්නා වැඩිහිටියන්.
- ★ පටිගත කරන ලද ජනකතා.
- ★ ජනකතා ඇසුරින් ගොඩනගන ලද නාට්‍ය පිටපත් කීපයක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 -

- ★ පළමුව සිසුන් කණ්ඩායම් කර ජනකතා කීපයක් ඔවුන් අතර බෙදා දී ඒවා කියවා ගැනීමට සලස්වන්න.
- ★ එම කථාවල සිද්ධි පෙළ ගැසී ඇති අන්දම ශිෂ්‍යයින් සමග සාකච්ඡා කරන්න.
- ★ කතාවක සිද්ධි පෙළ ගැසී ඇති අන්දමට වඩා නාට්‍යයක සිද්ධි පෙළ ගැසී ඇති ආකාරයේ යම් වෙනසක් ඇති බව නාට්‍යයක් තුළින් පැහැදිලි කරදෙන්න.

  උදා:- එලොව ගිහින් මෙලොව ආවා, රතු හැට්ටකාරි
- ★ එම නාට්‍යයන්ට අදාළ ජනකතා දන්නා සිසුන් මගින් පන්තියට ඉදිරිපත් කරවන්න.
- ★ ඉන්පසු නාට්‍ය පිටපත් ද ගෙන එක් එක් චරිතවලට අදාළ සංවාද භාවිත කරමින් නාට්‍ය පිටපත කියවීමට සලස්වන්න.
- ★ එහි දී ජනකතාවත් නාට්‍ය පෙළත් අතර ඇති වෙනස පැහැදිලි කරදෙන්න.
- ★ නාට්‍ය පෙළෙහි ඇති නාට්‍යෝචිත අවස්ථා හා රංග විධාන පෙන්වා දෙමින් ජනකතාව නාට්‍ය පෙළක් බවට සැකසී ඇති අන්දම සාකච්ඡා කරන්න.

පියවර 02 - ශිෂ්‍යයන් කණ්ඩායම් කර එක් එක් කණ්ඩායම්වලට ජනකතාව බැගින් ලබාදෙන්න.

- ★ පියවර 01 හි දී පැහැදිලි කළ ආකාරයට නාට්‍යෝචිත අවස්ථා ගොනු කර නාට්‍ය පෙළක් රචනා කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- ★ සෑම කණ්ඩායමක් ම පෙළ රචනා කළ පසු එක් එක් පෙළට අදාළ භූමිකාවලට අනුව සංවාද භාවිත කරමින් පෙළ කියවන්න.

- ⋆ එක් එක් කණ්ඩායම්වලට අදාළ නාට්‍ය පෙළ සියල්ල කියවමින් ඒවායේ සාර්ථක අසාර්ථක තැන් විග්‍රහ කරමින් සිසුන් ලියන ලද නාට්‍ය පෙළ ඇගයීමට ලක් කරන්න.

පියවර 03 - ලියන ලද නාට්‍ය පෙළ සියල්ල කණ්ඩායම් මාරු කරමින් පෙළ කියැවීමට සැලැස්වීම හා කණ්ඩායමේ සියලුම ශිෂ්‍යයින්ට එම නාට්‍ය පෙළ ලියා ගැනීමට අවස්ථාව ලබාදෙන්න.

- ⋆ මෙහි දී එම නාට්‍ය පෙළ ශිෂ්‍යයින්ගේ නිර්මාණාත්මක ස්වභාවය අනුව වෙනස් කර ලිවීමට හැකියාව ඇති බව පෙන්වා දීම හා ඊට අවස්ථාව ලබාදෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. කණ්ඩායමට ලබා දී ඇති ජනකතාවෙහි ඇති නාට්‍යෝචිත අවස්ථා තෝරා ගැනීමේ හැකියාව ලැබීම.
02. එම නාට්‍යෝචිත අවස්ථා සඳහා යොදා ගන්නා චරිතවලට ගැළපෙන සේ සංවාද ගොඩ නැගීමේ හැකියාව ලැබීම.
03. නාට්‍යෝචිත අවස්ථා නිසි රංග වින්‍යාසයකින් යුතු ව සකස් කිරීමේ හැකියාව ලැබීම.
04. සාමූහික කාර්යයක් ලෙස පෙළ ලියා අවසන් කිරීමේ හැකියාව ලැබීම.
05. පෙළට අදාළ රංග විධානයන් මැනවින් භාවිත කිරීමේ හැකියාව ලැබීම.

යන කරුණු ඇගැයීම සඳහා යොදා ගන්න.

**පැවරුම** පහත සඳහන් ජනකතා ඇසුරෙන් නාට්‍ය පෙළ රචනා කරන්න.

01. තොප්පි වෙළෙන්දා
02. ගමරාළ දිව්‍ය ලෝකෙ ගිය හැටි
03. පුහුල් හොරා කරෙන් දැනේ
04. අබරං සිල් ගත්ත වගේ
05. පරංගියා කෝට්ටේ ගියා වගේ

**අතිරේක උදව්**

- වෙල්ල වැහුං, රතු හැට්ටකාරි ආදී ජනකතා ඇසුරෙන් නිර්මාණය කරන ලද නාට්‍ය පිටපත් කීපයක් හෝ දෘශ්‍ය පට (DVD)
- ජනකතා කීපයක් / ජනකතා සංග්‍රහය
- ජනකතා දන්නා සම්පත් පුද්ගලයන්ගෙන් ජනකතා ශ්‍රවණය කිරීම.

**නිපුණතාව 02** ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.13** නිර්මාණාත්මක හැකියා වර්ධනය කරයි.

**ක්‍රියාකාරකම 2.13.2** නාට්‍ය පෙළ රංගයක් බවට පත් කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

- ★ නාට්‍ය පෙළක් තෝරා ගනියි.
- ★ එම පෙළ මැනවින් අධ්‍යයනය කරයි.
- ★ පෙළෙහි දක්වෙන භූමිකා සඳහා ගැළපෙන නළු නිළියන් තෝරා ගනියි.
- ★ ආනුශංගික කලා නිර්මාණය කරයි.
- ★ රංග විධාන සැලසුම් කරයි.
- ★ නාට්‍ය පෙළ රංගයක් බවට පත් කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- ★ වේදිකා නාට්‍ය නැරඹීමේ අවස්ථා ලබා දීම.
- ★ වේදිකා නාට්‍ය දෘශ්‍ය පට (DVD)

**ඉගැනුම්ඉගැන්වීම් ක්‍රියාවලිය**

පියවර 01 -

- ★ 2.13.1 පාඩමේ දී ලියන ලද නාට්‍ය පෙළ සියල්ල අතරින් වඩාත් සාර්ථක නාට්‍ය පෙළ තෝරාගන්න.
- ★ තෝරා ගත් නාට්‍ය පෙළ සඳහා නළු නිළියන් තෝරාගන්න.
- ★ මෙහි දී කණ්ඩායම් සියල්ල පොදුවේ සලකා බලා වඩාත් සාර්ථක ව රංගන දායකත්වය ලබා දිය හැකි සිසුන් සුවිශේෂ භූමිකා රංගන සඳහා යොදාගන්න.
- ★ සිසුන් අතරින් අනෙකුත් ආනුෂංගික කලා නිර්මාණය කළ හැකි සිසුන් ඒ සඳහා යොදාගන්න.
- ★ සමස්ත රංගය සඳහා සියලු සිසුන්ගේ දායකත්වය ලබාගන්න.
- ★ මෙහි දී සිසුන් කණ්ඩායම් කීපයකට බෙදා ආනුෂංගික කලා නිර්මාණය කිරීමට අවස්ථාව ලබාදෙන්න.

  උදා:- A - කණ්ඩායම - රංග වස්ත්‍ර
  B - කණ්ඩායම - රංග භාණ්ඩ
  C - කණ්ඩායම - පසුතල
  D - කණ්ඩායම - වේෂ නිරූපණය
  E - කණ්ඩායම - ආලෝකකරණය

පියවර 02 - උක්ත සියල්ල සකස් කොට අවසන් වූ කල්හි පාසල් වේදිකාව ප්‍රයෝජනයට ගෙන නාට්‍ය පෙළ රඟ දක්වන්න.

- ★ පාසලේ නාට්‍ය හා රංගකලාව විෂය ඉගෙන ගන්නා සිසුන් නරඹන්නන් ලෙස යොදාගන්න.
- ★ නාට්‍ය අවසානයේ ශිෂ්‍ය සහභාගිත්වය ඇති ව රංගනය කළ නාට්‍යයේ සාර්ථක අසාර්ථක තැන් පිළිබඳ විමසන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. රංගය සඳහා සුදුසු නාට්‍ය තෝරා ගැනීම.
02. ඒ සඳහා සුදුසු නළු නිළියන් තෝරා ගැනීම.
03. රංගය සඳහා සුදුසු ආනුෂංගික අංග සැලසුම් කිරීම.
04. රංගනයට ගැළපෙන පරිදි ආනුෂංගික අංග නිර්මාණය කිරීම.
05. නාට්‍ය පෙළ සාර්ථක ව රංගයක් බවට පත් කිරීම.

යන කරුණු ඇගැයීම සඳහා යොදාගන්න.

**පැවරුම** 2.13.1 පාඩමේ දී නිර්මාණය කරන ලද නාට්‍ය පෙළ - රංගය බවට පත් කිරීම.

**අතිරේක උදව්**

- සාර්ථක නාට්‍ය නිර්මාණ.

| | |
|---|---|
| **නිපුණතාව 03** | නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි. |
| **නිපුණතා මට්ටම 3.1** | තෝරා ගත් නාට්‍ය පෙළක් පිළිබඳ ව අවබෝධයෙන් යුතුව සංවාදයෙහි යෙදෙයි. |
| **ක්‍රියාකාරකම** | අවබෝධයෙන් යුතු ව දෙබස් කියවමු. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | 02 |

**ඉගැනුම් පල**

- ★ විවිධ ස්වභාවයන් හඳුනාගෙන ඒ අනුව උච්චාරණය කරයි.
- ★ අවස්ථාවෝචිත පරිදි සංවාද භාවිත කරයි.
- ★ අදහස් ප්‍රකට වන අයුරින් සංවාද භාවිත කරයි.
- ★ ස්වාධීන අදහස් ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- ★ වේදිකා නාට්‍ය නැරඹීමේ අවස්ථා ලබා දීම.
- ★ වේදිකා නාට්‍ය දෘශ්‍ය පට (DVD)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 -

- ★ නිර්දිෂ්ට නාට්‍ය පෙළෙහි ගද්‍යමය සංවාද ඛණ්ඩ සහිත කොටසක් තෝරා ගන්න.
- ★ සිසුන් ලවා පළමු ව පාඩමක් කියවන ආකාරයෙන් ද දෙවනු ව නාට්‍යානුසාරී ලෙස සංවාද උච්චාරණය කිරීමට යොමු කරවමින් ද පිටපතෙහි තෝරාගත් කොටසක් කියවන්න.
- ★ පිටපතේ චරිත සඳහා සිසුන් කිහිප දෙනකු යොදා ගෙන සංවාද කියවන්න.
- ★ කියවන ලද කොටස ඇසුරෙන් නාට්‍ය පිටපතක ඇති චරිත, සිදුවීම්, අවස්ථා සහ ඊට සම්බන්ධ සංවාද පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- ★ නාට්‍ය පිටපතක විවිධ චරිත තිබීම සහ එම චරිත අතර සංවාද ඇති වන බවත්, සංවාද ඇති වීමට චරිත දෙකක් හෝ ඊට වැඩි ගණනක් සහභාගී විය යුතු බවත් සාකච්ඡා කරන්න.
- ★ සංවාද මගින් විවිධ හැඟීම් ප්‍රකාශ කෙරෙන අතර, සිදුවීම්, අවස්ථා සහ ඊට සම්බන්ධ සංවාද පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- ★ පිටපතේ කියවන ලද කොටසේ සංවාද, එම අවස්ථාවේ ස්වරූපයට අනුකූල වන අයුරු පෙන්වා දෙන්න.

පියවර 02 -

- ★ සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න.
- ★ ඉහත නාට්‍ය පෙළ තෝරා ගෙන එහි පිටපතක් බැගින් එක් කණ්ඩායමකට ලබා දෙන්න.
- ★ ඒ ඒ කණ්ඩායමට නාට්‍ය පිටපතේ එකිනෙකට වෙනස් ස්ථාන හතරකින් කොටස් තෝරා දෙන්න.
- ★ කණ්ඩායමක එක් එක් සිසුන්ට විවිධ චරිත ලැබෙන සේ පිටපතේ එන චරිත වෙන් කර ගැනීමට කටයුතු යොදන්න.
- ★ පන්තියේ ප්‍රමාණය අනුව කියැවීමට දෙන කොටස තීරණය කරන්න. සිසුන් ප්‍රමාණය අනුව ලබා දෙන කොටසට අයත් දෙබස් ප්‍රමාණය අඩු-වැඩි වශයෙන් තෝරා දෙන්න.

* දෙන ලද පෙළ කොටසෙහි සංවාද කියැවීමේ දී ඒවා අවබෝධයෙන් යුතු ව ද අවස්ථෝචිත හැඟීම් ප්‍රකාශ වන අයුරින් ද ඉදිරිපත් කරවන්න.

පියවර 03 -

* විවිධ දෙබස් කියවූ කණ්ඩායම්වල ඉදිරිපත් කිරීම් පිළිබඳ ව ඒ ඒ කණ්ඩායම්වලට මෙන් ම අනෙකුත් කණ්ඩායම්වලට ද තම අදහස් ප්‍රකාශ කිරීමට සලසන්න.
* විවිධ අදහස් ප්‍රකාශ වන සංවාද විවිධ ආකාරයෙන් ඉදිරිපත් විය යුතු බව පෙන්වා දෙන්න.
* නාට්‍යයේ පෙළත්, අදාළ සංවාද කොටස් අයත් වන අවස්ථාවේ ස්වභාවයත්, එම අවස්ථාවේ දී හැසිරෙන විවිධ චරිතවල ස්වරූපයත් පිළිබඳ අවබෝධයෙන් යුතු ව සංවාද ඉදිරිපත් කරවන්න.
* නියම ආකාරයෙන් ම අදහස් ප්‍රකාශ වන පරිදි සංවාද ඉදිරිපත් කිරීම මගින් නාට්‍යයේ නියම රසය මතු වන බව, ඉදිරිපත් කිරීම් ඇසුරෙන් පෙන්වා දෙන්න.
* ඉතාමත් හොඳින් සංවාද භාවිත කරන සිසුන් ඇගයීමට ලක් කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. අවස්ථාවේ ස්වභාවයට අනුකූල වීම.
02. සංවාද නාට්‍යෝචිත අයුරින් උච්චාරණය කිරීම.
03. සංවාදවල මනෝභාවික අවධාරණයත්, පිටපතෙහි ඇති අවස්ථාවට උචිත වන අයුරින් යොදා ගැනීම.
04. ස්වාධීන ව තම අදහස් පළ කිරීමේ හා ඉදිරිපත් කිරීමේ හැකියාව ලැබීම.

යන කරුණු ඇගැයීම සඳහා යොදා ගන්න.

**පැවරුම**

නිර්දිෂ්ට පිටපතකින් කෙටි සංවාද ඛණ්ඩය බැගින් එක් එක් කණ්ඩායමට ලබා දී එම සංවාද අයත් වන්නේ නාට්‍යයේ කුමන අවස්ථාවකට ද යන්නත් එම අවස්ථාවේ ස්වරූපය පිළිබඳවත් වාක්‍ය 5ක පමණ විස්තරයක් ලියවන්න. නැතහොත් කණ්ඩායම ලවා ඉදිරිපත් කරවන්න.

**අතිරේක උදව්**

- සුදුසු ළමා නාට්‍ය පිටපත් කියැවීම හා නිෂ්පාදන නැරඹීම.
- ශ්‍රී ලංකා ගුවන් විදුලිය සංස්ථාවේ ස්වදේශීය සේවය ඉදිරිපත් කරන ගුවන් විදුලිය නාට්‍ය සඳහා සවන් දීම.
- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ හඬ කැවීම් ඒකකය මගින් සිංහල හඬ කවා ඉදිරිපත් කරන මාලා නාට්‍ය, චිත්‍රපට නැරඹීම.

**නිපුණතාව 03** නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.2** මනස සහ ශරීරය අතර සම්බන්ධතාව ගොඩනගා ගැනීම සඳහා චලන විධි භාවිත කරයි.

**ක්‍රියාකාරකම** රංගනයේ දී මනස හා සිරුර අතර සබඳතාව දකිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

**ඉගැනුම් පල**

- ★ පරිසරයේ විවිධත්වයන් විවිධ සංවේදනයන්ට තුඩු දෙන අයුරු ස්පර්ශය ඇසුරෙන් දැන ගනී.
- ★ අයත් වන පරිසරය අනුව, අවධානයෙන් යුතු ව ශාරීරික චලන ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- ★ සාවධාන චලනයන් ආශ්‍රිත ව, ඒවායේ ස්වභාවයට අනුරූපී ව හැඟීම් ඇති වන බව අත්විඳියි.
- ★ ස්පර්ශය ආශ්‍රිත මානසික සංවේදන, විවිධ ශාරීරික චලනයන්ට හේතු වන ආකාරය දැන ගනියි.

**ගුණාත්මක යෙදවුම්** වතුර බොන වීදුරුවක්, දූවිලි එකතු කරනයක් (ඩස්ට් පෑන් එකක්), යකඩ කූරු කැබැල්ලක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 -
- ★ පන්ති කාමරයේ හෝ පිටත එළිමහන් ස්ථානයක සියලු ම සිසුන් රවුමට සිටින්නට සලස්වා ඔවුන් නිදහසේ සෑම තැන ම ඇවිදීමට යොමු කරවන්න.
- ★ තමන් ඇවිදින බව කල්පනාවට ගෙන අවධානයෙන් යුතු ව ඇවිදීමටත්, පොළොව මත තම යටිපතුළ ස්පර්ශ වන බව සිහියේ තබා ගෙන ඇවිදීමටත් සලස්වන්න. මෙසේ ඇවිදීමේ දී පොළොව ඇසුරෙන් තම යටිපතුළට දැනෙන සංවේදනයන් මෙනෙහි කරවන්න.
- ★ අවධානය නොමැති ව කරන ක්‍රියා නොහඳුනා ගන්නා අයුරුත්, අවධානය සහිත ව හඳුනා ගන්නා විවිධ ක්‍රියාවන්හි නිරත වෙමින් අත්දැකීම් ලබා ගන්නා අයුරුත් සාකච්ඡා කරන්න.

පියවර 02 -
- ★ සිසුන් නිදහසේ ගමන් කළ භූමියෙහි කොටස් වෙන් කොට ඒවායෙහි ගින්දර, මඩ, කටුකොහොල්, තණකොළ, දිය සෙවෙල, සීතල වතුර යන්න ලියා එම ප්‍රදේශ මතින් සිසුන් ගමන් කරවන්න.
- ★ මෙම විවිධ කලාප ඔස්සේ ඇවිදීමේ දී එම කලාපවල ස්වභාවය හේතුවෙන් දෙපතුළට දැනිය හැකි සංවේදන අනුව සිසුන් ගමන් කරවන්න. එම මානසික සංවේදන ආශ්‍රිත ශාරීරික සංචලනයන්ගේ ස්වභාවයන් පිළිබඳ ව සාකච්ඡා කරන්න.

පියවර 03 -
- ★ පන්තියේ සිසුන් කවාකාර ව හිඳුවන්න. ක්‍රියාවන්හි ආරම්භකත්වය ලබා දීම සඳහා ඔබ ද මෙම කවයේ ම සාමාජිකයකු වශයෙන් හිඳගන්න.

* ගුණාත්මක යෙදවුම්වල සඳහන් ද්‍රව්‍ය භාවිතයෙන් හෝ අභිනය භාවිතයෙන් පහත සඳහන් දේවල් එකින් එක ප්‍රකාශ කොට අදාළ ද්‍රව්‍ය අතින් අත හුවමාරු කොට යවන්න.

  ''පිරුණු, හොඳට දුම් දමන කොළ කැඳ වීදුරුවක්''

  ''අයිස් කැට කැබලි කිහිපයක්''

  ''සඳුදා උදෑසන පන්ති කාමරය ඉදිරියේ වැටී තිබූ කුඩා සතකුගේ නරක් වූ මළ කුණක්''

  ''ගිනි මැළයකින් ඉවතට ගත් යකඩ කුරු කැබැල්ලක්''

* මෙම හුවමාරුව තුළ දී අදාළ වස්තුවට අනුව හැඟීම්, චලන යනාදිය වෙනස් වන අයුරු සාකච්ඡා කරන්න.
* විවිධ වස්තූන් ආශ්‍රිත ව විවිධ ස්පර්ශයන් ලැබිය හැකි වීමත්, ස්පර්ශය ආශ්‍රිත ව විවිධ හැඟීම් ප්‍රකාශ කළ හැකි වීමත් මෙසේ අවධානය සහිත ව ක්‍රියා කිරීමේ දී හැඟීම් දැනෙන බවත් සාකච්ඡාවට බඳුන් කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. විවිධ සංවේදන කාරකයන් ආශ්‍රිත හැඟීම් හඳුනා ගැනීම.
02. විවිධ සංවේදන කාරකයන් ආශ්‍රිත ශාරීරික චලනයන් හඳුනා ගැනීම.
03. අවධානයෙන් යුතුව කරනු ලබන චලනවලට ගැළපෙන අයුරින් හැඟීම් ප්‍රදර්ශනය කිරීම.
04. ස්පර්ශය ඇසුරෙන් ලබන මානසික සංවේදන විවිධ චලනයන්ට හේතු වන බව දැන ගැනීම.
05. විවිධ වස්තූන් ඇසුරෙන් විවිධ හැඟීම් ඇති වන බව අවබෝධ කර ගැනීම.

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

| | |
|---|---|
| **නිපුණතාව 03** | ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යෙදීමෙන් අදාළ සිද්ධාන්ත පිළිබඳ අවබෝධය ප්‍රකට කරයි. |
| **නිපුණතා මට්ටම 3.3** | ඒ ඒ චරිතවලට ගැළපෙන පරිදි කටහඬ හසුරුවමින් අදාළ ක්‍රියාකාරකම්හි යෙදෙයි. |
| **ක්‍රියාකාරකම** | නියම හඬින් දෙබස් කියමු<br>දෙබස් කියා රඟුම් රඟමු |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | 04 |
| **ඉගැනුම් පල** | ★ විවිධ චරිත ඇති බව පවසයි.<br>★ ඒ ඒ චරිතවලට ආවේණික වාග් විලාසයක් පවතින බව පවසයි.<br>★ කතා කිරීමේ විලාසය, ශෛලිය අනුව චරිතය කුමක් දැයි පෙන්වා දෙයි.<br>★ විවිධ හඬවල් අනුකරණය කරමින් චරිත නිර්මාණය කිරීමට පෙළඹේ. |
| **ගුණාත්මක යෙදවුම්** | අදාළ හඬ පට (ශ්‍රව්‍ය) / ශ්‍රව්‍ය දෘශ්‍ය පට / චිත්‍ර සටහන් |

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - පන්තියේ සිසුන්ට ප්‍රමාණවත් ඉඩකඩ ඇති හිස් අවකාශයක් තෝරා ගන්න. සියලු ම සිසුන් රවුමට සිට ගැනීමට සලස්වන්න.

පියවර 02 - විවිධ රිද්ම ඇතුළත් සංගීත ඛණ්ඩ සහිත සංයුක්ත තැටි වාදනය කරන්න.

පියවර 03 - සංගීතයේ රිද්මයට සියලු සිසුන් ඒ මේ අත නිදහසේ ඇවිදීමට සලස්වන්න.

පියවර 04 - ගුරුවරයා පවසන ඒ ඒ චරිතය සංගීතයේ රිද්මයට අනුව කිරීමට පවසන්න. (ඇවිදීමෙන් පමණයි.) හිඟන්නෙක්, තරහින් සිටින්නෙක්, හාමුදුරුනමක්, බස්නායක නිලමේ වැනි ඕනෑම චරිතයක්.

පියවර 05 - සිසුන් රවුමක් සෑදෙන සේ විධාන කරමින් හොඳින් හුස්ම ඉහළ ගැනීම, පහළට දැමීම කරවන්න.

පියවර 06 - විවිධ චරිතයන් ඇතුළත් කොට සකස් කරගත් තුණ්ඩු කැබලි දැමූ බඳුනක් - ගුරුවරයා ළමුන්ට ඉදිරිපත් කළ යුතු වේ. එයින් අහඹු ලෙස ගත් තුණ්ඩුවේ ඇති චරිතයට අදාළ ව සිසුන් විසින් ම ගොඩ නගා ගත් සංවාද කීමට සිසුන්ට පවසන්න.

පියවර 07 - සිසුවෙක් සංවාද කීවාට පසුව ඒ පිළිබඳ ව අනෙක් සිසුන්ගේ අදහස් විමසන්න. මෙහි දී ගුරුවරයා මැදිහත් වී එම සංවාද නාට්‍යමය ආකාරයට කීමට උදව් කළ යුතු වේ.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. සමාජයේ ඇති විවිධ චරිත හඳුනා ගැනීම.
02. ඒ ඒ චරිතයන් තුළ ඒවාට ආවේණික වූ හඬක් ඇති බව හඳුනා ගැනීම.
03. චරිතවලට අයත් හඬ අනුකරණය කිරීම.
04. සංවාද නාට්‍යමය ස්වරූපයෙන් ඉදිරිපත් කිරීම.
05. කටහඬට ගැළපෙන ලෙස සාත්ත්වික අභිනය ඉදිරිපත් කිරීම.

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම**

01. විවිධ චරිත 5ක් නම් කරන්න.
02. එම චරිතවලට ගැළපෙන, අදාළ සංවාද ඛණ්ඩයක් ලියා, ශබ්ද නගා කියවන්න.
03. සිසුන් දෙදෙනෙක් චරිත දෙකක් අදාළ සංවාද ද සමග අනුකරණය කරන්න.

**අතිරේක උදව්**

විවිධ ජාතීන්, ආගම්වලට අයත් මිනිසුන්ගේ සහ සතුන්ගේ කටහඬ සහිත සංයුක්ත තැටියක් ශ්‍රවණය කිරීම.

**නිපුණතාව 03** නාට්‍ය හා රංග කලාවට අදාළ සිද්ධාන්ත පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නිරත වෙයි.

**නිපුණතා මට්ටම 3.4** හඬෙහි විවිධ පරාස මතු වන සේ සංවාද භාවිත කරයි.

**ක්‍රියාකාරකම** හැඟීම් ප්‍රකාශයට කටහඬ යොදා ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

**ඉගැනුම් පල**

- ★ කටහඬ පුහුණුව හඬ පාලනය සඳහා අවශ්‍ය බව ප්‍රකාශ කරයි.
- ★ විවිධ චරිතවලට උචිත කටහඬ අධ්‍යයනය කරයි.
- ★ වචන හසුරුවන විට හඬෙහි විවිධ ස්වරූපයන් විවිධ රිද්ම, තාල ද තිබෙන බව වටහා ගනියි.
- ★ විවිධ සතුන්ගේ හඬ අනුකරණය කිරීමෙන් ළමයාට කටහඬෙහි පරාසයක් තිබෙන බව වටහා ගනියි.

**ගුණාත්මක යෙදවුම්** සංවාද සහිත පත්‍රිකා කිහිපයක්, මිනිස් සිරුරේ ශ්වසන පද්ධතියේ පින්තූරයක් අනුකරණයෙහි දක්ෂ සිසුහු තිදෙනෙක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - සියලු ම සිසුන් වටේට සිට ගැනීමට සලස්වා දෑස් පියා ගන්නට සලස්වන්න.

පියවර 02 - ආශ්වාස වාතය සිරුර තුළට යාමේ දී සිරුරේ සිදු වන වෙනස්කම්වලට සිත යොමු කරවන්න.

පියවර 03 - ප්‍රශ්වාස වාතය සිරුරෙන් පිටවීමේ දී සිරුරේ සිදු වන වෙනස්කම්වලට සිත යොමු කරවන්න.

පියවර 04 - ශ්වසන පද්ධතියේ රූප සටහන ගෙන සිසුන්ට හුස්ම ගැනීමේ දී පෙනහලු හා උර කුහරය අතර සම්බන්ධතාව පහදා දෙන්න.

පියවර 05 - විවිධ ස්වර ගෙන, උච්ච, මධ්‍ය, මන්ද්‍ර ස්ථානවලට අනුව සිසුන් ලවා කියවන්න.

පියවර 06 - මෙවැනි අභ්‍යාස කිරීමෙන් ලය ධාරිතාව වැඩි කර ගත හැකි බව පවසන්න.

පියවර 07 - සංවාද ඛණ්ඩ ඇතුළත් පත්‍රිකා එකිනෙකා අතර බෙදා දී විවිධ පරාසයන්ට අනුව කියන්නට දෙන්න.

පියවර 08 - විවිධ පරාසයන්ට අනුව කීමේ දී විවිධ හැඟීම් දනවන ආකාරයට කීමට උපදෙස් දෙන්න.

උදාඃ- 1. ''කැත්තක් අරගෙන වත්තට යනකොට
පෙත්තෙක් ඉඳ ගෙන කජු කනවා
ලංසි පැටව් මූදු යන්න නැවක් හදනවා
තකදොං නැවක් හදනවා''

2. ''අම්මේ... මට බෑ අද ඉස්කෝලෙ යන්න.
ටීචර් කිව්ව චක්කරේ පාඩම් නැත්නම්
පන්තියෙන් එළියට දානව කියලා.''

3. එක ම වාක්‍යාංශය විවිධ අරුත්වලට අනුව කියන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. හඬ පාලනය කර ගැනීම සඳහා ශ්වසන අභ්‍යාසයෙහි නිරත වීම.
02. විවිධ රිද්ම, තාල පරාසයන්ට අනුව සංවාද භාවිත කිරීම.
03. මිනිසාගේ මෙන් ම සතුන්ගේ හඬ තුළ ද විවිධ පරාසයන් ඇති බව හඳුනා ගැනීම.
04. විවිධ පරාසයන්ට අනුව හඬ උච්චාරණය කිරීමේ දී හැඟීම් නිරූපණය කිරීම.
05. කටහඬෙහි විවිධ පරාසයන් කරා යාම සඳහා ශ්වසන අභ්‍යාසයෙහි නිරත වීම.

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම**

01. ළමා ගීතයක් ගායනා කරමින් රංගනයක් ඉදිරිපත් කරන්න.
02. ''ආලෙ බැන්ද මාගෙ රම්‍යවන්.....'' ගීතය ගායනා කරන්න. (මෙහි දී විවිධ හඬ, අර්ථ, හැඟීම් දනවන ආකාරය සඳහා අවධානය යොමු වේ.)
03. විවිධ හඬ පරාසයන් ඇති සතුන්ගේ නම් ලැයිස්තුගත කරන්න.
04. විවිධ අවස්ථාවන්ට උචිත, විවිධ හැඟීම් දනවන සංවාද ඛණ්ඩ කිහිපයක් ලියන්න.
05. ගුවන් විදුලිය නාට්‍ය කිහිපයක් ලියන්න. ශ්‍රවණය කරන්න.

| | |
|---|---|
| **නිපුණතාව 03** | ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යෙදීමෙන් අදාළ සිද්ධාන්ත පිළිබඳ අවබෝධය ප්‍රකට කරයි. |
| **නිපුණතා මට්ටම 3.5** | විවිධ හැඟීම් හා අවස්ථාවන්ට උචිත පරිදි අර්ථාන්විත ව සංවාද හා ශබ්ද භාවිත කරයි. |
| **ක්‍රියාකාරකම** | හඬ යොදමු. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | 03 |

**ඉගෙනුම් පල**

- ⋆ භාණ්ඩ හෝ ද්‍රව්‍ය ඇසුරින් උපදින හඬ තුළ ඇති විවිධ ස්වරූප, විවිධ රිද්ම, විවිධ තාල හඳුනා ගනී.
- ⋆ මිනිස් ජීවිතයේ විවිධාකාර අවස්ථාවලට ද්‍රව්‍ය ඇසුරින් උචිත පරිදි ශබ්දය ලබා ගන්නා බව පිළිගනියි.
- ⋆ සංවාදවල ඇති ප්‍රකාශනාත්මක බව වටහා ගනී.
- ⋆ සංවාදවල ඇති විවිධ උච්චාරණ රටා හඳුනා ගනී.

අර්ථාන්විත ව සංවාද හා ශබ්ද භාවිත කිරීම තුළින් හැඟීම් හා අවස්ථා ප්‍රකාශ කළ හැකි බව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්**

1. එක් එක් අවස්ථාවන්ට උචිත ලෙස ලියූ සංවාද ඛණ්ඩ සහිත පත්‍රිකා කිහිපයක්.
2. ලී පෙට්ටියක්, එක්ස්රේ කොලයක්, බෙරයක්, සීනුවක්, පොල්කටු 2ක්, වැලි පිරවූ බිස්කට් ටින් එකක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - සිසුන්ට දෑස් පියා ගැනීමට සලස්වා කිසියම් ශබ්දයක් නිකුත් කර හඬ හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න. (පොල්කටු දෙක ආශ්‍රයෙන් අශ්ව කුර ගැටෙන ශබ්දයක්, අත්පුඩියක්, ජලය වත් කරන හඬ....)

පියවර 02 - එක ම වාක්‍යාංශය අර්ථ කිහිපයකින් කිරීමට සලස්වන්න.

පියවර 03 - විවිධ වාක්‍ය ලියූ පත්‍රිකා අහඹු ලෙස ලබා දී එහි ඇති සංවාද විවිධ හැඟීම්වලින් කීමට සලස්වන්න. (ආදරය, දුක, කෝපය, සතුට, තරහ, ලැජ්ජාව)

පියවර 04 - ස්වාභාවික පරිසරයෙන් ඇසෙන ශබ්ද කුරුලු ගී, ගහ කොළ සුළඟට සෙලවෙන හඬ, වර්ෂාව, හෙන හඬ, ගංගා ඇළ දොළ හඬ ශ්‍රව්‍ය පටයකින් අසන්නට සලස්වන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. විවිධ භාවයන් නිරූපණය වන සේ සංවාද උච්චාරණය කිරීම.
02. විවිධ ශබ්ද හෝ නාද රටා විවිධ අවස්ථාවන් සඳහා යොදාගත හැකි බව ප්‍රකාශ කිරීම.
03. නාට්‍යයක අවස්ථා තීව්‍ර කිරීම සඳහා විවිධ ශබ්ද දායක කර ගත හැකි බව ප්‍රකාශ කිරීම.

04. සුන්දර හා ප්‍රීතිදායක අවස්ථා, දිය ඇලි/ඇළ දොළ ගලන හඬ, මඟුල් බෙර, හක් පිඹීම, කෝකිල නාදය මෙන් ම භයානක අවස්ථා, අහස ගොරවන හඬ, චණ්ඩ මාරුතයක හඬ, වෙඩි හඬ, පිපිරීම් හඬ, යන ශබ්ද වෙන් වෙන් ව හඳුනා ගැනීම.

05. ස්වාභාවික ශබ්ද හා කෘත්‍රිම ශබ්ද වෙන් වශයෙන් හඳුනා ගැනීම.

**පැවරුම**

01. පොළක බඩු විකිණීම, බස් රථයක ටිකට් කඩන කොන්දොස්තර.

02. මළ ගෙදරක කතාවක් පැවැත්වීම හා බණ දේශනා කිරීම අනුකරණය කර පෙන්වන්න.

03. නාට්‍යයක දී විවිධ ශබ්ද උත්පාදනය සඳහා යොදා ගත හැකි ආදේශක භාණ්ඩ ලැයිස්තුගත කරන්න.

04. මිනිසාගේ මැදිහත් වීමෙන් උපදින ශබ්ද සහ ස්වාභාවික පරිසරයේ ඇති ශබ්ද වෙන් වශයෙන් ලියා දක්වන්න.

**අතිරේක උදව්**

- මඟුල් ගෙය, මළ ගෙය, පූජ්‍ය ස්ථාන, වෙළෙඳ පොළ, බස් නැවතුම් පොළ වැනි ස්ථානවලට ගොස් ඉරියව් හා ශබ්ද පිළිබඳ ව අවධානය යොමු කරන්න.

**නිපුණතාව 03** නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැලෙයි.

**නිපුණතා මට්ටම 3.6** ජනක්‍රීඩා ඇසුරින් සාමූහික රංගනයේ යෙදෙයි.

**ක්‍රියාකාරකම** 'ජන ක්‍රීඩා අනුව රඟමු'

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

- ★ ජන ක්‍රීඩා පිළිබඳ ව තොරතුරු රැස් කරයි.
- ★ සාමූහික ව රංගනය කළ හැකි ජන ක්‍රීඩා කෙරෙහි අවධානය යොමු කරයි.
- ★ සාමූහික ව ජන ක්‍රීඩා ඇසුරින් කළ හැකි රංගයන් නිර්මාණය කරයි.
- ★ විනෝදය, වින්දනය හා අපේක්ෂා සාධනය වන අයුරින් රංගයෙහි යෙදෙයි.
- ★ දේශීය ජන ක්‍රීඩා ඇතුළත් සංස්කෘතිකාංග අධ්‍යයනයට පෙළඹෙයි.

**ගුණාත්මක යෙදවුම්**

1. ජන ක්‍රීඩා සම්බන්ධ දෘශ්‍ය පට (CD, DVD)
2. ජන ක්‍රීඩාවන්ට අදාළ ගී තැටි.
3. ජන ක්‍රීඩාවල යෙදෙන්නන්.
4. ජන ක්‍රීඩා සම්බන්ධ කතා පොත්.
5. ජන ක්‍රීඩාවලට අදාළ පින්තූර

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 -

- ★ සාමූහික ජන ක්‍රීඩා පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ★ ඒවා අතරින් සාමූහික ව රංගනයේ යෙදිය හැකි ජන ක්‍රීඩා පිළිබඳ ව සාකච්ඡා කරන්න.

  උදා:- එළුවන් කෑම, මේවර කෙළිය, පනා හැංගීම, ලේන්සු හැංගීම
- ★ ඒ අතරින් එක් ක්‍රීඩාවක් තෝරා ගෙන එය රංගනයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර 02 -

- ★ සිසුන් එළිමහන් ස්ථානයකට රැගෙන යන්න.
- ★ ඉහත කී සාමූහික ජන ක්‍රීඩාවලට අදාළ කවි ආදිය ගායනයට අවස්ථාවක් ලබා දෙන්න.

  උදා:- එළුවන් කෑම - ''එළුවන් කන්නයි මං ආවේ
  එළු බෙටි කාපන් තුන් දීරේ''

  මේවර කෙළිය

  ''කොස්වතු කන්දේ කොස් කඩනා දා වල ගියදෝ මගෙ මේවරයා
  නෑනෝ නුඹපල් නුඹෙ දරුවන්පල් අපදුටුවේ නැත මේවරයා''

  පනා හැංගීම

  ''කෝ නෑනෝ පනාව - යටලීයේ පනාව''

  ලේන්සු හැංගීම

  ''කොප්පර කොප්පර පිපිඤ්ඤා -
  පස්ස බැලුවොත් දෙසඤ්ඤා''
- ★ මෙහි දී ශිෂ්‍යයන්ට නිතර ඇසෙන ගුවන් විදුලිය ගීතයක් භාවිතයට ගෙන ද ක්‍රීඩාවක් නිර්මාණය කර ගත හැකි බව පවසන්න.

උදා:- ''තැන තැන රවුමට ඉඳ ගෙන
ඉඳහිට එබිකම් කර කර
ලේන්සු හංගන්න ළමුන්
එක්රොක් වෙන්නා
රවුම වටේ යන විට කවි පද කියවෙන්නා
කොප්පර කොප්පර පිපිඤ්ඤා
පස්ස බැලුවොත් දෙසඤ්ඤා''

- ★ පන්තිය කණ්ඩායම් කර ඉහත කී ජන ක්‍රීඩා ඇසුරෙන් සිසුන්ට රංගනයක් නිර්මාණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර 03 -

- ★ සිසුන් සියලු දෙනා ම තම නිර්මාණ ඉදිරිපත් කළ පසු ඒ පිළිබඳ සිසුන් සමග අගැයීමක යෙදෙන්න.
- ★ සිසුන් විසින් නිර්මාණය කරන ලද ක්‍රීඩාවේ ඇති නිර්මාණාත්මක බව අගය කරන්න.
- ★ ඕනෑ ම ජන ක්‍රීඩාවක් ආශ්‍රයෙන් විවිධ රංගනයන් ඉදිරිපත් කළ හැකි බව පෙන්වා දෙන්න.
- ★ ජන ක්‍රීඩා තුළින් සාමූහිකත්වය, නීරෝගී බව, සුන්දරත්වය, ජය පැරදුම සම ව විඳ ගැනීම, සතුට ආදී දේ ජීවිතයට එකතු කර ගත හැකි බව ක්‍රීඩාව අවසානයේ සිසුන්ගෙන් ම අදහස් විමසා පන්තියේ සියලු ම සිසුන් දැනුවත් කරන්න.
- ★ ජන ක්‍රීඩාවල ඇති චලනය, ගායනය, රිද්මය, ජවය, තාලය වින්දනය ආදී අගය කළ හැකි ගුණාංග නිසා නාට්‍යමය ස්වරූපයෙන් යුතු ව එම ක්‍රීඩාවල යෙදිය හැකි බව පෙන්වා දෙන්න.
- ★ සාම්ප්‍රදායික ජන ක්‍රීඩා ඇසුරෙන් නව නිර්මාණ බිහි කිරීමට ඇති ඉඩකඩ පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. ජන ක්‍රීඩා පිළිබඳ ගවේෂණය කිරීම.
02. ජන ක්‍රීඩා සම්බන්ධ ගීත ගායනයේ යෙදීම.
03. ජන ක්‍රීඩා සඳහා රංගනයන් නිර්මාණය කිරීම.
04. ජන ක්‍රීඩා ඇසුරෙන් නිර්මාණකරණයට පෙළඹීම.
05. සාමූහික ව රංගනයේ යෙදීම.

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම**

පහත සඳහන් ජන ක්‍රීඩා ඇසුරෙන් රංගනයන් නිර්මාණය කරන්න.

01. පොරපොල් ගැසීම
02. එළුවන් කෑම
03. චක්ගුඩු පැනීම
04. මේවර කෙළිය

**අතිරේක උදව්**

1. ජන ක්‍රීඩා සම්බන්ධ පැරණි පොත්පත්.
2. ජන ක්‍රීඩාවල යෙදෙන පුද්ගලයන්.
3. ජන ක්‍රීඩාවලට සම්බන්ධ ගීත ඇතුළත් ශ්‍රව්‍ය දෘශ්‍ය පට (CD, VCD, DVD)
4. ජන ක්‍රීඩා ඇසුරෙන් බිහි වී ඇති නව නිර්මාණ.

**නිපුණතාව 04** නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.1** ජන සාහිත්‍යයේ එන සරල කතා සහ එහි පසුබිම පිළිබඳ ව අධ්‍යයනය කරයි.

**ක්‍රියාකාරකම** ජනකතා ඇසුරෙන් ජීවිතය අවබෝධ කර ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

- ★ ජනකතා ඇසුරෙන් තත්කාලීන සමාජ තොරතුරු හෙළි කරගනියි.
- ★ මිනිසුන් ගේ සිරිත් විරිත්, ඇදහිලි, විශ්වාස, ඇඳුම් පැළඳුම්, ආහාර පාන, රැකී රක්ෂා, සන්නිවේදන ක්‍රම ආදී සංස්කෘතිකාංග පිළිබඳ ව කරුණු සෙවීමට පෙළඹෙයි.
- ★ විවිධ ජන කොටස්වලට අයත් ජනකතා ඇසුරෙන් සමාජ විවිධත්වය හඳුනාගනියි.
- ★ විවිධ ආගම්වලට අයත් ජනකතා, උපමා කතා ඇසුරෙන් ජීවිතයට යහගුණ එක් කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

1. උපමා කතා (දේශීය)
2. උපමා කතා (විදේශීය)
3. ජන කතා (දේශීය)
4. ජන කතා (විදේශීය)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 -

- ★ පන්තිය කණ්ඩායම් හතරකට බෙදා ඒ ඒ කණ්ඩායම් හතරට උපමා කතා දෙක සහ ජනකතා දෙක ලබා දෙන්න.
- ★ ඒ ඒ කණ්ඩායමට, තමන්ට ලැබුණු කතාව පන්තියේ අනෙක් අය ඉදිරියේ ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- ★ එක් කණ්ඩායමක් තමන්ට ලැබුණු කතාව පන්තියට ඉදිරිපත් කරන විට ඊට සවන් දෙන අනෙකුත් කණ්ඩායම් තුන ලවා, තමන් අසන ඒ ඒ කතාවේ සමාජ පරිසරය, එම කතාව තුළ හමු වන චරිත, එම චරිත ජීවත් වන සමාජයේ ස්වභාවය, එම කතාව අයත් සංස්කෘතික වටාපිටාව පිළිබඳ කරුණු සටහන් කරවන්න.
- ★ කණ්ඩායමක් තම ඉදිරිපත් කිරීම සිදු කළ පසුව ඉහත කරුණු ඔස්සේ ඒ ඒ කතාව පිළිබඳ පන්තියේ සිසුන් අතර සාකච්ඡාවක් මෙහෙයවන්න.

පියවර 02 -

- ★ සිසුන් නැවත කණ්ඩායම් කරවන්න.
- ★ ඉහත ජනකතා නැවත කණ්ඩායම්වලට බෙදා ඒවායෙහි හමු වන චරිත පිළිබඳ ව ගැඹුරින් සාකච්ඡා කරවන්න. මෙහි දී කතාවේ ප්‍රධාන, අප්‍රධාන චරිත, එම චරිතයන් එකිනෙකින් වෙනස් වන සුවිශේෂී චරිත ලක්ෂණ, හැසිරීම්, භාෂා විලාස, සිරිත් විරිත්, රැකියාවන් ආදී බාහිර ලක්ෂණ ඔස්සේ එම සාකච්ඡාව මෙහෙයවන්න.
- ★ ඒ ඒ චරිතවල අභ්‍යන්තර ලක්ෂණ, එනම් ඒවායේ හොඳ නරක ලක්ෂණ, දුර්වලකම්, ආදර්ශයන් යනාදිය පිළිබඳ ව ද කණ්ඩායම් සාකච්ඡාවක් මෙහෙයවන්න.

පියවර 03 - ★ චරිත නිරූපණයේ දී යම් චරිතයක් කිසියම් සමාජ-සංස්කෘතික පරිසරයකට අයත් වන බව වටහා ගැනීමේ වැදගත්කම පිළිබඳ ව ඉහත ජනකතා ආශ්‍රිත නිදර්ශන ඇසුරෙන් සිසුන්ට පැහැදිලි කරන්න.

★ නාට්‍ය කලාවේ දී නාට්‍යයකට පාදක වන කථා වස්තුවේ පටන් ම ඉහත සඳහන් කරුණු වැදගත් වන අයුරුත්, එහි දී ජන සාහිත්‍යයෙන් නාට්‍ය කලාව පෝෂණය වන අයුරුත් සිසුන්ට පහදා දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. ජනකතාවේ මූලික සමාජ-සංස්කෘතික ලක්ෂණ හඳුනා ගැනීම.
02. ජන කතාවේ එන චරිත හා ඒවායෙහි සුවිශේෂතා බාහිර ලක්ෂණ ඇසුරෙන් හඳුනා ගැනීම.
03. ජනකතාවේ එන චරිත හා ඒවායෙහි සුවිශේෂතා, අභ්‍යන්තර චරිත ලක්ෂණ ඇසුරෙන් හඳුනා ගැනීම.
04. ජනකතාවෙන් ලැබිය හැකි ජීවිතාවබෝධය, එම කතාවන් ඇසුරෙන් පෙන්වා දීම.
05. මෙම කරුණු ඉදිරිපත් කිරීම සඳහා ක්‍රියාශීලී ව දායක වීම.

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම**

ඉහත කතාවන් ඇසුරෙන්, ජීවිතයට ද යම් ප්‍රයෝජනවත් පණිවිඩයක් සහිත සරල කුඩා නාට්‍යය බැගින් ඒ ඒ කණ්ඩායම් ලවා රචනා කරවන්න. නැතහොත් තමන් පරිශීලනය කළ ජනකතාවේ ප්‍රධාන චරිත දෙකක බාහිර පෙනුම චිත්‍රයට නගන්න.

**අතිරේක උදව්**

1. සුදුසු ජනකතා සොයා ගෙන කියවීම.
2. ජනකතා ආශ්‍රිත ව නිර්මාණය කොට ඇති ළමා නාට්‍ය හා චිත්‍රපට නැරඹීම.

**නිපුණතාව 04** නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.2** ජනකතා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නිරත වෙයි.

**ක්‍රියාකාරකම** ජනකතා එක්රැස් කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

- ★ විවිධ ජනකතා රැස් කරයි.
- ★ ඒ ඒ ජනකතා කියවයි.
- ★ විවිධ ජනකතාවල ඇති සිද්ධීන් පිළිබඳ ව විමසයි.
- ★ ජනකතාවලින් ජීවිතයට විවිධ ආදර්ශ සපයා ගනී.
- ★ විවිධ ජනකතා එක්කොට පොතක් නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** විවිධ ජනකතා ඇතුළත් පොත් ජනකතා ආශ්‍රිත පින්තූර.

**ඉගැනුම්ඉගැන්වීම් ක්‍රියාවලිය**

පියවර 01 -

- ★ සිසුන් මීට කලින් පාඩම්වල දී සොයා ගන්නා ලද ජනකතා පිළිබඳ ව විමසමින් පාඩමට පිවිසෙන්න.
- ★ විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ජනකතා රැස් කිරීමට සිසුන්ට පවසන්න.
  - රජවරුන් සම්බන්ධ ජනකතා
  - ගමරාළ හෝ ගොවි ජීවිතය සම්බන්ධ ජනකතා
  - යෝධයන් හෝ වීර පුරුෂයින් සම්බන්ධ ව ගොඩ නැගුණු ජනකතා
  - අන්දරේ හෝ වෙනත් විකට චරිත සම්බන්ධ ව ගොඩනැගුණු ජනකතා
  - ප්‍රස්තාව පිරුළු ඇසුරෙන් ගොඩ නැගුණු ජනකතා
  - ඉතිහාසයේ විවිධ සිද්ධීන් ඇතුළත් ජනකතා
  - ආගමික සිද්ධීන් සම්බන්ධ ජනකතා

පියවර 02 - අප සමාජයේ ජනයා අතර විවිධ ජනකතා පැතිර ඇති බවත්, මුඛ පරම්පරාගත ව පවතින මෙම කතා විවිධ වෙනස්වීම්වලට භාජනය වෙමින් පවතින බවත්, රසවත් හා වැදගත් තොරතුරු මෙම ජනකතාවල දක්නට ලැබෙන බැවින් අභාවයට යන ජනකතා එක්රැස් කර තැබීමෙන් අනාගත පරම්පරාවට විශාල ප්‍රයෝජනයක් වන බවත් පැහැදිලි කරන්න.

විවිධ ජනකතා එක්රැස් කර තැබීමෙන් රසවත් තොරතුරු හෙළිවීම. සාහිත්‍ය පෝෂණයට ඉන් විශාල පිටුවහලක් ලැබීම, විවිධ අංශ පිළිබඳ ව විශාල දැනුම් සම්භාරයක් ලැබීම, නොදන්නා තොරතුරු රැසක් ජනකතා ඇසුරෙන් ලබා ගත හැකි වීම වැනි ප්‍රයෝජන රැසක් අත්වන බව පැහැදිලි කරන්න.

පියවර 03 - කලින් සඳහන් කරන ලද විවිධ තේමාවන්ට අයත් ජනකතා එක්රැස් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. විවිධ ජනකතා එක්රැස් කිරීම.
02. විවිධ ක්ෂේත්‍ර යටතේ ඒවා වෙන් කිරීම.
03. ජනකතාවලින් ලබා ගත හැකි විවිධ ප්‍රයෝජන පෙළ ගැස්වීම කිරීම.
04. විවිධ ප්‍රදේශවලට අනුව ඒ ඒ කතා වෙනස් වන අයුරු හඳුනා ගැනීම.
05. දැනුම, විනෝදාස්වාදය උපහාසය වැනි විවිධ ප්‍රයෝජන ලැබෙන ජනකතා හඳුනා ගැනීම.

යන කරුණු ඇගැයීමට ලක් කෙරේ.

**පැවරුම** විවිධ අංශයන් යටතේ (ඉහතින් සඳහන්) ජනකතා එක්රැස් කොට කුඩා පොත් පිංචක් නිර්මාණය කිරීම.

**අතිරේක උදව්** ශ්‍රී ලංකාවේ ජනකතා එකතුව (එස්. විජේසූරිය)
ජනකතා - 1 (ජාතික අධ්‍යාපන ආයතනය)
පිරුළු කතන්දර (හේමචන්ද්‍ර සූරියආරච්චි)

**නිපුණතාව 04** නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.3** ජනකතා, උපමා කතා ආදියෙහි එන සංස්කෘතික හා සාමාජික ලක්ෂණ විමසයි.

**ක්‍රියාකාරකම** ජනකතා ආශ්‍රිත විවිධ නිර්මාණ කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** 04

**ඉගැනුම් පල**

- ★ ජනකතා ආශ්‍රිත කවි ගී නිර්මාණය කරයි.
- ★ චිත්‍ර (ජනකතා ආශ්‍රිත ව) අඳියි.
- ★ ජනකතා ඇසුරින් නාට්‍ය නිර්මාණය කරයි.
- ★ අවස්ථා නිරූපණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** පෙර පාඩම සඳහා සකසන ලද ජනකතා එකතුව හා ඊසොප්ගේ උපමා කතා සංග්‍රහය.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

සිසුවකු විසින් ජනකතාවක කොටසක් පන්තිය ඉදිරියේ කියවමින් පාඩමට පිවිසෙන්න.

පියවර 01 -
- ★ ජනකතා කියවා, අසා රස විඳීමට පමණක් නොව ඒවා ඇසුරෙන් විවිධ ක්‍රියාකාරකම් කළ හැකි බව පෙන්වා දෙන්න.
- ★ කවි නිර්මාණය, චිත්‍ර ඇඳීම, නාට්‍ය නිර්මාණය අවස්ථා නිරූපණය ආදී වශයෙන් විවිධ ක්‍රියාකාරකම් කළ හැකි බව පවසන්න.
- ★ මෙහි දී විවිධ ජනකතාවල ඇති රසවත් මෙන් ම වැදගත් අවස්ථා තෝරා ගත යුතු බව වටහා දෙන්න.

පියවර 02 -
- ★ පන්තියේ සිටින සිසුන් ගණන අනුව කණ්ඩායම් කීපයකට බෙදන්න.
- ★ ඒ ඒ කණ්ඩායම්වලට සුදුසු ජනකතා තෝරා ගෙන ක්‍රියාකාරකම් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ★ සියලු ම කණ්ඩායම්වලට විවිධ ක්‍රියාකාරකම් කළ හැකි වන සේ ඔවුන් මෙහෙයවන්න.
- ★ එක් එක් කණ්ඩායම්වල නිර්මාණ පිළිබඳ ව අනෙක් කණ්ඩායම්වල අදහස් සහ යෝජනා සාකච්ඡා කරන්න.

පියවර 03 -
- ★ ගුරුවරයා විසින් නරඹන ලද සියලු ම ක්‍රියාකාරකම් පිළිබඳ ව සමාලෝචනයක් කරන්න.
- ★ අගය කළ යුතු නිර්මාණ අගය කරමින් සංවර්ධනය කර ගත යුතු තැන් පිළිබඳ ව පැහැදිලි කරන්න.
- ★ සාමූහික ප්‍රයත්නය සහ පරිකල්පන ශක්තිය මෙහෙයවා කරණු ලබන නිර්මාණ ඉතාමත් ම සාර්ථක වන බව පෙන්වා දෙන්න.
- ★ ජන සාහිත්‍යය පෝෂණයෙහි ලා එවැනි නිර්මාණ ඉතාමත් ම වැදගත් වන බව පෙන්වා දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. ජනකතාවලින් රසවත් අවස්ථා තෝරා ගැනීම.
02. පරිකල්පනය මෙහෙයවා ක්‍රියාකාරකම් කිරීම.
03. නිර්මාණවල උචිත බව අවධරණය කිරීම.
04. නිර්මාණාත්මක බව ඇගැයීම.
05. සමස්ත සාර්ථකත්වය විමසීම/ඇගැයීම.

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** විවිධ අංශයන් යටතේ (ඉහතින් සඳහන්) ජනකතා එක්රැස් කොට කුඩා පොත් පිංචක් නිර්මාණය කිරීම.

**අතිරේක උදව්** විවිධ ජනකතා පොත්
ජනකතා ආශ්‍රිත නාට්‍ය පිටපත් (නරි බෑණා වැනි)

**නිපුණතාව 04** නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.4** සංස්කෘතික හා සාමාජික වටිනාකමක් සහිත තේමා රැගත් නාට්‍යමය අවස්ථා නිර්මාණය කරයි.
(සිරිත් මල්දම ඇසුරෙන් නාට්‍යමය අවස්ථා නිර්මාණය කිරීම.)

**ක්‍රියාකාරකම** හොඳ සිරිත් පිළිපදිමු

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**
- ★ චාරිත්‍ර අනුගමනය කරයි.
- ★ වාරිත්‍ර ප්‍රතික්ෂේප කරයි.
- ★ චාරිත්‍ර වාරිත්‍ර, සිරිත් විරිත් වශයෙන් ද ව්‍යවහාරයේ පවතින බව පවසයි.

**ගුණාත්මක යෙදවුම්** සිරිත් මල්දම ග්‍රන්ථය

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - මිනිස් ජීවිතය යහමගට යොමු කරවන සිරිත් විරිත් පිළිබඳ කරුණු දක්වන ''සිරිත් මල්දම'' දරුවන්ගේ භාවිතයට සුදුසු ග්‍රන්ථයක් බව පවසන්න.
තෝරා ගත් කවි කිහිපයකින් ගායනයට සලස්වන්න.

පියවර 02 - නාට්‍යයකට, නාට්‍ය පිටපතක් අත්‍යවශ්‍ය සාධකයක් බවත්, නාට්‍ය රචනයකට කිසියම් කථා වස්තුවක් පාදක කරගත යුතු බවත් ''සිරිත් මල්දම'' ඇසුරෙන් නාට්‍යමය අවස්ථා බහුල වශයෙන් ලබා ගත හැකි බවත් සාකච්ඡා කරන්න.

පස් පවින් වැළකිය යුතු ආකාරයත්, සමාජයට යහපත් පුරවැසියකු සේ පිවිසීමට අනුගමනය කළ යුතු සිරිත් දැක්වීමත්, යහපත් සිරිත් අනුගමනය කරන පුද්ගලයා සමාජයේ උසස් තලයක බැබලෙන බවත් පහදා දෙමින් සිසුන් කණ්ඩායම් කරන්න.

පියවර 03 - එක් එක් කණ්ඩායමට ''සිරිත් මල්දම'' හි සඳහන් කවියක් බැගින් වෙන් කර දී නාට්‍යමය අවස්ථාවක් නිර්මාණය කිරීමට හා රඟ දැක්වීමට උපදෙස් දෙන්න.

1. කණ්ඩායමට

(5) වන කවිය

''තමන් පණ ලෙස හැම
සතුන් ගැන සලකා පෙම
ඔවුන් දුටු විල සම
කරන් ආදර ගුණය නොහැරම''

2. කණ්ඩායමට

(8) වන කවිය

''සෙල්ලම් සිතින් වත්
යම්කිසි තරහකින් වත්
මරණ සිතකින් වත්
සතුන් හට වද දීම නොහොබිත්''

3. කණ්ඩායමට

(32) වන කවිය

''පාසලට යන එන
අතර මග දී කිසි තැන
කොලහල නොකරමින
ගමන් කරපන් සිල්වතෙකු මෙන''

4. කණ්ඩායමට

(23) වන කවිය

''මහලු වී සිටියත්
රුවින් අඩු වී සිටියත්
දුප්පත් ව සිටියත්
දෙමව්පිය වැඳ පුදනු යහපත්''

5. කණ්ඩායමට

(40) වන කවිය

''මව්පිය දෙදෙනාට සලකාපන්නේ
හිරිහැර කෙරුමට සිත නොම ගන්නේ
බසිමින් පාරට පැන නුදුවන්නේ
දවසින් දවසම දූන හැදියන්නේ''

6. කණ්ඩායමට

(49) වන කවිය

''ඇඟ වැසුමෙන් නිසි ඇඳුම් අඳින්නේ
බඩ පෙනුමෙන් රෙදි ඇඳ නොම ගන්නේ
හිස වැසුමෙන් කිසි තැන නොවදින්නේ
සුදුසු තැනින් නිසි ලෙස පලයන්නේ''

පියවර 04 - එක් එක් කණ්ඩායමේ නාට්‍යමය නිර්මාණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙමින් අගය කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. තේමාව ඉස්මතු වන සේ නිර්මාණ කිරීම.
02. නාට්‍යමය අවස්ථා තෝරා ගැනීම.
03. උචිත පරිදි අවස්ථා පෙළ ගැස්වීමේ සාර්ථකත්වය.
04. සාමූහික බව.
05. නිර්මාණයෙහි සාර්ථකත්වය.

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** ''සිරිත් මල්දම'' ග්‍රන්ථයෙන් තෝරා ගත් කාව්‍ය තේමා කර ගනිමින් නාට්‍යයක් නිර්මාණය කර ඉදිරිපත් කිරීම.

**අතිරේක උදවු** ''සිරිත් මල්දම'' කාව්‍ය ග්‍රන්ථය කියවීම.
අර්ථ තේරුම් ගැනීම.

**නිපුණතාව 05** නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳ ගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.1** නාට්‍ය පෙළ රස විඳියි.

**ක්‍රියාකාරකම 5.1.1** චරිතවලට බෙදී පෙළ හඬ නගා කියවමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගෙනුම් පල**

- ★ පෙළ තාලයකට අනුව කියවයි.
- ★ පෙළෙහි චරිතවල මූලික ස්වභාවයන් ප්‍රකාශ කරයි.
- ★ පෙළෙහි මූලික නාට්‍යමය අවස්ථා නම් කරයි.
- ★ පෙළෙහි අර්ථය අනුව ඇති විවිධ පණිවිඩ ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** සෝමලතා සුබසිංහගේ ''පුංචි අපට දූන් තේරෙයි'' නාට්‍ය පෙළ පිටපත් කීපයක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - ගුරුභවතා විසින් ''පුංචි අපට දූන් තේරෙයි'' නිර්මාණය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරමින් එය කියවීම සඳහා සිසුන් තුළ ප්‍රබෝධයක් ඇති කරන්න.

පියවර 02 - පන්තියේ සිසුන් අදාළ චරිතවලට (එනම් මල් පාත්තිය, මීයෝ, කුකුල් හාමි) බෙදීම සහ අදාළ කාලච්ඡේදයට අනුව පෙළෙහි තෝරා ගත් කොටස තාලයකට අනුව ශබ්ද නගා කියවන අතර චරිතවල ස්වභාවය, නාට්‍යමය අවස්ථා පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.

පියවර 03 - නාට්‍ය කියවා අවසානයේ දී එහි අර්ථයට අනුව සිසුන්ගේ ජීවිතයට ගත හැකි පාඩම් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. පෙළ පැහැදිලි ව හා අර්ථවත් ව කියවීම.
02. ගැමි ශෛලියට අනුරූප තාලයක් සංවාදය සඳහා භාවිත කිරීම.
03. එහි නාට්‍යමය අවස්ථා ප්‍රකාශ කිරීම.
04. චරිතවල ස්වභාවය ප්‍රකාශ කිරීම.
05. පෙළ තුළින් සිසු ජීවිතයට ලබා ගත හැකි පණිවිඩය ප්‍රකාශ කිරීම.

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** සාමූහික ව කියවනු ලැබූ නාට්‍ය පෙළෙහි යම් අවස්ථාවක් (විනාඩි 2-3) සිසුන් මගින් කේවළ ව ඉදිරිපත් කිරීම.

**අතිරේක උදව්** පාලිත ලොකුපෝතාගමගේ ''අමර ගියා දිව්‍ය ලෝකේ'' ළමා නාට්‍ය පෙළ.

**නිපුණතාව 05** නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳ ගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.1** නාට්‍ය පෙළ රස විඳියි.

**ක්‍රියාකාරකම 5.1.2** ''පුංචි අපට දූන් තේරෙයි'' මූලික කතා වස්තුව විනාඩි 5-8ක් තුළ ක්ෂණික ව නිරූපණය කරයි. (කතා වස්තුව හඳුනා ගනිමු.)

**කාලච්ඡේද සංඛ්‍යාව** 01

**ඉගැනුම් පල**

- ★ කථා පුවතෙහි මූලික අවස්ථා පමණක් ක්ෂණික ව නිරූපණය කරයි.
- ★ මුලින් කියවනු ලැබූ පෙළෙහි සිදුවීම් විස්තර කරයි.
- ★ කතා පුවත හුදු කතාන්දරයක් නොවන බව ප්‍රකාශ කරයි.
- ★ කතා පුවතෙහි අවස්ථා තුළ හේතුඵල සම්බන්ධයක් ඇති බව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** නාට්‍ය පෙළ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - මුලින් කියවනු ලැබූ පෙළෙහි කතා පුවත හුදු කතන්දරයකට වඩා වෙනස් බව ගුරු භවතා විසින් සරල ව සිසුන්ට පැහැදිලි කර දී එම සිදුවීම්වල හේතුඵල සම්බන්ධයක් ඇති බවට අවබෝධයක් ලබා දෙන්න.

පියවර 02 - සිසුන් කණ්ඩායම් කීපයකට බෙදා නාට්‍යයේ කතා පුවත විනාඩි 5-8ත් අතර කාලයක දී ක්ෂණික ව රඟ දැක්වීම සඳහා සිසුන්ට උපදෙස් දෙන්න.

පියවර 03 - කතා පුවත කණ්ඩායම් මගින් ක්ෂණික ව රඟ දැක්වීමෙන් අනතුරු ව එහි අන්තර්ගත සියලු ම නාට්‍යමය අවස්ථා ඒවාහි අන්තර්ගත වූවා ද යන්න සිසුන් සමග සාකච්ඡා කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. පෙළහි කතා වස්තුවට අයත් සිදුවීම් විස්තර කිරීම.
02. කතා පුවත නිර්මාණාත්මක ව ක්ෂණික නිරූපණයට යොමු කිරීම.
03. කතා වස්තුවෙහි නාට්‍යමය අවස්ථා නිවැරදි ව නිරූපණය කිරීම.
04. කතා වස්තුව කතන්දරයට වඩා වෙනස් බවට කරුණු දැක්වීම.
05. කතා වස්තුව නාට්‍යෝචිත ව පෙළ ගැස්වීම.

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** නාට්‍යයේ කතා වස්තුව ලිඛිත ව හෝ චිත්‍ර මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන්න.

**අතිරේක උදව්** ළමා නාට්‍ය පිටපතක සාරාංශයක්.

| | |
|---|---|
| **නිපුණතාව 05** | නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳ ගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. |
| **නිපුණතා මට්ටම 5.1** | නාට්‍ය පෙළ රස විඳියි. |
| **ක්‍රියාකාරකම 5.1.3** | ''කම්මැලි මීයන්ගෙන් අපට පාඩම්'' |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | 01 |

**ඉගැනුම් පල**

- ★ මීයන්ගේ කම්මැලි හැසිරීම් විස්තර කරයි.
- ★ කුකුළුහාමි සහ මීයන් අතර වෙනස ප්‍රකාශ කරයි.
- ★ කුකුළුහාමිගේ උපක්‍රම විස්තර කරයි.
- ★ කතා වස්තුව තුළින් මතු වන තේමාවන් ලිඛිත ව දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** බ්‍රිස්ටල් බෝඩ්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - සිසුන් කණ්ඩායම් කීපයකට බෙදා එමගින් කම්මැලි මීයන්ගේ හැසිරීම් ලැයිස්තුවක් සකස් කරවන්න.

පියවර 02 - එම කණ්ඩායම් මගින් කුකුළුහාමි කම්මැලි මීයන් යොදා ගන්නා උපක්‍රම පෙළගස්වා ලියවන්න.

පියවර 03 - අවසානයේ දී එම කණ්ඩායම් විසින් නාට්‍ය කතා වස්තුව තුළින් සිසුන්ට ගත හැකි පාඩම් තේමා ලෙස දක්වමින් බ්‍රිස්ටල් බෝඩ්වල ලියා ප්‍රදර්ශනය කරවන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. මීයන්ගේ හැසිරීම් රටාව නිවැරදි ව ප්‍රකාශ කිරීම.
02. කුකුළුහාමි සහ මීයන් අතර වෙනස පැහැදිලි ව පැවසීම.
03. කුකුළුහාමිගේ උපක්‍රම වාචික ව දැක්වීම.
04. සිසු ජීවිතයට ගත හැකි විවිධ පාඩම් ප්‍රකාශ කිරීම.
05. නාට්‍යයේ තේමාවන් ලියා ප්‍රදර්ශනය කිරීම.

යන කරුණු ඇගැයීම සඳහා යොදා ගන්න.

**පැවරුම** නාට්‍යයේ තේමාව දක්වන ගීතය පාඩම් කර ගායනා කරන්න.

**අතිරේක උදව්** ළමා නාට්‍ය පොත් හා සංයුක්ත තැටි.

**නිපුණතාව 05** නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳ ගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.2** නාට්‍ය නිෂ්පාදනය රස විඳියි.

**ක්‍රියාකාරකම 5.2.1** කුකුළුහාමි සහ මීයන්ගේ ගති ගුණයි ගායක පිරිසේ පණිවිඩයයි හොයා බලමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

- ★ කුකුළුහාමිගේ චරිත ස්වභාවයන් ප්‍රකාශ කරයි.
- ★ මීයන්ගේ චරිත ස්වභාවයන් විමසයි.
- ★ ගායක පිරිස් මගින් ඉදිරිපත් කරනු ලබන පණිවිඩය හා කාර්යය පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.
- ★ චරිතවල ස්වභාවයන් මගින් නාට්‍ය ගැටුම නිර්මාණය වන අන්දම විමසයි.

**ගුණාත්මක යෙදවුම්** නාට්‍ය පෙළ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - කුකුළුහාමි, මීයන් සහ ගායක පිරිස යන කොටස් මුල් කරගෙන කණ්ඩායම් තුනක් වෙන් කරන්න. එම කණ්ඩායම් මගින් අදාළ චරිතයන්ගේ ගති ස්වභාවයන් පෙළ ඇසුරින් සාකච්ඡාවට ලක් කරන්න. ගායක පිරිසේ පණිවිඩය හා කාර්යය ද අදාළ කණ්ඩායම් මගින් සාකච්ඡා කරවන්න.

පියවර 02 - කණ්ඩායම් සාකච්ඡා තුළින් මතු වූ කරුණු එක් එක් කණ්ඩායම විසින් ඉදිරිපත් කරවන්න. ඒ පිළිබඳ ව අවසානයේ සියලු කණ්ඩායම්වලට ද තවත් අලුත් කරුණු සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර 03 - ගුරු භවතා ද සම්බන්ධ වෙමින් චරිත තුළ දක්නට ලැබෙන ප්‍රතිවිරෝධතා මගින් නාට්‍ය ගැටුම මතු වන ආකාරය ද සාකච්ඡාවට ලක් කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. කුකුළුහාමිගේ ගති ස්වභාවයන් නිවැරදි ව ප්‍රකාශ කිරීම.
02. මීයන්ගේ ගති ස්වභාවයන් ප්‍රකාශ කිරීම.
03. ගායක පිරිස් මගින් දෙනු ලබන පණිවිඩය විමසීම.
04. චරිත අතර ඇති වන ගැටුම නිර්මාණය වී ඇති අයුරු දක්වීම.
05. චරිත අතර වෙනස්කම් සැසඳීම.

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** වට ප්‍රස්තාර ඇඳ ඒවා තුළ අදාළ චරිතවල ගතිගුණ සටහන් කිරීමට උපදෙස් දෙන්න.

**අතිරේක උදව්** ''අමර ගියා දිව්‍ය ලෝකේ'' නාට්‍යයේ චරිත අධ්‍යයනය කිරීම.

| | |
|---|---|
| **නිපුණතාව 05** | නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳ ගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. |
| **නිපුණතා මට්ටම 5.2** | නාට්‍ය නිෂ්පාදනය රස විඳියි. |
| **ක්‍රියාකාරකම 5.2.2** | ''පුංචි අපට දූන් තේරෙයි'' නාට්‍ය රඟ දක්වන්නට පන්තියේ ළමයි සූදානම් වෙති. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | 01 |

**ඉගැනුම් පල**

- ⋆ අවබෝධයෙන් යුතු ව කියවනු ලැබූ පෙළෙහි තේමාව, චරිත යළින් කෙටියෙන් විස්තර කරයි.
- ⋆ එහි නාට්‍යමය අවස්ථා යළි ප්‍රකාශ කරයි.
- ⋆ චරිත සඳහා සිසුන් තෝරා ගනියි.
- ⋆ පන්ති මට්ටමින් පෙන්වීම සඳහා අවශ්‍ය අවම ආනුෂංගික කලාංග තෝරා ගනියි.
- ⋆ අදාළ ආනුෂංගික කලා හැකියාවන් ඇති සිසුන් තෝරා ගනියි.
- ⋆ පුහුණුව සංවිධානය කරයි.
- ⋆ නාට්‍ය ප්‍රදර්ශනය කිරීමට නියමිත බවට පෝස්ටරයක් නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** පෙළ, බ්‍රිස්ටල් බෝඩ්, A4 කොළ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - පෙළ රස විඳීමේ දී සිසුන් විසින් සාමූහික ව පෙළ කියැවීම මගින් අවබෝධ කර ගනු ලැබූ එහි කතා වස්තුව, තේමාව හා චරිත පිළිබඳ ව ගුරුභවතා යළිත් සිසුන්ගෙන් විමසමින් කෙටි හැඳින්වීමක් කරන්න. ඒ අනුව අදාළ පෙළ සිසුන් විසින් ම රඟ දැක්වීම සඳහා ඔවුන් තුළ ප්‍රබෝධයක් ඇති කරවන්න.

පියවර 02 - මල් පාත්තිය ලෙස රඟපාන ගායක පිරිස, මීයෝ සහ කුකුළුහාමි යන චරිත සඳහා සිසුන් තෝරා ගන්න. මෙහි දී සිසුන්ගේ කැමැත්තට අනුව හෝ වෙන යම් ක්‍රමවේදයක් භාවිත කළ හැකි වේ. පාත්‍ර වර්ගයා සඳහා තෝරා ගත් සිසුන්ගේ නාම ලේඛනයක් සකස් කරවන්න.

පියවර 03 - නාට්‍ය සඳහා අවශ්‍ය අවම ආනුෂාංගික කලා පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න. ඉතා අවම සම්පත් උපයෝගී කර ගෙන රංග වස්ත්‍රාභරණ සකස් කර ගැනීම හා ඒ සඳහා හැකියාවන් ඇති සිසුන් තෝරා ගෙන නාම ලේඛනයක් සකස් කරන්න. ආනුෂංගික කලාවන් සැලසුම් කිරීමට අදාළ සිසුන්ට පවරන්න.

පියවර 04 - මූලික පුහුණුවීම් සඳහා නියමිත කාලච්ඡේද කීපයක් සහ වෙනත් නිදහස් වේලාවන් හා ස්ථානයක් සැලසුම් කරන්න. පෝස්ටරයක් නිර්මාණය කිරීමට සැලසුම් කරවන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. චරිත සඳහා සුදුසු සිසුන් තෝරා ගැනීම.
02. විවිධ හැකියාවන් අනුව ආනුෂංගික කලාවන් සඳහා සිසුන් තෝරා ගැනීම.
03. කාර්ය පැවරුම විධිමත් ව සංනිවේදනය කිරීම.

04. පුහුණු වීම සංවිධානය කිරීම.

05. සාමූහික වගකීම ඇගයීමට ලක් කිරීම.

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** අදාළ චරිත පණ ගන්වන සිසුන්ට තමන් වැඩියෙන් ම සිත් ගන්නා අවස්ථාවක් චිත්‍රයකින් හෝ ලිඛිත ව හෝ වාචික ව ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන්න.

**අතිරේක උදව්** වේදිකා නාට්‍ය නැරඹීම.

**නිපුණතාව 05** නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳ ගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.2** නාට්‍ය නිෂ්පාදනය රස විඳියි.

**ක්‍රියාකාරකම 5.2.3** චරිත රඟපෑමට පෙර සංවාද පුහුණු වෙමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

- ★ රංගනයට පෙර උචිත රංග අභ්‍යාසවල යෙදෙයි.
- ★ චරිතවලට අදාළ පෙළ කොටස් තනි තනි ව පුහුණු වෙයි.
- ★ චරිතයට ගැළපෙන කටහඬ හසුරුවමින් සංවාද උච්චාරණය කරයි.
- ★ ශෛලියට ගැළපෙන ලෙස තාලානුකූල ව දෙබස් උච්චාරණය කරයි.
- ★ චරිත එක් ව සාමූහිකව පෙළ කොටස් කියවයි.

**ගුණාත්මක යෙදවුම්** නාට්‍ය පෙළ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - මීට පෙර සිසුන් අවබෝධ කර ගෙන ඇති පරිදි චරිතවල ස්වභාවය පිළිබඳ ව යළිත් සිසුන්ගෙන් විමසමින් ගුරුතුමා චරිත නිරූපණයට සිසුන් තුළ සූදානමක් ඇති කරවන්න.

පියවර 02 - ඒ ඒ චරිත රඟපාන සිසුන් වෙන වෙන ම තම පෙළ කොටස් අර්ථවත් ව හා තාලානුකූල ව උච්චාරණය කරවීම. ඒ සඳහා යෝග්‍ය ස්ථාන කීපයක යොදා ගන්න.

පියවර 03 - චරිත රඟපාන සියල්ලෝ එක් ව තම කොටස් කියවීම. ගුරු භවතා විසින් උපදෙස් ලබා දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. රංග අභ්‍යාස චරිත නිරූපණයට සහය කර ගැනීමේ හැකියාව ලැබීම.
02. චරිතවලට උචිත හඬ හැසිරවීම.
03. තාලානුකූල උච්චාරණයේ නිවැරදි බව වටහා ගැනීම.
04. විවිධ චරිත අතර සම්බන්ධතාව තබා ගැනීමේ හැකියාව ලැබීම.
05. පුහුණුව සංවිධානය කර ගැනීමේ හැකියාව ලැබීම.

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** තමන් රඟපාන චරිතයේ තමන් සිත් ගන්නා අවස්ථාවක උච්චාරණය කරනු ලබන දෙබස් ඛණ්ඩයක් හෝ දෙකක් ලියන්න. උච්චාරණය කරන්න.

**අතිරේක උදව්** වීඩියෝ පටයක් මගින් ළමා නාට්‍යයක දෙබස්වලට සවන් දීම.

**නිපුණතාව 05** නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳ ගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.2** නාට්‍ය නිෂ්පාදනය රස විඳියි.

**ක්‍රියාකාරකම 5.2.4** අභිනය සහිත ව නාට්‍ය පුහුණු වෙමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** 04

**ඉගැනුම් පල**

- ★ උචිත ආංගික අභිනය පායි.
- ★ අර්ථවත් ව වාචික අභිනය භාවිත කරයි.
- ★ මුහුණෙන් හැඟීම් පළ කරයි.
- ★ සෙසු චරිත සමග සම්බන්ධ වෙමින් රඟපායි.
- ★ අවකාශය භාවිත කරයි.

**ගුණාත්මක යෙදවුම්** නාට්‍ය පෙළ, සටහන් සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - යම් කාලච්ඡේද ප්‍රමාණයකට අනුව නාට්‍යය කොටස් කීපයකට බෙදා පුහුණු වීම් කරවන්න.

පියවර 02 - එහි කොටසින් කොටස පුහුණු වීමේ දී ආංගික, වාචික හා සාත්ත්වික අභිනයන් භාවිත කරමින් පුහුණු වීම්වල යොදවන්න.

පියවර 03 - ගුරු භවතා මෙම පුහුණු වීම්වල දී සිසුන්ගේ රඟපෑම්වල අඩුලුහුඬුකම් පෙන්වා දෙමින් රංගනය සාර්ථක කර ගැනීමට සිසුන්ට උපකාරී වන්න. රංගනයේ ප්‍රබලතා ද මෙහි දී ඇගයීමට ලක් කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. අභිනයන් උචිත ව භාවිත කිරීම.
02. නිර්මාණශීලී ව රංගනයේ යෙදීම.
03. සාමූහික රංගන හැකියාව ලැබීම.
04. අවකාශය ප්‍රයෝජනයට ගැනීම.
05. වේදිකාව මත රංග රටා නිර්මාණය කිරීම.

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** තම රංගනයන් තුළ සිත් ගන්නා එක් අවස්ථාවක් රඟපා පෙන්වීමට උපදෙස් දෙන්න.

**අතිරේක උදව්** නාට්‍ය පුහුණු වීමක් පෙන්වන ඡායාරූප, පින්තූර හෝ ලිපියක්.

**නිපුණතාව 05** නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳ ගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.2** නාට්‍ය නිෂ්පාදනය රස විඳියි.

**ක්‍රියාකාරකම 5.2.5** මල් පාත්තියට, මී හාමිලාට, කුකුළුහාමිට ඇඳුම් අන්දවල මුහුණු පාට කරමු. සින්දු කියමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

- ★ නාට්‍ය පුහුණුව සිදු කරන අතරතුර චරිතවලට ගැළපෙන ඇඳුම් පැළඳුම් සැලසුම් කරයි.
- ★ අදාළ චරිතවලට ගැළපෙන ඇඳුම් වෙන වෙන ම රූප සටහන් (Chart) මගින් දක්වා වර්ණ, හැඩතල ඇඳ පෙන්වයි.
- ★ අදාළ චරිතවලට ගැළපෙන ලෙස මුහුණු ආකෘති ඇඳ යෝග්‍ය අංග රචනය නිර්මාණය කර රූ සටහන් මගින් පෙන්වයි.
- ★ ගායක පිරිස ගීත ගායනා කිරීමට පුහුණුව ලබයි.
- ★ නාට්‍යයට උචිත සංගීත භාණ්ඩ වාදනය කිරීමට පුහුණුව ලබයි. (මේ සඳහා හැකියාව ඇති වෙනත් සිසුන්ගේ සහය ද ලබා ගත හැකි ය.)

**ගුණාත්මක යෙදවුම්** බ්‍රිස්ටල් බෝඩ්, ඇඳුම් සඳහා රෙදිපිළි, අංග රචනා සඳහා ද්‍රව්‍ය සහ උපකරණ.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - පුහුණුව සිදු වන අතරතුර කාලයේ දී අදාළ සිසුන් විසින් සැලසුම් කර ඇති ඇඳුම් පැළඳුම් සහිත රූ සටහන් පිළිබඳ ව ගුරුභවතාගේ මෙහෙය වීමෙන් පන්තියේ සිසුන් සමග තවදුරටත් සාකච්ඡා කරන්න.

පියවර 02 - අදාළ සිසුන් විසින් සැලසුම් කරනු ලැබ ඇති අංග රචනා සැලසුම් සටහන් පිළිබඳ ව සාකච්ඡා කරන්න.

පියවර 03 - නාට්‍යයෙහි ගීත ගායනා කිරීමට අවස්ථාව ලබා දෙන්න. එහි හොඳ අංග සහ අඩුපාඩු මෙහි දී සාකච්ඡා කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. ඇඳුම් පැළඳුම් සැලසුම් කිරීම උචිත බව ප්‍රකාශ කිරීම.
02. අංග රචනා සැලසුම්වල යෝග්‍ය බව විමසීම.
03. ගීත ගායනයේ ප්‍රබල බව පැහැදිලි කිරීම.
04. සැලසුම් ඉදිරිපත් කිරීමේ විධිමත් බව විමසීම.
05. නිර්මාණාත්මක බව ප්‍රකාශ කිරීම.

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** චරිත රඟපාන සිසුන් සහ ආනුෂංගික අංග නිර්මාණය කළ සිසුන් එක් ව කණ්ඩායම් මගින් ආනුෂංගික කලාවන්ගේ දායකත්වය ගැන කෙටි ලිපි සකස් කිරීමට උපදෙස් දෙන්න.

**අතිරේක උදව්** වීඩියෝ පටයක් මගින් ළමා නිෂ්පාදනයක ආනුෂංගික අංග නැරඹීම.

**නිපුණතාව 05** නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳ ගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** 5.2 නාට්‍ය නිෂ්පාදනය රස විඳියි.

**ක්‍රියාකාරකම 5.2.6** රඟ දැක් වූ නාට්‍යයේ ගුණ දොස් කතා කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගැනුම් පල**

- ★ සිසුන් රඟ දැක් වූ නාට්‍යයේ තේමාව විමසයි.
- ★ චරිත නිරූපණයේ ගුණ දොස් සාකච්ඡා කරයි.
- ★ නාට්‍යයේ ගැටුම විමසයි.
- ★ ආනුෂංගික කලාවන්ගේ ගුණ දොස් දක්වයි.
- ★ නාට්‍යයෙන් ගත හැකි පාඩම් දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** නාට්‍ය පෙළ, නාට්‍ය දර්ශනයේ ඡායාරූප

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 01 - නාට්‍ය නැරඹූ වෙනත් පන්තිවල සිසුන් නියෝජනය වන සේ සිසුන් කීප දෙනකු සමග ගුරු භවතාගේ මෙහෙයවීම යටතේ සාකච්ඡා කරවන්න. නාට්‍යයේ තේමාව, ගැටුම පිළිබඳ ව අදහස් විමසන්න.

පියවර 02 - පන්ති මට්ටමින් කරනු ලැබූ නිෂ්පාදනයක් නිසා සිසුන්ගේ රංගනය පිළිබඳ ව ගුරු මට්ටමින් ද ප්‍රතිචාර විමසන්න. ගුරු සිසු දෙපක්ෂයෙන් ම රඟපෑම් පිළිබඳ ව විචාරශීලී අදහස් ලබා ගන්න.

පියවර 03 - නිෂ්පාදනය කරනු ලැබූ නාට්‍ය සඳහා ශිෂ්‍යයන් විසින් ම නිර්මාණය කළ ඇඳුම් පැළඳුම් හා අංග රචනය මෙන් ම ගීත ගායනය වැනි ආනුෂංගික අංග පිළිබඳ ව ප්‍රතිචාර විමසන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

01. නාට්‍යයේ තේමාව විමසා බැලීම.
02. රංගනයේ නිර්මාණාත්මක බව සාකච්ඡා කිරීම.
03. යෙදූ ආනුෂංගික කලාවන් උචිත ද යන්න විමසීම.
04. නිර්මාණය තුළ සාමූහික බව ගොඩ නැගී ඇති අයුරු පැවසීම.
05. සමස්ත නිෂ්පාදනය පිළිබඳ ගුණ දොස් දැක්වීම.

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** නාට්‍ය රඟ දැක් වූ සිසුන්ට තමන්ගේ රංගන අත්දැකීම් ගැන කෙටි විස්තරයක් ලිවීමට උපදෙස් දෙන්න.

**අතිරේක උදව්** නැරඹූ නාට්‍යයක් විවේචනය කළ ලිපියක් අධ්‍යයනය කිරීම.

**විවිධ සහාය**

**වයි. එම්. එම් කේ. යාපා මහත්මිය**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් අධ්‍යාපන කාර්යාලය - මහනුවර

**ජගත් පද්මසිරි මයා**
කථිකාචාර්ය
සෞන්දර්ය විශ්ව විද්‍යාලය

**චාමික හත්ලහවත්ත මයා**
ගුරු උපදේශක
පිළියන්දල කලාපය

**රසික ප්‍රසංග බණ්ඩාර මයා**
ගුරු සේවය
ස්වර්ණ ජයන්ති විද්‍යාලය, කෑගල්ල

**ජනකා භද්‍රාංගනී මිය**
ගුරු සේවය
නිවන්තකචේතිය විද්‍යාලය,
අනුරාධපුර

**කුමාරි එදිරිසිංහ මිය**
ගුරු සේවය
ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය, කුරුණෑගල

**රත්නා ලාලනී ජයකොඩි මිය**
ගුරු සේවය
රාජකීය විද්‍යාලය,
කොළඹ

පරිගණක මෙහෙයුම් : **සී. බී. එස්. වීරකෝන් මයා**
මුද්‍රණාලය, ජාතික අධ්‍යාපන ආයතනය

සහාය : **ඊ. එම්. වික්‍රමනායක මිය**
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**කේ. පී. පෙරේරා මයා**
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය